ISSN 1391 - 1031
2017 සැප්තැම්බර්
23 වෙළුම 06 කලාපය

ආධාරය රු 30/=

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

"විප්ලවවාදියෙකු වීම සහ සාමාන්‍යයෙන් සමාජවාදයට හෝ කොමියුනිස්ට්වාදයට පක්ෂ වීම ප්‍රමාණවත් නොවේ. මුළු දම්වැලම අල්ලා ගැනීම සඳහා සහ ඊළඟ පුරුක වෙත සංක්‍රමණය වීමට දැඩිසේ සූදානම් වීම සඳහා, එක් එක් විශේෂ අවස්ථාවේදී ඔබ ඔබගේ මුළු වැර යොදා අල්ලා ගත යුත්තේ දම්වැලෙහි කුමන පුරුකද යන්න සොයා ගැනීමට ඔබට පුළුවන් විය යුතුය."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**08වැනි වෙළුම,**
72 පිටුව

# පළාත් පාලන මැතිවරණය
# වහා පවත්වනු!

නිල කාල සීමාව අවසන් වී ඇති පළාත් පාලන ආයතනවල මැතිවරණ පැවැත්වීම ආණ්ඩුව විසින් කල්දමා මේ වන විට වසර දෙකහමාරකට වැඩි කාලයක් ගත වී ඇති අතර මේ දක්වා ඊට හේතු වශයෙන් ඉදිරිපත් කරන ලද මැතිවරණ ක්‍රමයේ අඩුපාඩු මේ වන විට සම්පූර්ණ වී ඇති බැවින් වහා මැතිවරණ පවත්වන ලෙස ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩුවට බලකර සිටී.

සාමාන්‍ය ජනතාවගේ ජන ජීවිතය හා බැඳුණු රාජකාරි ගණනාවක් ඉටුකරගන්නා සමීපතම මහජන නියෝජිත ආයතනය පළාත් පාලන ආයතන බැවින් ඒවායේ මහජන නියෝජනයක් නොමැතිවීම මහජනතාවට බරපතළ ගැටලුකාරී තත්වයක් නිර්මාණය කර ඇත. දිනෙන් දින ජනතා අප්‍රසාදයට ලක්වෙමින් යන මෛත්‍රී-රනිල් හවුල් ආණ්ඩුව මැතිවරණ හමුවේ මහජන මතය උරගා බැලීමේ භීතිකාවෙන් පෙළුණු අතර නව මැතිවරණ ක්‍රමයට අදාළ සීමා නිර්ණයේ සහ ඡන්ද ක්‍රමයේ ගැටලු අවසන් වී නොතිබීම හේතුවක් කර ගනිමින් පළාත් පාලන මැතිවරණ පැවැත්වීම දින නියමයක් නොමැතිව කල් දමා තිබිණි.

කෙසේ වුවද මේ වන විට නව මැතිවරණ ක්‍රමයට අදාළ සංශෝධිත පළාත් පාලන ***02 වැනි පිටුවට***

## දිරිය පුරවැසියන් බලමුළු ගන්වා...

අනුරාධපුරය 2017.08.17







**05 මේ දුගඳ ධනපති...**




සැබැවින්ම මේ දැනෙන්නේ, වත්මන් හවුල් ආණ්ඩුවේ කුණුවීමේ දුගඳ පමණක් නොව 69 වසරක...

**07 සමාජවාදය සහ පුද්ගලික නිදහස...**



සමාජවාදී රජයට පුරවැසියන්ගේ පුද්ගලික ජීවිතය තුළට මැදිහත්වීමේ අවශ්‍යතාවක්,....

**11 වෙනස්වීමට බිය මිනිසා...**



මිනිසා හෝ මිනිස් සමාජය වෙනස් නොවීම පවතින්නේ නැත. එහෙත් පොදුවේ මිනිසුන් වෙනස් වන්නේ,...

**12 මහඉලුප්පල්ලම ගොවිපළත්...**



වත්මන් රජය වරාය, තෙල් ටැංකි, ධීවර වරායන් විදේශීය සමාගම්වලට විකුණා දැම්මට අවශ්‍ය මුලික···

සංවාදය.......................... 03
තරුණ.............................. 04
ආවර්ජනා.......................... 06
ජාත්‍යන්තර........................ 08
ආර්ථික............................ 09
කාන්තා............................ 10
වේදිකාව.......................... 13
විශේෂාංග........................ 14

***යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!***

# රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වටලා උපාධිධාරීහු උද්ඝෝෂණයේ

වෘත්තීය ඉල්ලීම් කිහිපයක් මුල් කර ගනිමින් සංවර්ධන නිලධාරි සේවා සංගමය දියත් කළ පා ගමනක් හා උද්ඝෝෂණයක් අගෝස්තු 15 වැනි දින පැවැත්විණි. දිවයිනේ නන් දෙසින් පැමිණි රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීහු බොරැල්ල කැම්බල් පිටියේ සිට පා ගමනින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය ඉදිරිපිටට පැමිණ උද්ඝෝෂණය කළහ.




වැටුප් විෂමතා ඉවත් කිරීම, උසස්වීම් ක්‍රමවේදයක් ලබා ගැනීම, තනතුරේ ස්ථිර කිරීම හා බණ්ඩනය කර ඇති වැටුප් වර්ධක ලබාගැනීම, විශ්‍රාම වැටුප් හිමිකම ලබාගැනීම, සංවර්ධන නිලධාරි සේවය සඳහා උපරිම වයස් සීමාව අවු. 45 දක්වා වැඩි කර ගැනීම ඇතුළු ඉල්ලීම් 12ක් මුල්කර ගනිමින් මෙම පා ගමන හා උද්ඝෝෂණය පැවැත්වූ බව සංවර්ධන නිලධාරි සේවා සංගමයේ ප්‍රධාන ලේකම් චන්දන සූරියආරච්චි සහෝදරයා පැවසීය.

---

# මෑන්පවර් වහල් ක්‍රමය අහෝසි කරනු - සම්මන්ත්‍රණය

කම්කරු අයිතීන් කප්පාදු කරන, මෑන්පවර් (Man power) වහල් ක්‍රමයට එරෙහිව සහ කම්කරු විරෝධී නව නීති සංශෝධනයට එරෙහිව අන්තර් සමාගම් සේවක සංගමයේ 'මෑන්පවර් සේවක මධ්‍යස්ථානය' විසින් වැඩකරන ජනතාව දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයකක් අගෝස්තු මස 15 දින සවස 3.30 ට කොළඹ ජාතික පුස්තකාල ශ්‍රවණාගාරයේදී පවත්වනු ලැබීය.



අන්තර් සමාගම් සේවක සංගමයේ ප්‍රධාන ලේකම් ජානක අධිකාරී සහෝදරයා එහි ප්‍රධාන දේශකයා ලෙස සහභාගි විය. පුද්ගලික අංශයේ සේවක සේවිකාවෝ මෙම සම්මන්ත්‍රණය සඳහා සහභාගි වී සිටියහ.

---

# EPF/ETF කොල්ලකන බදු යෝජනාවලට අන්තරේ විරෝධය

සේවක අර්ථසාධක අරමුදලත්, සේවක භාරකර අරමුදලත් කොල්ලකෑම සඳහා අත්තනෝමතික ලෙස බදු අය කිරීමට යෝජිත නව බදු පනතට එරෙහිව වැඩකරන ජනතාව ලෙස දැවැන්ත විරෝධතා ව්‍යාපාරයක් දියත් කිරීමට තීරණය කොට ඇති බව පසුගිය 27වැනි දින පෙරවරුවේ මරදාන සමාජීය හා සාමයික කේන්ද්‍රයේ දී මාධ්‍ය හමුවක් පවත්වමින් අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති වසන්ත සමරසිංහ සහෝදරයා පවසා සිටියේය.




ආණ්ඩුවට මුදල් සොයාගැනීමට අවශ්‍ය නම් බදු වංචාකරන මහා පරිමාණ යකඩ ව්‍යාපාරිකයන් කිහිප දෙනාගෙන් බදු අයකරගත හැකි බවත් එයින් පමණක් රුපියල් මිලියන 20,000ක් පමණ අයකරගත හැකි බවත් එසේ නොකර ඒ වෙනුවට රටේ වැඩකරන ජනතාවගේ මුදල් කොල්ලකෑමට නව බදු පනත මගින් උත්සාහ කරන බවත් ඊට කිසිසේත් ඉඩ නොතබන බවත් වසන්ත සහෝදරයා එහිදී වැඩිදුරටත් පවසා සිටියේය.

## එතෙරින්...

### එක්සත් රාජධානියෙන් ශ්‍රී ලාංකේය ක්‍රීඩකයින්ට හරසර

'එතෙර අපි' එක්සත් රාජධානි කමිටුව විසින් ලන්ඩනයේ පැවැත්වෙන ලෝක මලල ක්‍රීඩා තරගාවලිය සඳහා සහභාගි වන ශ්‍රී ලාංකේය ක්‍රීඩක - ක්‍රීඩිකාවන්ට උපහාර දැක්වීමේ උත්සවයක් සංවිධානය කරන ලදී. ලංකාවේ ක්‍රීඩකයිනට විදේශයකදී මෙවැනි පිළිගැනීමක් ලබා දුන් පළමු අවස්ථාව ලෙස ඒ සඳහා සහභාගී වූ ලන්ඩනයේ වෙසෙන ශ්‍රී ලාංකිකයින් බොහෝ දෙනෙකුගේ ඇගැයීමට මෙම අවස්ථාව ලක්විය.



---

### ඉතාලියේ මෙස්සිනාවලදීත් ශ්‍රමදානයක්

ඉතාලියේ සිසිලි දූපතේ මෙස්සිනා නගරයේ ටොනො (TONO) වෙරළ තීරය ග්‍රීෂ්ම කාලයේදී ශ්‍රී ලාංකිකයින් මෙන්ම ඉතාලි ඇතුළු වෙනත් විදේශිකයින් බොහෝ දෙනෙකු ගැවසෙන ස්ථානයකි. එම වෙරළ තීරයේ පසුගිය අගෝස්තු 13වැනි දින 'එතෙර අපි' ඉතාලි කමිටුවේ මෙස්සිනා ශාඛාව මෙහෙයවීමෙන් පිරිසිදු කිරීමේ ශ්‍රම මෙහෙයුමක් පැවැතිණි. එතෙර අපි සාමාජිකයින් මෙන්ම ශ්‍රී ලාංකිකයින් බොහෝ දෙනෙකු සහභාගි වූ මෙම අවස්ථාව ඉතාලි ජාතිකයින් ඇතුළු විදේශිකයින්ගේද ඇගැයීමට ලක් විය.



---

### චිත්‍ර හා අත්කම් ප්‍රදර්ශනයක් ඉතාලියේ

'එතෙර අපි' - ඉතාලි නාපොලි කමිටුව විසින් සංවිධානය කරන චිත්‍ර, අත්කම් හා කලා ප්‍රදර්ශනයක් ඉතාලියේ නාපොලිහි ජයා ඉම්බ්‍රියාහි චතුරශ්‍රයේදී ලෝක ළමා දිනයට සමගාමීව ඔක්තෝබර් 01වැනි දින පැවැත්වීමට සැලසුම් කර ඇත. ඒ සඳහා වැඩිහිටි ළමා සියලු දෙනාටම සහභාගිවීමට අවස්ථාව ලබාදී තිබේ. මේ දිනවල ඒ සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.




---

### සයිප්‍රස් අකෙල් සමුළුවට SYU

සයිප්‍රසයේ අකෙල් (AKEL) පක්ෂයේ තරුණ සංගමයේ වාර්ෂික සමුළුව පසුගිය අගෝස්තු 05 - 07 දිනවල පැවැති අතර ඒ සඳහා ජනතා විමුක්ති පෙරමුණේ සයිප්‍රස් කමිටුවෙන් නියෝජිතයින් සහභාගිවී තිබේ. මෙම සමුළුවට සහභාගි වූ අර්නොස්ටෝ චේ ගුවේරා සහෝදරයාගේ දියණිය සිලියා ගුවේරා ජ.වි.පෙ. සයිප්‍රස් කමිටුව විසින් පවත්වා ගෙන ගිය අලෙවි කුටියට පැමිණි අවස්ථාවේ ඡායාරූපයක් මේ සමග පළවේ.



---

### බිමල් සහෝදරයා රුසියාවේ

රුසියාවේ මොස්කව්හි පැවැත්වෙන ඔක්තෝබර් විප්ලවයට වසර 100ක් සැපිරීම සැමරීමේ උත්සවයේ සූදානම් කිරීමේ කටයුතු වෙනුවෙන් පැවැත්වෙන රැස්වීම් ගණනාවක් සඳහා ජ.වි.පෙ. ජාත්‍යන්තර කටයුතු ලේකම් බිමල් රත්නායක සහෝදරයා සහභාගි විය. රුසියාවේ පීටර්ස්බර්ග් සමරු වැඩසටහන්වලට සමගාමීව ලංකාවේ සහ තවත් රටවල් රැසක ඔක්තෝබර් විප්ලවයේ ශත සංවත්සර සමරු පැවැත්වීමට නියමිතය.



---

### පළාත් පාලන...

මුල් පිටුවෙන්

පනත පාර්ලිමේන්තුවෙන් සම්මත වී අවසන් වී ඇති බැවින් තවදුරටත් පළාත් පාලන මැතිවරණය ප්‍රමාද කිරීමට ආණ්ඩුවට හේතුවක් ඉතිරිවී නොමැත. පනත සම්මත වී දින 75කට පසුව මැතිවරණය පැවැත්විය හැකි බව මැතිවරණ කොමිසමේ සභාපතිවරයා විසින් ප්‍රකාශයට පත්කර තිබේ. එබැවින් තවත් නිදහසට ව්‍යාජ තර්ක සෙවීමෙන් වැළකී වහා පළාත් පාලන මැතිවරණය පැවැත්විය යුතු බව ජ.වි.පෙ. අවධාරණය කරයි.

මේ පිළිබඳව නියමුවා කරන ලද විමසුමකට පිළිතුරු දෙමින් ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා පැවසුවේ, ආණ්ඩුව තමන්ගේ බැරිකම වසා ගැනීම සඳහා මැතිවරණ කල්දැමීමට උත්සාහ කරන බවත් ඒ සඳහා විවිධ හේතු සොයමින් සිටින බවත්ය. "ආණ්ඩුව දැන් පළාත් සභා මැතිවරණත් කල් දමා ගැනීමේ උත්සාහයක නිරතව සිටිනවා. මේ සියල්ලෙන් පෙන්නේ ආණ්ඩුව ජන මතයට කොයි තරම් බයෙන් ඉන්නවද කියන එක. කෙහොම වුණත් දැන් මේ අවුරුද්ද අවසන් වෙන්න කලින් අනිවාර්යයෙන්ම පුංචි ඡන්දෙ තියන්න ඕනෑ. ජනතා විමුක්ති පෙරමුණ ඕනෑම මැතිවරණයකට සූදානම්." විජිත හේරත් සහෝදරයා අවධාරණය කළේය.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# අන්තෝ ජඨා බහි ජඨා

මේ වන විට රනිල් - මෛත්‍රී හවුල් පාලනය අන්තෝ ජඨා බහි ජඨා (ඇතුලත් ගැටලු, පිටත් ගැටලු) තත්වයට පත්ව තිබේ. කිසිදු ප්‍රතිපත්තිමය පදනමක් නොමැතිව බලය සඳහාම අටවාගත් හවුල් පාලනය දැන් අභ්‍යන්තර අර්බුද රැසකට මුහුණදී සිටී. ඒ සමාජය සමග ඇති කරගෙන තිබෙන ගැටුමට අමතරවය.

ආණ්ඩුවේ අදූරදර්ශී ක්‍රියාමාර්ග නිසා නව ලිබරල්වාදී ප්‍රතිපත්ති නිසා පාලනයේ අරාජිකත්වය නිසා, සමාජ බලවේග රැසක් සමග ආණ්ඩුව එකවර ගැටුම් ඇතිකරගෙන තිබේ. ඒවා විසඳන ආකාරයෙන් කටයුතු කරනවා වෙනුවට ආණ්ඩුවත් එහි විවිධ ඇමතිවරුත් කටයුතු කරමින් සිටින්නේ ගැටලු තව තවත් වැඩිකර ගැනීමේ දිසාවටය. ආණ්ඩුවේ ප්‍රතිපත්තිමය වැරදිවලට අමතරව එහි ප්‍රධානින්ගේ හා ඇමතිවරුන්ගේ උද්දච්චකම, මෝඩකම හා කෑදරකමද ඊට හේතුවී තිබේ.

මේ වනවිට සයිටම් විරෝධී සටන තුළ විශ්වවිද්‍යාල සිසුන්, දෙමව්පියන්, ආචාර්යවරුන්, වෛද්‍යවරුන්, හා දේශපාලන පක්ෂ ආණ්ඩුවට එරෙහිව සටන් වදිමින් සිටී. ඊට අමතරව ගොවි ජනතාවද ආණ්ඩුවට එරෙහිව පාරට බැස තිබේ. දැන් අලුතෙන්ම ජනතාව මත බර පටවන නව බදු පනතට එරෙහිව ආදායම් බදු දෙපාර්තමේන්තුවේ සේවකයන්ගේ සිට පොදු ජනතාව දක්වා පිරිස් ආණ්ඩුවට එරෙහිව සටනට එළඹෙමින් සිටී. ඊට අමතරව උමාඔය ව්‍යාපෘතියට එරෙහි ජන සටන, ඌව වෙල්ලස්සේ ඉඩම් විකිණීමට එරෙහි සටන වැනි සටන් රැසක්ද ඇවිළී තිබේ. රැකියා විරහිත උපාධිධාරීන්ද රැකියා ඉල්ලා සටනට බැස තිබේ. ධීවර ජනතාවද සටනේය. මේ අනුව අද ආණ්ඩුවට එරෙහිව සටන් නොකරන බලවේගයක් නැති තරම්ය. ආණ්ඩුව කරමින් සිටින්නේ ඒවාට මුහුණ දෙනවා ඒවායෙන් මඟහැර යාමය. මේ නිසා හවුල් පාලනය පත්ව ඇත්තේ, "පඹ ගාලේ පැටලුණු නරියා"ගේ තත්වයටය. ගැටලු විසඳනවා වෙනුවට අලුතින් නිර්මාණය කර ගැනීම දිනපතා දැකිය හැකිය.

දැන් ඊට අමතරව ආණ්ඩුව අභ්‍යන්තර අර්බුද රැසකටද මුහුණදී තිබේ. ආණ්ඩුවේ ප්‍රධාන පාර්ශව දෙක වන එ.ජා.ප. හා ශ්‍රීල.නි.ප. අතර ඇත්තේද නෝක්කාඩුවකි. බලය සඳහා එකට සිටියද මේ පාර්ශව දෙක කටයුතු කරන්නේ වෙනස් ලෙසය. ඒ, එකට කෑවත් බොක්ක වෙනස් නිසාය.

ආණ්ඩුවේ ප්‍රධාන පාර්ශවය වන එ.ජා.ප.ය තුළ සැඟවී පැවති අර්බුද දැන් පුපුරා යාමට පටන්ගෙන තිබේ. මහ බැංකු වංචාවට උදව්දී නිවසක් අල්ලස් ගැනීම නිසා රවි කරුණානායකට ඇමති ධුරයෙන් ඉල්ලා අස්වීමට සිදුවූයේ මුළු එ.ජා.ප.යම අපකීර්තියට පත් කරමිනි. එහි උණුසුම මැකීයාමටත් පෙර එ.ජා.ප.ය තුළ විජේදාස රාජපක්ෂගේ ගැටලුව නිර්මාණය විය. ගැටලුවේ සැබෑ හේතුව "හොරුන්ට එරෙහිව නීතිය හරිහැටි ක්‍රියාත්මක නොකිරීම" නොව විජේදාස රාජපක්ෂ එ.ජා.ප. නායකත්වයට අවනත නොවීම හා මහින්ද පිල සමග සබඳතා පැවැත්වීමය. අවසානයේ විජේදාස අමාත්‍ය ධුරයෙන් ඉවත්කරන ලෙස ඉල්ලා ජනාධිපතිට ලිපියක් ලියන තත්වයට එ.ජා.ප. නායකත්වය පත්විය. එහි ප්‍රතිඵලය වූයේ විජේදාසට ඇමතිධුරය අහිමිවීම හා විජේදාස එ.ජා.ප.යේ සතුරෙකු වීමය.

එ.ජා.ප. නායකත්වය විසින් විජේදාස ඉවත් කරනු ලැබීම හෝ රවිගේ ඉල්ලා අස්වීම ආණ්ඩුවේ යහපාලනය පෙන්වන ආදර්ශ නොවේ. රවි ඉල්ලා අස්වූයේ හොරකම වසංකර ගැනීමට දැරූ සියලු උත්සාහයන් අසාර්ථක වූ නිසාය. විජේදාස ඉවත් කරන්නේද පෞද්ගලික ගැටුම නිසාය. විජේදාස ඇවන්ගාඩ් සමාගම රකින අවස්ථාවේ එ.ජා.ප. නායකයන් ඊට එරෙහි වූයේ නැත. එහිදී විජේදාස රාජපක්ෂ ආරක්ෂා කරනු ලැබීය. දැන් විජේදාස එපා වන්නේ, ඔහු රනිල් වෙනුවට මහින්ද තෝරා ගත් නිසාය. කෙසේ වුවත් මෙය එ.ජා.ප.යට සුභ නැත. එ.ජා.ප.යේ අභ්‍යන්තර අර්බුද එළියට ඒමක් වන මෙය එ.ජා.ප.ය ජනතාව අතර තව තවත් දුර්වල කිරීමට හේතු වනු ඇත.

ශ්‍රීල.නි.ප. මහින්ද හා මෛත්‍රී පිල්වල ගැටුමද දැන් උග්‍රවෙමින් තිබේ. ජනාධිපතිවරණය අවසන්ව මහින්ද පරාජයට පත්වූ වහාම තම වංචා දූෂණ හොයා තමන්ට දඬුවම් කරනු ඇතැයි බියටපත් වූ මහින්ද තම ගැලවීම සඳහා මෛත්‍රී සමග ගැටුමකට නොයා මෛත්‍රීට පක්ෂ සභාපතිකම බාර දුන්නේය. තමන් එසේ කළ බවද මහින්ද ප්‍රකාශ කළේය. එහෙත් රනිල් සමග වන එකඟතාවය නිසා තමන්ට දැන් නීතිමය අනතුරක් නැති බව තේරුම් ගැනීමෙන් පසු මහින්ද දැන් පවසන්නේ තමන් තවමත් ශ්‍රීල.නි.ප.යේ සභාපති බවය. ශ්‍රීල.නි.ප. මෙම අභ්‍යන්තර ගැටුම ශ්‍රීල.නි.ප.යට ඉතාම හානිකරය.

දැන් කලක සිට ධනපති ආණ්ඩුවෙන් ධනපති පක්ෂවලත් දේශපාලන සදාචාරය නිමාවී තිබේ. පැති මාරුකිරීම්, කුමන්ත්‍රණ, ඩීල්, රහස් සබඳතා, හොරකම් ආදිය නිතර සිදුවේ. ඉන් පෙන්වන්නේ, ඒවාට අදාළ පුද්ගලයන්ගේ පිරිහීම හෝ දුර්වලකම පමණක් නොව ක්‍රමයක් ලෙස ධනපති ක්‍රමයේම පිරිහීමේ තරමය.

දැන් සිහිබුද්ධිය සහිතව, තර්කානුකූලව, අවංකව දේශපාලනය දෙස බලන අයට ධනපති දේශපාලනයේ කැත හා ජඩකම තේරුම් ගැනීම තවදුරටත් දුෂ්කර නැත. පිටත හා අභ්‍යන්තර ගැටලුවලින් ඔද්දල්වී ඇති ආණ්ඩුව ක්‍රම ක්‍රමයෙන් එහි අවසානය කරා ගමන් කරනු ඇත. ධනපති ක්‍රමයද එහි අවසානය සනිටුහන් කරමින් සිටී. දැන් අවශ්‍ය වන්නේ, ධනපති පක්ෂවලට හා ධනපති දේශපාලනයට සමුදී නව මඟක යාමේ ජනතා අධිෂ්ඨානයය. ධනපති ආණ්ඩුවෙත් ධනපති පක්ෂවලත් ගැටලු දෙස බලා සිටින ප්‍රේක්ෂකයින් වනවා වෙනුවට නව දේශපාලන මාවතක් වෙත ගමන් කිරීමේ අධිෂ්ඨානය පෙන්වීමට ජනතාවට දැන් කාලය එළඹ තිබේ.

# පරණ සහ අලුත් හොරු දෙපිරිසම පරාජය කළ යුතුයි!



ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික
**සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා**

***නියමුවා:-*** *වත්මන් ආණ්ඩුව බලයට පැමිණියේ පැවති රාජපක්ෂ පාලනයේ වංචා දූෂණවලට එරෙහි සටන් පාඨය පෙරටුකරගෙනයි. නමුත් පැමිණි විගසම ඔවුන් මහජන මුදල් වංචා කිරීමට පටන් ගත්තා. මේ තත්වය දේශපාලනිකව විග්‍රහ කර ගතහොත්.*

***සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා:-*** කෙටියෙන්ම කියතොත්, රාජපක්ෂ දූෂිත පාලනය වෙනස් කරලා බලයට පැමිණියේ මහජන මුදල් වංචා නොකරන පාලනයක් නෙවෙයි. ඒ සඳහා අවශ්‍ය සමාජ පෙරළියක්, සමාජ ක්‍රමයේ වෙනසක් සිදුවෙලා ඇතිවුණු පරිවර්තනයක් නෙවෙයි. රාජපක්ෂ පාලනයේ නාස්තියට - දූෂණයට, පවුල් පාලනයට එරෙහිව ඒ මොහොතේ පැන නැගුණු (අදටත් පවතින) ජනතාවගේ අපේක්ෂාව, වර්තමාන දූෂිත පාලනය විසින් තමන්ට බලයට ඒමට පාලමක් හැටියට යොදා ගනු ලැබුවා.

වෙන විදියකින් තේරුම් ගත්තොත්, වර්තමාන රනිල් - මෛත්‍රී හවුල ජනතාවට කිවුවෙ මහින්ද රාජපක්ෂගේ දූෂිත පාලනය පෙරළන්න විතරයි. ඒ පාලනය වෙනස් කරලා අදූෂිත යහපාලනයක් ඇති කරගන්න ජනතාවට අවශ්‍ය වුණාට, ජනතා අභිලාෂය යොදාගෙන බලයට ආපු පාලකයින්ට එවැනි අදහසක් තිබුණේ නැහැ. එහෙම අභිලාෂයක් පාලකයින්ටත් තිබුණා නම් වත්මන් ආණ්ඩුවට කිසිසේත්ම හැකියාවක් නැහැ, මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුවේ හිටපු හොරුන්ට මේ ආණ්ඩුවේ ඇමතිකම් දෙන්න; තනතුරු දෙන්න. අද පරණ හොරු අහනවා අලුත් හොරු අල්ලනවාද කියලා.

මේ ක්‍රමය හදලා තියෙන්නේ, බලය වරප්‍රසාද සඳහාමයි. රාජපක්ෂ පාලනයේදී ඔවුන් ණය අරගෙන ගුවන් සේවයෙන්, වරායෙන්, ගුවන් තොටුපළින්, අධිවේගී මාර්ගවලින්, පාරවල්වලින් හොරකම් කළා. ඒ නිසා ඔවුන් කියනවා අපි ණය අරගෙන දේවල් හදලා තමයි හොරකම් කළේ කියලා. එහෙම නැත්නම් හොරකම් කළත් අපි දේවල් හැදුවා කියලා. අලුත් හොරුන්ට ණය අරගෙන හොරකම් කරගන්න බැරි නිසා පරණ හොරු ණය අරගෙන හදාපුවා විකුණලා ඒ මුදල්වලින් හොරකම් කරන එක තමයි අලුත් හොරුන්ගේ ක්‍රමය. පරණ හොරුන්ගෙයි අලුත් හොරුන්ගෙයි වෙනසක් නැහැ. මේ දෙගොල්ලොම හොරකම් කරන දේවල්වලට ගෙවන්න සිද්ධවෙන්නේ ජනතාවට තමයි.

***නියමුවා:-*** *වංචා දූෂණ සම්බන්ධ දේශපාලන කථිකාව නැවතත් උණුසුම් වී තිබෙනවා. කෝප් කමිටුවේ සභාපතිවරයා ලෙස බැඳුම්කර වංචාව විසින් රටේ ආර්ථිකයට කරන ලද බලපෑම තක්සේරු කරන්නේ කෙසේද?*

***සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා:-*** බැඳුම්කර වංචාව ආර්ථිකයට විතරක් නෙමෙයි, ආණ්ඩුවේ දේශපාලන ආයුෂවලටත් විශාල බලපෑමක් කරලා තියෙන බව මේ දිනවල සිදුවන දේශපාලන වෙනස්කම්වලින් පේනවා. බැඳුම්කර වංචාව විසින් මූල්‍යමය අගයක් ලෙස රටට සිදුකරලා තියෙන පාඩුව එකක්. නමුත්, ඊට වඩා බරපතළ වෙන්නේ මහ බැංකුව වැනි ආර්ථිකයේ බැංකු පද්ධතියේ කේන්ද්‍රස්ථානයේ සිදුවූ වංචාවක් ආණ්ඩුවේම ප්‍රබලයින් විසින් ආරක්ෂා කිරීමට දරන ලද පහත් උත්සාහය විසින් සමාජ-ආර්ථික-දේශපාලන පද්ධතියට සිදුකරපු හානිය. අපේ රටේ ධනේශ්වර දේශපාලන සංස්කෘතියේ ජරාජීර්ණ පිරිහීමේ කැඩපතක් බවට "බැඳුම්කර වංචාව" පත්වුණා.

ආණ්ඩුවේ අගමැතිවරයා මහා බැංකුව භාර, විෂය භාර ඇමතිවරයා ලෙස මුලින්ම මහා බැංකු අධිපති අර්ජුන මහේන්ද්‍රන් හා ඔහුගේ බෑනාගේ වංචාව වසන් කිරීමට උත්සාහ කළා. ඒක හෙළිදරව් වුණාට පස්සේ පාර්ලිමේන්තුව මගින් සිදුකළ කෝප් (පොදු ව්‍යාපාර කාරක සභාවේ) කමිටුවේ විමර්ශනය යට ගහන්න, විකෘති කරන්න නොකළ දෙයක් නැහැ. ඒ වෙනුවෙන් කමිටුවේ හිටපු එ.ජා.ප. මන්ත්‍රී වේලුකුමාර් අස්කරලා බැඳුම්කර වංචාව රැකීමට ප්‍රසිද්ධියේ පෙනී සිටි සුජීව සේනසිංහ ගෙනාවා. නමුත්, අපේ මැදිහත් වීමෙන් එයත් පරාජය වුණාම "ෆුට් නෝට් කල්ලිය" මගින් වාර්තාව විකෘති කරන්න උත්සාහ කළා. අද අපිත් බැඳුම්කර හොරු අල්ලන්න උදව් කළා කියන කට්ටිය "උදව් කළේ" එහෙමයි. දැන් රටේ මුදල් ඇමතිවරයාම බැඳුම්කර වංචනිකයින්ගෙන් අල්ලස් ගත්තාය කියලා චෝදනා ලබනවා නම් තව මොනවාද? රවි කරුණානායකට ඉල්ලා අස්වෙන්න වුණෙත්

> "හොරු නැති පාලනයක් හදන්න අපිට වුවමනාවක් තිබුණාට විතරක් ඒක කරන්න බැහැ. යු.එන්.පී. - ශ්‍රීල.නි.ප. ඡන්දදායකයෝ - පාක්ෂිකයෝ 'අපේ හොරා අපිට හොඳා' කියලා මල්මාලා දානවා නම්, ඉඹලා පිළිගන්නවා නම් ජනතාවගේ ප්‍රාර්ථනාවට විතරක් හොඳ යහපත් හොරු නැති රටක් හදන්න බැහැ. ඒ සඳහා ජනතාව සැබෑවටම දූෂිතයින් නොවන දේශපාලන ව්‍යාපාරයක් සමග අත්වැල් බැඳගනිමින් පුළුල් මහජන මධ්‍යස්ථානයක් වෙනුවෙන් පෙළගැසිය යුතුයි."

මේ බැඳුම්කර වංචාවේ අතුරු ප්‍රතිඵලයක් විදියටයි. ඒ සියල්ල සමස්ත ධනපති දේශපාලනයේම අරාජිකත්වයේ ප්‍රතිඵල පෙනෙන විදිය.

ආර්ථිකයට ඍජු ලෙස සිදුවූ බලපෑම තමයි, අඩු පොලී ප්‍රතිශතයකට රජයට (මහ බැංකුවට) ලබා ගත හැකිව තිබූ බැඳුම්කර ණය ඉහළ පොලියකට මිලදී ගැනීමට සිදුවීම නිසා මෙම ගනුදෙනුව විසින් මුළු මූල්‍ය වෙළඳපොළේම පොලී අනුපාත ඉහළ යාමක් සිදුවීම. ඒ මොහොතේ 9.4%කට පැවැති පොලී ප්‍රතිශතය 11.7%ක් පමණ දක්වා ඉහළ ගියා. අනික් අතට මෙම බිලියනයක් වෙනුවට බිලියන 10ක් ඉල්ලීම නිසා රටට පාඩුවක් සිදුවන්නේ වසරකට දෙකකට නෙමෙයි, අවුරුදු 30කටයි. මේ අපරාධයේ පාඩුවට වසර 30ක් අපේ රටේ ජනතාවට විඳවන්න වෙනවා.

***නියමුවා:-*** *බැඳුම්කර වංචාව සම්බන්ධ සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් හිටපු මුදල් අමාත්‍යවරයාට ඉල්ලා අස්වීමට සිදුවුණා. මෙම ඉල්ලා අස්වීම විපක්ෂයේ ඇතැමුන් ජයග්‍රහණයක් ලෙසටද ආණ්ඩුවේ ඇතැමුන් යහපාලනයේ ප්‍රතිඵලයක් ලෙසටද අර්ථදැක්වීමට යුහුසුළු වුණා. ජ.වි.පෙ. මෙම තත්වය දකින්නේ කොහොමද?*

***සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා:-*** ඒ දෙකම වැරදිනේ. විපක්ෂය (රාජපක්ෂ හොරු කණ්ඩායම) මේක තමන්ගේ ජයග්‍රහණයක් ලෙස දකින්නේ ඔවුන් මේ බැඳුම්කර හොරුන් හෙළිදරව් කරන්න දායක වුණු නිසා නෙමෙයි. ඔවුන්ට මේක ජයග්‍රහණයක් වගේ පේන්නේ මේ මගින් තමන්ගේ පාලනයේ පැවැති හොරකම් යටගහගන්න පුළුවන් වන බව පෙනෙන නිසා. එහෙම නැත්නම්, අපි විතරක්ද, අපිට හොරු කියන මේ ගොල්ලොත් හොරු තමයි කියලා ආණ්ඩුවට ඇඟිල්ල දික් කරලා "මෝඩ චූන්" එකක් ලබන්න පුළුවන් නිසා.

15 වැනි පිටුවට



## YES WE CAN

# එක්ව අරගල කළ යුතු කාලය පැමිණ තිබේ

රනිල් මෛත්‍රී හවුල් ආණ්ඩුව බලයට පත්ව වසර දෙකක් ඉක්ම ගොස් ඇත්තේය. ආණ්ඩුව බලයට පැමිණිමේදී ලබාදුන් පොරොන්දු අතර ඉහළින්ම තිබූ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම, වංචාව දූෂණය නැති කිරීම, දූෂිතයන්ට දඬුවම්දීම යනාදී යහපාලනයට අදාල මූලික පොරොන්දු පවා ඉටුකිරීමට මේ වනවිට අසමත්ව ඇත. ඒ බව හොඳින්ම තහවුරු වන්නේ, ආණ්ඩුව බලයට පත්කිරීම වෙනුවෙන් කටයුතු කළ සිවිල් සංවිධාන හා සමාජක්‍රියාකාරීන් එක්ව ආණ්ඩුවේ ක්‍රියාකලාපයට එරෙහිව විහාරමහාදේවී උද්‍යානය ඉදිරිපිට සිදුකළ සත්‍යග්‍රහය තුළින්ය. එමෙන්ම ඊට ආණ්ඩුවේ ඇමතිවරුන් වන රාජිත සේනාරත්න, අජිත් පෙරේරා වැනි ඇමතිවරුන් කිහිපදෙනෙකු එක්ව සිටීම තුළින්ය. ආණ්ඩුව ජනතාවට ලබාදුන් මූලික පොරොන්දු පවා ඉටුකිරීමට අසමත් වටපිටාවක රටේ රැකියා විරහිත තරුණ ප්‍රජාවගේ ප්‍රශ්නයට විසඳුම් ලබාදීම වැනි පොරොන්දු ගැන අමුතුවෙන් කතා කළ යුතු නැත.

අප ජීවත්වන සමාජ ආර්ථක ක්‍රමය තුළ තරුණ තරුණියකට රැකියාව යනු අත්‍යාවශම දේ වන අතර ඔහු හෝ ඇයගේ අද දවස මෙන්ම අනාගතය සකසනු ඇතතේද රැකියාවයි. එහෙයින් තරුණ වියට පානඟන ඕනෑම අයකුගේ බලාපොරොත්තුව වන්නේද හොඳ රැකියාවක නියැලීමයි. රැකියාවක් නොමැතිවීම යන්න තරුණ තරුණියන්ගේ බලාපොරොත්තු බිඳවැටීමක් වන අතර ඒ වෙනුවෙන් අරගල කිරීමට පෙළඹුමක් තරුණ තරුණියන් තුළ හටගනී.

අප රටේ ඉහළම අධ්‍යාපන අවස්ථාවක් වන උපාධි හිමි උපාධිධාරීන් සඳහාවත් රැකියා ලබාදීමට අප රටේ ආණ්ඩු අසමත්ය. එබැවින් අනෙක් තරුණ ප්‍රජාව ගැන අමුතුවෙන් කතා කළ යුතු නැත. බලයේ සිටි කිසිදු ආණ්ඩුවකට තරුණ තරුණියන් සඳහා රැකියා සැපයීමේ විධිමත් වැඩපිළිවෙලක් නොතිබූ අතර රට තුළ විටින් විට රැකියා විරහිත තරුණ තරුණියන් (උපාධිධාරීන්) ගෙනගිය අරගල හේතුවෙන් විටන් විට රජ්‍ය ආයතන සඳහා බඳවාගැනීම් සිදුකෙරිණි. එහෙත් වත්මන් ආණ්ඩුව බලයට පත්ව කිසිදු තරුණ තරුණියකට රැකියාවක් ලබාදුන්නේ නැත. අප දන්නා පරිදි ධනපති ක්‍රමය රට තුළ රැකියා වියුක්තියක් පවත්වාගැනිමින් කම්කරු ශ්‍රමය අඩු මුදලකට කොල්ලකා ගැනීම සඳහා අවශ්‍ය වන එකිනෙකා අතර තරඟය පවත්වාගනී. එනිසාම අප රටේ පැවති ආණ්ඩුවලට මෙන්ම වත්මන් ආණ්ඩුවටද රැකියා ප්‍රශ්නය විසදීම සඳහා සැබෑ වුවමනාවක් නොමැති බව වටහා ගත යුතුව ඇත.

එනිසාම දැන් කළ යුතුව ඇත්තේ රැකියා විරහිත තරුණ තරුණියන් ලෙස සියලුදෙනා එක්ව රැකියා ප්‍රශ්නයට විසඳුම් ලබාදෙන ලෙස ආණ්ඩුවට බලකර සිටීමය.



# මේ සාහිත්‍ය මාසයයි...

හැමදාමත් වගේ සාහිත්‍ය මාසය කියන්නේ, වැඩියෙන්ම පොත් අලෙවි වන, වැඩියෙන්ම පොත් විකිණෙන වගේම වැඩියෙන්ම පොත් එළිදක්වෙන මාසයයි. අපේ රටේ වාර්ෂිකව සංවිධානය කරන කොළඹ, ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය හා රාජ්‍ය සාහිත්‍ය සම්මාන උළෙලත් මේ කාලයේදී විශේෂයෙන්ම කැපී පෙනෙමින් බොහෝ අයගේ අවධානය දිනාගැනීමට සමත් වේ. ඇත්තෙන්ම මේ මාසය "සාහිත්‍ය මාසය" ලෙස නම් කිරීම තුළ සමාජයේ විවිධ වයස් කණ්ඩායම්වල හා සමාජ මට්ටම්වල පාඨක ජනතාවක් වෙත එකවර ඉතා වේගයෙන් ළං වීමට අවස්ථාවක් පොත්වලට හා ඒවායේ රචකයින්ට නිර්මාණය කර දී තිබේ.



එහෙත් මේ සියලු උද්යෝග යන් අතරේ මොහොතකට නතර වී අප කල්පනා කළ යුතු යමක්ද නැතුවා නොවේ. සැප්තැම්බරයේ ඇති උනන්දුව මේ බොහෝ සාහිත්‍ය පරිශීලකයන් වෙතින් එම මාසය අවසන් වීමත් සමඟ වියැකී යන්නේ ඇයි දැයි සිතිය යුතුයි. එසේම සමාජයට වඩාත් හිතකර ප්‍රතිඵල අත්කර දෙන සාහිත්‍යමය අත්හදා බැලීම් සඳහා මෙය අනගි අවස්ථාවක් කරගත හැකි ආකාරය පිළිබඳ සියලු කර්තෘවරුන්ගේ අවධානය යොමු විය යුතුයැයි අප තරයේ විශ්වාස කරමු. පොත් මිලදී ගැනීම විලාසිතාවක් කර ගන්නා අය අතරේ ඒ පොත් තුළ ඇති සැබෑ මානව හරයන් ජීවිතයට එක් කර ගැනීම සැබෑ ජීවන විලාසිතාවක් විය යුතු බව අප තේරුම් ගත යුත්තෙමු.

අතීත සෝවියට් දේශය තුළ 'අම්මා', 'පෙරළුෑ නැවුම් පස' හා 'වානේ පන්නරය ලැබූ හැටි' ආදී ශ්‍රේෂ්ඨ සාහිත්‍ය කෘතීන් මගින් සමාජයට ඉටු කළ මෙහෙය සුළු පටු නොවේ. එසේම එම සාහිත්‍ය තුළ තිබූ ගැඹුරු මානවාදී ගුණ හේතුවෙන් අදටද එම කෘතීන් අප කාගේත් නොමද ආදරයට පාත්‍රවෙයි. ගෝර්කිගේ අම්මා අපේද අම්මාය. වඩාත් වැදගත්ම කරුණ නම් කිසියම් හෝ කලා කෘතියක් කෙරෙන් සමාජ ප්‍රගමනය ඉලක්ක කර ගත් යම් බුද්ධි කලම්භනයක් සිදු කිරීමට සමත් වී තිබීමයි. එවිට රැල්ලට ලියැවෙන හා රැල්ලට කියවන බොහෝ සාහිත්‍ය ප්‍රබන්ධ හා ඒවායේ රචකයින් පසෙකට තල්ලු කරමින් එසේ නොවන කෘති හා ඒ අගනා කෘතීන්හි නිර්මාණකරුවන් විසින් ලෝකය වඩාත් ලස්සන තැනක් බවට පත් කරනු ඇත.



ලෝකය ඔබට කිසිවක්ම නොදුන්නත්...
ඔබට දෙන්නට හැකි, හැම හොඳ දෙයක්ම...
ලෝකයට දෙන්න..

## තරුණ

"චලනය නොවන්නෝ
තමන් බැඳ ඇති යදම්
නොදකින්නෝය."

රෝසා ලක්සම්බර්ග්



## සිදුහත්

සිදුහත් කුමරාන...
යශෝදරාගේ ස්වයංවරය
මට හිතෙන්නෙම ඔබ
රණ කෙළිය පැරදුණා නම් කියාය

කඩු ශිල්ප දුනු ශිල්ප
අශ්වාරෝහක කෙළිය
රණ ශිල්ප වෙනුවට
එතන තිබුණෙම කුල සිරිත් කෙළිය

ස්වයංවරය ඉදිරියේ
සිදුහත් නරදත් සටනේ
ඇත්තටම යශෝදරා
සිනාසී බලා සිටියාද..?

වේල් පට ලිහිල්කර
යශෝ පෙම් සිත එබෙන කල
ජයගත් කුමරු නරදත් වී නම්
කුල සිරිත් තිරස් කර
ලියන්නට තිබුණා ඔබට සිදුහත්

ඉතින් සංසාර බැම්ම බිඳී සිදුහත්
ප්‍රේමයට කුල සිරිත් බැම්ම හරි
උස එකක්
ඔක දැන් පෙම්වතුන් ඇවිත්
වෙන්වෙන තැනක්
ඒ බැම්මත් බිඳන් යන්න තිබුණා
නේද සිදුහත්



# මේ දුගඳ
# ධනපති ආණ්ඩුවේද? ධනපති ක්‍රමයේද?

ලංකාවේ ධනපති දේශපාලනය දැන් කුණුවී දුගඳ හමන පල්වලක තත්වයට පත්ව තිබේ. ධනවාදයේ අර්බුදය ආර්ථික අර්බුදයෙන් ඔබ්බට ගොස් දේශපාලන අර්බුදයක් දක්වා, සමාජමය හා සංස්කෘතිමය පිරිහීමක් දක්වා වර්ධනය වී තිබේ. ලාංකේය ධනවාදය තුළ දැන් ශුද්ධ වූ කිසිවක් නැත. ශුද්ධ වූ ලෙස ආවරණය කර තිබූ සියල්ල කෙලෙසී අවසන්ය. ධනවාදය තුළ, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ගැන පාසල්වල උගන්වන විට ඉගැන්වූ අමාත්‍ය මණ්ඩලයේ සාමූහික වගකීම, පාර්ලමේන්තුවේ මහජන නියෝජිතයන්ගේ හැසිරීම, මූල්‍ය ප්‍රතිපත්ති, විනය, සදාචාරය අතීතට අයත් සංකල්ප බවට පමණක් පත්ව තිබේ. හොරකමකට, වංචාවකට, දූෂණයකට සම්බන්ධ නැති පාලක පංතියේ එකදු දේශපාලකයෙක් වත් සොයාගත නොහැකි තරමටම වංචාව, දූෂණය, හොරකම රජවී තිබේ. දේශපාලන සදාචාරයේ යහපාලනයේ සියලු දුහුල් සළුපිළි ගලවා දමා ඇත. පාලක පංතියේ දේශපාලනඥයන් අමු නිරුවතින් හැසිරෙන්නට පටන්ගෙන තිබේ. කුණුවූ ධනවාදයේ දුගඳ හැම දෙනාටම දැනෙන්නට පටන් ගෙන තිබේ.

එහෙත්, ධනවාදය මේතරම්ම අර්බුදයට ගොස් පිරිහී තිබියදීත් තම බලය වෙනුවෙන්, ධනවාදය නැමති පල් වළේ අයිතිය වෙනුවෙන් ධනපති කණ්ඩායම් කරන සටන නැවතී නැත. ජනතාව යළි යළිත් මුලාකර හෝ බලය ගැනීම සඳහා ඔවුන් විවිධ උපාය මාර්ග තෝරති; විවිධ ප්‍රකාශ, විග්‍රහ කරති.

මහින්ද රාජපක්ෂ කල්ලියට අනුව කුණු වූ ධනවාදයේ මේ දුගඳ දැනෙන්නේ ධනවාදයේ දුගඳක් ලෙස නොව වත්මන් හවුල් පාලනයේ දුගඳක් ලෙසය. ඔවුනට අනුව ගෙවුණ වසර දෙක "මූසල" වසර දෙකකි, රවි හොරෙකි. "අපේ කාලයේ මෙහෙම උනේ නෑ අපේ හාමුදුරුවනේ" යැයි කීමට තරම් ලැජ්ජා නැතිකමක් ඔවුන්ට තිබේ. රවි කරුණානායකට හොරා යැයි කියන්නේ ඊට නොදෙවෙනි හොරු රැළකි. වත්මන් ආණ්ඩුවත් මහින්දගේ ඒකාබද්ධ විපක්ෂයත් අතර සටන පාතාල කල්ලි දෙකක් අතර සටනට සමානය. නීති විරෝධී ව්‍යාපාරවල තනි අයිතිය තමන්ට ගැනීම සඳහා, අපරාධ සිදු කිරීමේ තනි අයිතිය තමන් අතට ගැනීම සඳහා පාතාල කල්ලි එකිනෙක සමග සටන් කරනු අපි දැක ඇත්තෙමු. එම සටන් තුළ පාවාදීම් ද, පැති මාරු කිරීම් ද, එකිනෙකා මරා ගැනීම් ද, රහසින් කුමන්ත්‍රණය කිරීම්ද, යටින් ඩීල් දමා ගැනීම් ද තිබෙන්නා සේම ආණ්ඩුව හා රාජපක්ෂ කල්ලිය අතර 'සටන'ද ඒවායින් පිරී තිබේ. නරඹන්නන්ගේ ඇඟ කිලිපොලා ගියද මේ සටන් එක පංතියක්, එක සමාජ ක්‍රමයක් රැකීම සඳහාය. ඒ ධනවාදයත්, ධනපති පාලක පංතියත් රැක ගැනීම සඳහාය. ජනතාව දැන්වත් තේරුම් ගත යුතු සත්‍යය එයයි.




සැබැවින්ම මේ දැනෙනෙන්නේ, වත්මන් හවුල් ආණ්ඩුවේ කුණුවීමේ දුගඳ පමණක් නොව 69 වසරක ධනපති දේශපාලනය විසින් කුණු කරන ලද ලාංකේය දේශපාලනයේ දුගඳයි. ජනතාවගේ පැත්තෙන් බලන විට මූසල පසුගිය වසර දෙක පමණක් නොව මුළු ධනවාදී පාලනයේ ඉතිහාසයම මුසලය; රැවටිලිකාරීය; විනාශකාරීය. ධනවාදී පාලනයම තක්කඩියන්ගේ පාලනයකි. අපේ රටේ ඛේදවාචකය, එය හඳුනා ගැනීමට තවමත් නොහැකිවීමය.

> සැබැවින්ම මේ දැනෙනෙන්නේ, වත්මන් හවුල් ආණ්ඩුවේ කුණුවීමේ දුගඳ පමණක් නොව 69 වසරක ධනපති දේශපාලනය විසින් කුණු කරන ලද ලාංකේය දේශපාලනයේ දුගඳයි. ජනතාවගේ පැත්තෙන් බලන විට මූසල පසුගිය වසර දෙක පමණක් නොව මුළු ධනවාදී පාලනයේ ඉතිහාසයම මුසලය; රැවටිලිකාරීය; විනාශකාරීය. ධනවාදී පාලනයම තක්කඩියන්ගේ පාලනයකි.

බැඳුම්කර වංචාවට උදව්කිරීම නිසා, අල්ලස ලෙස රුපියල් කෝටි 16ක් පමණ වටිනා නිවසක් ලබාගැනීමේ සිද්ධිය හෙළිවීමත් ඊට එරෙහිව නැගුණ මහා විරෝධයත් නිසා හිටපු මුදල් ඇමති රවි කරුණානායකට සිය විදේශ අමාත්‍ය ධුරයෙන් ඉල්ලා අස්වීමට සිදුවිය. මිලදී ගත්තේ කෙසේද? මිලදී ගැනීමට මුදල් දුන්නේ කවුදැයි නොදන්නා නිවසක් රවි කරුණානායකට තිබේ. එවැනි නිවෙස් තිබුණේ රවිට පමණක් නොවේ. බැසිල් රාජපක්ෂටද තිබුණි. මල්වානේ රුපියල් කෝටි 25කට වඩා වටිනා නිවස හා ඉඩමේ අයිතිය බැසිල් රාජපක්ෂ ප්‍රතික්ෂේප කළේ එය මිලදී ගැනීමට වියදම් කළ මුදල් උපයාගත් ආකාරය පැහැදිලි කළ නොහැකිවූ නිසාය. බැසිල්ට අයත් මාතර ඉඩමක්ද එලෙස අත්හැරියේය. ඒ අයිතිය කීමට නොහැකි නිසාය. එහෙත් රවිට මෙන්ම බැසිල් රාජපක්ෂට එරෙහිවද ඒ පිළිබඳව නීතිය ක්‍රියාත්මක වන්නේ නැත.

පසුගිය රජයේ ඇමතිවරුන් වූ රෝහිත අබේගුණවර්ධනට, මහින්දානන්ද අලුත්ගමගේට, සචින් වාස්ට එරෙහිව අල්ලස් කොමිසම නඩු පවරා ඇත්තේද ඔවුන් සතුව තිබෙන විශාල දේපළ ප්‍රමාණය උපයාගත් ආකාරය පැහැදිලි කිරීමට අසමත් වූ නිසාය. අනෙක් අතට මහ බැංකු බැඳුම්කර වංචාවට සම්බන්ධ රවි කරුණානායක පමණක් නොවේ. වත්මන් ආණ්ඩුවේ තවත් මැති ඇමති පිරිසක් ඊට සම්බන්ධය. මේ ආණ්ඩුව තුළ සිදුවූ එකම වංචාව බැඳුම්කර වංචාව පමණක්ද නොවේ. වරායෙන් බදු රහිතව වාහන පැන්නීම, කරුංකා ජාවාරම, වැලි ජාවාරම, ආදී ලොකු කුඩා ජාවාරම් රැසක් තිබේ. නාස්තියද එසේමය. එබැවින් සියල්ලෝම එක වල්ලේ පොල්ය.

දැන් රාජපක්ෂ පාලන සමය මීට වෙනස් ද? නැත. එකලද හොරකම් හා වංචාව මහා පරිමාණයෙන් තිබුණි. අපරාධ සිදුවුණි. සිරිලිය ගිණුමේ වංචාව, නිවාස අමාත්‍යාංශයේ නිවාස බෙදීම හා වාහන භාවිතය, ක්‍රිස් සමාගමේ ංංගනුදෙනු, මිග් යානා ගනුදෙනුව, ඍහ නාලිකාවේ මුදල්, තාජුඩීන් ඝාතනය ආදී වංචා හා අපරාධ රැසක් තිබේ. එහෙත් දඬුවම් ලැබූ කිසිවෙක් නැත. පැරණි හොරු අලුත් හොරුන්ට 'හොරු' යයි කෑගසන අතර, අලුත් හොරු පරණ හොරුන්ට කෑ ගසයි. අවසානයේ දෙපැත්තේම හොරු යසට හොරකම් කරගෙන යන අතර, හොරකම සඳහා යළි බලය ගැනීමටද කැසකවති. ලංකාවේ දේශපාලනය පිරිහී තිබෙන ප්‍රමාණය එතරම්ය.

දේපළ හා වරප්‍රසාද වෙනුවෙන් එකිනෙකා මරාග න්නා සංස්කෘතිය දැන් දේශපාලනයට සීමා නොවී පන්සල්, පල්ලි, දේවාල දක්වාම පැමිණ තිබේ. ඒ ධනවාදය තුළ පෞද්ගලික දේපළ අත්පත් කර ගැනීමේ මහා ආශාව තුළ කිසිදා ආයතනයන් ඉන් නොරැකෙනා නිසාය. මෑතකදී කතරගම මහා දේවාලයේ යතුර සඳහා එහි කපු මහතා හා භාරකරු අතර සිදුවූ ගැටුම මීට එක් උදාහරණයකි. පිරිහීම ඒ දක්වා ගිය විට " මොන දෙයියන්ට කියන්නද?" යයි ඇතැමෙකුට සිතෙනු ඇත. එහෙත් දේපළ වෙනුවෙන් සටන් කරන දේශපාලනය පන්සල්, පල්ලි, දේවාල දක්වා රැගෙන ගියේද රට පාලනය කළ දේශපාලකයෝමය.

ලංකාවේ දේශපාලනයත් සමාජයත් පිරිහී තිබෙන ප්‍රමාණය මැනිය හැක්කේ, පාලනය කළවුන් කරන ලද හොරකම් හා අපරාධවලින් පමණක් නොව, එම හොරුන් හා අපරාධකරුවන් රැකීමට, ඔවුනට මල්මාලා පළඳවා ජයසෝෂා කිරීමට රැස්කන මිනිසුන්ගෙන්ද වේ. 'අපේ හොරා අපට හොඳා' කීමට තරම් සමාජයද පිරිහී තිබේ. රවි කරුණානායක වංචාවක් නිසා ඇමතිකමෙන් ඉල්ලා අස්වී යනවිට ඔහු වටකරගෙන ඔහුගේ දෑත සිඹින, ඔහුට දණගසා වඳින, මිනිසුන් දකින විට, ඔහුට පිරිත් නූල් බඳින විට ලංකාවේ දේශපාලනයේ සංස්කෘතියේ පිරිහීමේ තරම තේරුම් ගත හැක. රවිට පමණක්

15 වැනි පිටුවට



"සූරාකනු ලබන හා පීඩිත ජනතාව තමන්ට පැරණි ක්‍රමයට ජීවත්විය නොහැකි බව අවබෝධ කර ගැනීම සහ වෙනස් කිරීම ඉල්ලීම විප්ලවයක් සිදුවීම සඳහා ප්‍රමාණවත් නොවේ. විප්ලවයක් සිදුවීම සඳහා සූරාකන්නන්ට පැරණි ක්‍රමයෙන් ජීවත් වීමට සහ පාලනය කිරීමට නොහැකි තත්වයක් ඇතිවීම අත්‍යාවශ්‍යය. විප්ලවය විජයග්‍රහණයට පත්විය හැක්කේ 'පහළ පංතිවලට' පැරණි ක්‍රමයෙන් ජීවත්වීම එපා වූ විට සහ 'ඉහළ පංතිවලට' පැරණි ක්‍රමයෙන් කටයුතු කරගෙන යාමට බැරිව ගිය විටය."

**ලෙනින්**
**තෝරා ගත් කෘති,**
**10වැනි වෙළුම,**
**204-205 පිටු**

ආවර්ජනා

# ගොවි ජනතාව බලමුළු ගන්වන අරගල

ගොවි ජනතාවගේ අයිතිවාසිකම් ලබා ගැනීම වෙනුවෙන් පෙනී සිටින එකම ජාතික සංවිධානය සමස්ත ලංකා ගොවිජන සම්මේලනය බව ගොවි ජනතාව අතර තහවුරු වී අවසානය. මෑත කාලයේ ඇතිවූ බුලත් ගොවීන්ගේ, ගම්මිරිස් ගොවීන්ගේ අරගල සඳහාද නායකත්වය දෙනු ලැබුවේ ගොවිජන සම්මේලනයයි.

මේ අතර පසුගිය මහකන්නයේ ඇති වූ නියගය හේතුවෙන් වගා පාලු වූවන්ට සහ වගා කටයුතු සිදුකර ගැනීමට නොහැකි වූ ගොවීන්ට මාස 4ක කාලයක් ඇතුලත රු.40,000/ක මුදලක් වන්දි වශයෙන් ගෙවීමට ආණ්ඩුව පොරොන්දු වී තිබිණි. කෘෂිකර්ම අමාත්‍යාංශයට කුලී පදනම මත ලබාගත් හිස් ගොඩනැගිල්ලට මසකට ලක්ෂ ගණනක් ගෙවන ආණ්ඩුව පසුගිය අප්‍රේල් සහ ජූලි මාස අතරතුර ගෙවා අවසන් විය යුතු මේ වන්දි මුදල සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් අනුගමනය කරනු ලැබුවේ නිහඩ ප්‍රතිපත්තියකි.

මෙවෙනි වටපිටාවක් තුළ පසුගිය අගොස්තු 09වැනිදා මේ වන්දි මුදල ලබාදෙන ලෙස ආණ්ඩුවට බල කරමින් වන්දි ලැබිය යුතු ගොවීන්ද පෙරටු කර ගනිමින් සමස්ත ලංකා ගොවිජන සම්මේලනය පාර්ලිමේන්තු වට රවුමේ සිට කෘෂිකර්ම අමාත්‍යාංශය දක්වා උද්ඝෝෂණ පාගමනක් සංවිධානය කරන ලදී. ගොවිජන සම්මේලනයේ ජාතික සංවිධායක නාමල් කරුණාරත්න සහෝදරයා ගේ මූලිකත්වයෙන් පැවති උද්ඝෝෂණ පා ගමන අවසානයේ කෘෂිකර්ම ඇමති දුමින්ද දිසානායකගෙන් මේ පිළිබඳව සාකච්ඡාවක් ලබා ගැනීමෙන් අනතුරුව යම් ජයග්‍රහණයක් ලබා ගැනීමටද සම්මේලනයට හැකි විය.







# අයි.එම්.එෆ්. බදු පනත එපා!

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වුවමනාවට අනුව නව දේශීය ආදායම් පනතක් පාර්ලිමේන්තුව තුළ සම්මත කර ගැනීමට කටයුතු කරමින් සිටින බවට ජ.වි.පෙ. ඇතුළු විවිධ සංවිධානද වෘත්තීය සමිතිද ආණ්ඩුට තම අප්‍රසාදය පළ කරමින් සිටී. මේ මොහොතේ රටේ ජනතාව අපේක්ෂා කරන්නේ, තම එදිනෙදා වියදම් අඩු කරගැනීම සඳහා තිබෙන බදුවලට සහනයකි. නමුත් නව බදු පනත මගින් ආණ්ඩුව උත්සහ කරමින් සිටිනුයේ, ජනතාව මත තවදුරටත් බදු බර පැටවීමට මෙන්ම මෙතෙක් බදුවලට අදාළ නොවූ පිරිස්ද ඒ සඳහා සම්බන්ධ කර ගැනීමටය.

ජනතාවගේ සහ ආණ්ඩුවේ වුවමනා අතර ප්‍රතිවිරෝධය පිළිබඳව සොයා බැලීමේදී පෙනී යන කරුණ වන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දෙවෙනි ණය වාරිකය ලබා ගැනීම සඳහා ආණ්ඩුව විසින් මෙම බදු පනත ක්‍රියාවේ යෙදවිය යුතු බවට අරමුදලෙන් කොන්දේසි ඉදිරිපත් කර ඇති බවය. රටක් ලෙස දැඩි ආර්ථික පරිහානියකට ලක්ව ඇති මෙහි, පාලකයන්ට ඇති එකම විසඳුම මූල්‍ය අරමුදලේ සරණ යෑම බව ඔවුන්ගේ කියුම් කෙරුම්වලින් තහවුරු වී හමාරය.

එවැනි තත්වයත් තුළ මේ බදු පනතට එරෙහි වෙමින් "ජනතාව මත බදු පටවන IMF බදු පනත එපා" යනුවෙන් දේශීය ආදායම් පොදු සේවක සංගමය මගින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණයක් පසුගිය අගෝස්තු මස 10වැනිදා කොළඹ මහවැලි කේන්ද්‍ර ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා මෙහි ප්‍රධාන දේශනය පැවැත් වූ අතර රට තුළ මේ පිළිබඳව සංවාදයක් ඇති කර මේ පනත පරාජය කර ගැනීම සඳහා ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගැනීමට ජ.වි.පෙ. පසුබට නොවන බවද ඔහු මෙහිදී අවධාරණය කරන ලදී. තවද දේශීය ආදායම් මාණ්ඩලික නිලධාරින්ගේ සංගමයේ උප සභාපති ජයනන්ද රාජපක්ෂ මහතාද මෙහිදී නව පනත සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් සිදුකළ අතර දේශීය ආදායම් පොදු සේවක සංගමයේ ප්‍රධාන ලේකම් අජිත් ගල්හේන සහෝදරයා ඇතුළු විශාල පිරිසක්ද මහජනතාවද මේ අවස්ථාවට සහභාගි වී සිටියහ.

# දිරිය සමුළු

දූෂණ විරෝධය නැවත කරළියට පැමිණ තිබේ. රවී කරුණානායකට ඇමති ධූරයෙන් ඉල්ලා අස්වීමට කරුණු කාරණා පෙළ ගැසෙද්දී වඩාත් උණුසුම් වූයේ එක්සත් ජාතික පක්ෂයය. ඒ, තමන් විසින් හිතාමතාම යට ගැසූ රාජපක්ෂ පාලනයේ වංචා දූෂණ බූමරංගයක් සේ තමන් වෙත පැමිණීමෙන් අනතුරුවය. දැන් රනිල්, මෛත්‍රී, මහින්ද යන සියලු පාර්ශ්වයන්ගේ මූලික අරමුණ වී ඇත්තේ, තම තමන්ගේ දූෂණ වංචා වසා ගැනීමට අනෙකා බිල්ලට දීමය.

සියලු දූෂිතයන්ට තම තමන්ගේ රෙදිපිළි මහජනතාව හමුවේ උනා දැමීමට සිදුවෙද්දී ජනතා විමුක්ති පෙරමුණ මේ සැබෑ තතු ජනතාව හමුවේ තබමින් දූෂිතයන්ට එරෙහිව ජනතාව සංවිධානය කරමින් සිටී. මෙහි එක් පියවරක් ලෙස පසුගිය ජූලි 29වැනිදා මොණරාගලදී ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් "ගමට දිරියක් - රටට බලයක්" යන තේමාව යටතේ දිරිය පුරවැසි දිසා සමුළු පැවැත්වීම අරඹන ලදී. පසුගිය අගෝස්තු මාසයේදී රත්නපුර, අනුරාධපුර, පොළොන්නරුව, අම්පාර සහ කෑගල්ල යන දිස්ත්‍රික්කයන්හි අති උත්කර්ෂවත් අන්දමින් මේ සමුළු පැවැත්වීමට ජ.වි.පෙ.ට හැකි විය. එසේම අගෝස්තු 4-7 යන් දිනයන්හි ජ.වි.පෙ. නායකයන්ගේ ප්‍රධානත්වයෙන් " ජන බලය ගොඩනගන දිස්ත්‍රික් මෙහෙයුම" යන තේමාව යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කය පුරා ජනතාව දැනුවත් කරමින් සංවිධාන ශක්තිය තර කර ගැනීමටද ජ.වි.පෙ.ට හැකි විය.



# 'රට,රටේ හෙට සහ භික්ෂුවගේ වගකීම'



ශ්‍රී ලංකාව වැනි ආසියාතික සමාජයක් සහිත රටක ආගමික සංස්ථාව සතු බලය ඉමහත්ය. රටේ පාලනය තන්ත්‍රය සහ එකී සංස්ථා අතර ඇත්තේ අනෝන්‍ය සම්බන්ධතාවයකි. බෞද්ධ, හින්දු සහ ඉස්ලාම් ආගම් නියෝජනය කරන මුල් පෙළේ භික්ෂූන් වහන්සේගේ සහ පූජකවරුන්ගේ ක්‍රියාකාරිත්වය මැතිවරණ ආසන්නයේ මෙන්ම රටේ දේශපාලඥයන් සම්බන්ධ සිදුවීම්වලදී අපි හොඳින් දැක ඇත්තෙමු. එබැවින් රටේ පාලන බලය හොබවන මෙන්ම බලයට පත් වීමට අපේක්ෂා කරන බලවේගද ආගමික සංස්ථා සමග ගනුදෙනු කළ යුතුව තිබේ.

ජාතික විමුක්ති අරගලයක් මගින් සමාජවාදය ගොඩනැගීම තම උපායමාර්ගය කරගත් ජනතා විමුක්ති පෙරමුණටද මෙය අදාළ වේ. විශේෂයෙන්ම ජනගහනයෙන් බහුතරයක් බෞද්ධ වන මෙරට ජන මානසිකත්වයට භික්ෂුව විසින් සිදු කරන බලපෑම අති මහත්ය. මේ තත්වය තුළ විවිධ දූෂිත හා වංචනික දේශපාලකයින් විසින් ඔවුන්ගේ දූෂිතභාවය ආවරණය කර ගැනීමට භික්ෂූන් වහන්සේ උපයෝගී කරගැනීමට උත්සාහ කිරීම පසුගිය දිනවල දැකගැනීමට හැකි විය.

මෙවන් වටපිටාවක් තුළ පසුගිය අගොස්තු 26වැනිදාට යෙදී තිබුණු ජාතික භික්ෂු දිනය පදනම් කර ගනිමින් කොළඹ නව නගර ශාලාවේදී ජාතික භික්ෂු පෙරමුණ විසින් සංවිධානය කර තිබුණු සම්මන්ත්‍රණයේ සඳහා ප්‍රධාන දේශනය පැවැත්වීමට එම සංවිධානය විසින් ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයාට ආරාධනා කර තිබුණි.

මෙම සම්මන්ත්‍රණය සූදානම් කර තිබුණේ, 'රට, රටේ හෙට සහ භික්ෂුවගේ වගකීම' යන තේමාව යටතේය.

# සමාජවාදය සහ පුද්ගලික නිදහස



සමාජවාදය තුළදී එක් එක් පුද්ගලයාගේ සාමාන්‍ය ජීවන රටාව දැනට වඩා වෙනස් වේද? තදබල නීතිරීතිවලට බැඳුණු ඒකාකාරී ජීවන රටාවකට හුරුවීමට සිදුවේද? තමන් කැමති කෑමක් කෑමට, විලාසිතාවක් අනුගමනය කිරීමට හැකිවේද? විනෝද චාරිකාවක් යාමට, ප්‍රිය සම්භාෂණවලට සහභාගිවීමට හැකිවේද? විදේශ චාරිකාවක්, වන්දනා ගමනක් යාමට හැකි වේද? ආදී වශයෙන් ප්‍රශ්න ගණනාවක් සමාජවාදය පිළිබඳ විමසිලිමත් වන බොහෝදෙනා තුළ පැන නංවා ඇත.

සමාජවාදය පිළිබඳ මෙවැනි සැක සංකා මතුවීමට ප්‍රධාන හේතු දෙකක් ඇත. එකක් සමාජවාදයට එරෙහිව මතවාද සකස් කරනු ලබන ධනපති දෘෂ්ටිවේදීන්ගේ බොරු ප්‍රචාර හේතුවෙන් ඒ පිළිබඳව මැවෙන ව්‍යාජ චිත්‍රයයි. අනෙක සමාජවාදය ගොඩනැගීමේදී දැනුවත්ව හෝ නොදැනුවත්ව සිදුවූ වැරදි අඩුපාඩුකම්ය.

සමාජවාදය ගොඩනැගීමේ මුල් අවධියේදී එහි දේශපාලන හරය තේරුම් නොගත් ඇතැම් පිරිස් සිදුකළ වැරදි අඩුපාඩුකම් හේතුවෙන් සමාජවාදය තුළදී ඉහත සඳහන් කළ ආකාරයේ පුද්ගලික නිදහස නැතිවේයයි සිතීමට හේතුවන සිදුවීම් නිර්මාණය විය. 1976- 79 වකවානුවේ කාම්බෝජයේ පොල්පොට් පාලනය විසින් මේ ආකාරයෙන් සිදුකරනු ලැබූ විකෘති කිරීම් මෙහිදී විශේෂ වේ. පොල්පොට් පාලනය විසින් ජනතාවගේ සියලු දේපළ, උපකරණ ආදිය පවරා ගනු ලැබූ අතර සෑම දෙනාටම තද පාට කපු කමිසයක් හා කලිසම් දෙකක් ලබා දෙන ලදී. ඔවුන් කොමියුනවලට ගාල්කරනු ලැබිණි. පොල්පොට් පාලනය විසින් මේ ආකාරයෙන් ගොඩනැගීමට උත්සාහ කළ 'බැරැක්ක කොමියුනිස්ට්වාදය' පසුව ජනතා විරෝධය මැද පරාජය කරනු ලැබිණි. මීට අමතරව චීනයේ හතර දෙනාගේ කල්ලියේ පාලන සමයේ සංස්කෘතික විප්ලව අවධියේදී සිදුකරනු ලැබූ එවැනි ක්‍රියාකාරකම් විසින්ද සමාජවාදය තුළදී පුද්ගලික නිදහස අහෝසි වන්නේයයි මතයක් නිර්මාණය කිරීමට අවශ්‍ය තත්වයන් සැකසුණි.

අද දවසේ සමාජවාදයට එරෙහිව මත සකස් කරන්නෝ මෙම සිදුවීම් ඔවුන්ගේ කරුණු තහවුරු කිරීමට යොදා ගනිති. එහෙත් ඇත්ත වශයෙන්ම ඒ සමාජවාදය නොවේ. සමාජවාදය නමින් සිදු කරනු ලැබූ විකෘති කිරීම්ය. සමාජවාදයට එරෙහිව මත සකස් කරන්නෝ ඒ බව හොඳින් දනිති.

සමාජවාදයට එරෙහිව මත සකස් කරන්නන් පවසන ආකාරයට සමාජවාදය තුළදී පුද්ගලික නිදහස අහෝසි කරන්නේ හෝ සීමා කරනු ලබන්නේ නැත. පුද්ගලික නිදහස සැබෑ අරුතින්ම භුක්ති විඳීමට අවශ්‍ය තත්වයන් නිර්මාණය වන්නේ සමාජවාදය තුළදීය.

ධනවාදය තුළදී පුද්ගලික නිදහස ආරක්ෂා වේ යයි වචනාර්ථයෙන් ප්‍රකාශ කළද ප්‍රායෝගිකත්වය තුළදී එය අහෝසි කොට දමා ඇත. පවතින ආර්ථික දුෂ්කරතා හේතුවෙන් තමන් කැමති කෑමක් කෑමට, විලාසිතාවක් අනුගමනය කිරීමට, විනෝද චාරිකාවක් යාමට, ප්‍රිය සම්භාෂණවලට සහභාගි වීමට, විදේශ චාරිකාවක් යාමට බොහෝ දෙනෙකුට නොහැකිය. පවතින ආර්ථික දුෂ්කරතා නිසා රැකියාවක් නොමැති නිසා තමන් සිත්ගත් පුද්ගලයා සමග විවාහ වීමට නොහැකිව ලතවෙන තරුණ තරුණියෝ කෙතරම් සිටිත්ද? එහෙත් සමාජවාදයට එරෙහිව මත සකස් කරන්නෝ කිසිවිටෙක එය සාකච්ඡාවට නොගනිති.

පුද්ගලික නිදහස යන්නට පොදුවේ පුද්ගලයාගේ පුද්ගලික ජීවිතයේ අංගයන් අයත් වේයැයි සැලකේ. උදාහරණයක් ලෙස කිසියම් පුද්ගලයෙකුගේ පවුල් සබඳතා, පවුලේ කටයුතු, පුද්ගලික සබඳතා, සිරිත් විරිත්, පුරුදු, රුචි අරුචිකම් යහළු යෙහෙළියන් සමග ඇති සබඳතා, විනෝදය ගත කරන ආකාරය, විනෝදාංශ ආදිය එයට ඇතුළත්ය.

සමාජවාදය තුළදී පුද්ගලයාගේ පුද්ගලික නිදහස උපරිමයෙන් ආරක්ෂා කෙරේ. කිසියම් අයෙකුගේ පුද්ගලික නිදහසට බාධාකිරීමට රජයට හෝ වෙනත් ආයතනයකට ඉඩ නොලැබේ. සමාජවාදයේදී පුද්ගලයාගේ පුද්ගලික නිදහසෙහි නිර්මාණාත්මක සංවර්ධනයට පුළුල් ඉඩකඩක් විවෘත වේ. පුද්ගලික නිදහසේ නිර්මාණශීලී සංවර්ධනය සමාජවාදය තුළදී සහතික කෙරේ. කිසියම් පුද්ගලයෙකුට ඔහුගේ දැක්මට, රුචි අරුචිකම්වලට, ආශාවන්ට රසඥතාවට, කැමැත්තට, පුරුද්දට අනුකූලව සාමාන්‍ය ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය නිදහස සහතික කෙරේ. යමෙකුගේ පුද්ගලික නිදහසට බාධා කිරීමට පිටස්තර පුද්ගලයන්ට ඉඩ නොලැබේ.

සමාජවාදී රජයට පුරවැසියන්ගේ පුද්ගලික ජීවිතය තුළට මැදිහත්වීමේ අවශ්‍යතාවක් නැත. සමාජවාදී රජය රටේ ආර්ථිකය, විදේශ සබඳතා වැනි මූලික දේශපාලනය පමණක් හසුරුවයි. එක් එක් පුද්ගලයා පවුල් සබඳතා පැවැත්විය යුත්තේ කෙලෙසද, විනෝද විය යුත්තේ කෙලෙසද, ආදී වශයෙන් තීරණය කිරීමට රජය මැදිහත් නොවේ. ඒවා එක් එක් පුද්ගලයා විසින් තීරණය කළ යුතු ඔවුන්ගේ පුද්ගලික නිදහසට අයත් කාරණය.

> සමාජවාදී රජයට පුරවැසියන්ගේ පුද්ගලික ජීවිතය තුළට මැදිහත්වීමේ අවශ්‍යතාවක් නැත. සමාජවාදී රජය රටේ ආර්ථිකය, විදේශ සබඳතා වැනි මූලික දේශපාලනය පමණක් හසුරුවයි. එක් එක් පුද්ගලයා පවුල් සබඳතා පැවැත්විය යුත්තේ කෙලෙසද, විනෝද විය යුත්තේ කෙලෙසද, ආදී වශයෙන් තීරණය කිරීමට රජය මැදිහත් නොවේ. ඒවා එක් එක් පුද්ගලයා විසින් තීරණය කළ යුතු ඔවුන්ගේ පුද්ගලික නිදහසට අයත් කාරණාය.

සමාජවාදය තුළදී සමාජවාදී රජය මැදිහත් වී සෑම පුද්ගලයෙකුටම රැකියාවක්, නිවාසක්, නොමිලේ අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් ආදී මූලික අවශ්‍යතා සම්පූර්ණ කරයි. එය රජයේ වගකීමකි. වැටුප් සකස් කිරීමේදී පුද්ගලයාගේ සහ පවුලේ විනෝදය සඳහා යන වියදම්ද වැටුපට එකතු කෙරේ.

සමාජවාදය ගොඩ නැගීම විද්‍යාත්මක ක්‍රියාවලියකි. එය සෑම විටම විද්‍යාවෙන් සහ විද්‍යාත්මක සොයාගැනීම්වලින් මඟ පෙන්වනු ලබයි.

පුද්ගලයෙකු වැඩෙහි නොයෙදෙන කාලය කොටස් 03කට බෙදිය හැකිය. ඒ,

1. රැකියාවෙහි යෙදෙද්දී හෝ නිවසේ සිටිද්දී දිවා ආහාරය සඳහා, පුහුණුවීම් සඳහා, ඉවුම් පිහුම්, ළමයින් බලා ගැනීම, කඩයට යාම, නිවස පිරිසිදු කිරීම ආදිය සඳහා ගත කරන කාලය
2. ශාරීරික හැකියාවන් ප්‍රතිපූර්ණය සහ ශරීරයේ ජීව රසායනික ක්‍රියාවලිය විසින් ඉල්ලා සිටින කාලය, (උදා. නින්ද, ස්වස්තතාව ආදී)
3. නිදහස් කාලය (විනෝද වන කාලය) ලෙසය.

මේ අතරින් පුද්ගලයාගේ සංවර්ධනය සඳහා වැදගත්වන්නේ නිදහස් කාලයයි. වැඩ කරන කාලයේදී, ශ්‍රම ක්‍රියාවලියේදීද පුද්ගලයාගේ සංවර්ධනය සිදුවන බව ඇත්තය. නිෂ්පාදන ක්‍රියාවලියේදී සාමූහික වැඩෙහිදී පුද්ගලයාගේ කායික හා අධ්‍යාත්මික හැකියාවන් හෙළිදරව් වේ. වැඩ කරන පුද්ගලයාගේ පෞරුෂය වර්ධනය සඳහා වැඩි අවස්ථා නිර්මාණය කරන්නේ නිදහස් කාලයේදීය.

සමාජවාදය තුළදී සෑම පුද්ගලයෙකුටම නිදහස් කාලය වැඩිකර දීමට උත්සාහ කෙරේ. ඊට අමතරව සමාජවාදය තුළදීද නිදහස් කාලය ගතකිරීම සඳහා අවශ්‍ය පහසුකම්ද ගොඩ නගනු ලබයි. නිවාඩු නිකේතන, සිනමා ශාලා, ක්‍රීඩාගාර, නාට්‍ය ශාලා ආදිය ගොඩනගනු ලබයි. ධනවාදයේදී මෙන් නොව සෑම පුරවැසියෙකුටම සහන මිලකට එම සේවා හා පහසුකම් ලබා ගැනීමට ඉඩ සැලසේ.

සමාජවාදය තුළදී විලාසිතාවන්ට ඉඩක් නොමැතිය යන්න වැරදි මතයකි. රූපලාවන්‍ය කටයුතු, විලාසිතා ආදිය සමාජවාදය තුළදී පවතී. මෝස්තර නිර්මාණය කරන ආයතන, රූපලාවන්‍ය කටයුතු සමාජවාදය තුළදී වෙනම ස්වාධීන ක්ෂේත්‍රයක් ලෙස වර්ධනය වේ. ඒ ඒ ක්ෂේත්‍රයේ නව නිර්මාණයන්ට, පර්යේෂණයන්ට වෙන්වූ වෙනම ආයතන සමාජවාදී රටවල පවතී. එම ආයතනවලින් නවීනතම මෝස්තර හා මෝස්තර ශිල්පීන් බිහිවේ. පුද්ගලයන්ට තමන් කැමති විලාසිතාවන් අනුගමනය කිරීමට බාධාවන් සමාජවාදය තුළදී නොපවතී.

රුචිකත්වයන් පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ. කිසියම් පුද්ගලයෙකුගේ රුචිකත්වය ජීව විද්‍යාත්මක, මනෝවිද්‍යාත්මක, සමාජවිද්‍යාත්මක ආදී සාධක ගණනාවක් මගින් තීරණය කරනු ලබයි. පුද්ගල රුචිකත්වයන් පාලනය කිරීමට සමාජවාදී රජය කිසිවිටෙකත් අදහස් නොකරයි. පුද්ගලයාගේ පුද්ගලික නිදහස භුක්ති විඳිය යුත්තේ කෙසේද යන්න තීරණය කිරීම රජයට අයත් කාරණයක් නොවේ. එය තීරණය කළ යුත්තේ ඒ ඒ පුද්ගලයන්ය. සමාජවාදී රජය පුද්ගලයාගේ පුද්ගලික නිදහසට උපරිමයෙන් භුක්ති විඳීම සඳහා අවශ්‍ය පහසුකම් සලසන්නේ එබැවිනි.



"ඒ සමාජවාදීන්ගේ කෘති අපි නැවත වරක් කියවා බලමු නම්, විද්‍යාව එහි ධනපති බැඳීම්වලින්ද, ධනපති ක්‍රමයට බැඳුණු එහි වහල්භාවයෙන්ද, කැත ධනපති කෑදරකමෙහි වුවමනාවන් කෙරෙහි බැඳුණු එහි වහල්භාවයෙන්ද මුදාගනු ලැබෙනු ඇත්තේ සමාජවාදය විසින් පමණකැයි යනු, ඒ සියලු දෙනාම, කිසිම විශේෂයක් නොමැතිව පෙන්වා දී තිබෙන බව දක්නට පිළිවන.''

**ලෙනින්**
**තෝරා ගත් කෘති,**
**8වැනි වෙළුම,**
**134 පිටුව**

# එක්සත් ජනපදය: මොට වන සම්බාධක අවිය

එක්සත් ජනපදය පසුගිය කාලයේදී රටවල් ගණනාවකටම එරෙහිව සම්බාධක පැනවීමට කටයුතු කළාය. වෙනිසියුලාව, රුසියාව, ඉරානය ඒ අතර ප්‍රධානය. ඊට පෙර සෞදි අරාබිය ප්‍රමුඛ මැද පෙරදිග රටවල් ගණනාවක්ම කටාරයට එරෙහිව සම්බාධක පැනවීමට කටයුතු කර තිබුණි. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයද පසුගියදා උතුරු කොරියාවට එරෙහිව නැවතත් සම්බාධක පැනවීය.




මෙම සියලු සම්බාධක පැනවීම්වලට හේතු වශයෙන් ප්‍රකාශිත කරුණු ගණනාවකි. 'ප්‍රජාතන්ත්‍රවාදය', ත්‍රස්තවාදයට උදව් කිරීම, න්‍යෂ්ටික තර්ජන ආදී බැලූ බැල්මට ඉතාම සාධාරණ සේ පෙනෙන හේතු ඒ සඳහා ඉදිරිපත් කරනු ලැබ තිබේ. එහෙත් ඇත්ත වශයෙන්ම මෙම සම්බාධක පැනවීම්වලට හේතු වී ඇත්තේ, එකී ප්‍රකාශිත කරුණු නොවේ. එසේම මෙම සම්බාධක පැනවීම් සිදුවන්නේ, හුදෙක් ප්‍රකාශිත රටවලට පමණක්ද නොවේ. එය සෑම දිශාවකටම එරෙහිව, ක්‍රියාත්මක වේ. රුසියාව, චීනය, උතුරු කොරියාව, ඉරානය, යුරෝපා සංගමය, එක්සත් ජනපද තෙල් සමාගම් හා අනෙකුත් සමාගම්ද මෙම සම්බාධකවල ගොදුරු බවට පත් වී තිබේ.

එහෙත් ඒ අතරම මෙම සම්බාධක ලෝකයේ වෙළඳ හා දේශපාලන ආධිපත්‍යය සඳහා එක් එක් බලකේන්ද්‍රයන්ගේ අරගලය පෙන්නුම් කරන්නක් බවටද පත් වී තිබේ.

### ඉරානයට එරෙහිව

පසුගිය අගෝස්තු මස ආරම්භයේදී එක්සත් ජනපදයේ කොංග්‍රස් මණ්ඩලය පැනවීමට යෝජනා කළ සම්බාධක ප්‍රධාන වශයෙන් ඉලක්ක වී තිබුණේ, ඉරානය හා රුසියාවය. එහි ඉරාන කොටසින් ඉරානය සමග අවි ගනුදෙනු කරනු ලබන (අවි ආයුධ විකිණීම, මිලදී ගැනීම, සේවාවන් සැපයීම ආදී) පාර්ශවයන්ට සම්බාධක පනවන බව සඳහන් කොට තිබුණි. බැලූ බැල්මට මෙය ඉරානය ඉලක්ක කර ගනිමින් පැනවූ සම්බාධකයනක් ලෙස පෙනුනද ඉන් රුසියාවද ඉලක්ක කොට තිබුණි.

2016 ජනවාරියේ දී ඔබාමා පාලනය හා යුරෝපා සංගමය ඉරානයට පනවා තිබූ සම්බාධක ඉවත් කිරීමත් සමග රුසියාව ඩොලර් බිලියන 10ක රුසියානු අවි ආයුධ ඉරානයට විකිණීම පිළිබඳ සාකච්ඡා ආරම්භ කළේය. ඒ අනුව 2016 අගෝස්තු මාසයේදී රුසියාව S-300 මිසයිල ආරක්ෂණ පද්ධතියක් ඉරානයට අලෙවි කිරීමට සමත් විය. සම්බාධකවල ඉරාන කොටසින් එක්සත් ජනපදය අදහස් කරන්නේ, මේ අයුරින් ඉරානය හා රුසියාව අතර ගොඩනැගෙන යුදමය, ආර්ථික හා දේහපාලනික සමීප සබඳතාව බිඳ දැමීමය.

### රුසියාවට එරෙහිව

සම්බාධකවල රුසියානු කොටසින් රුසියාවේ බලශක්ති අපනයන නල මාර්ග ගොඩනැගීමට, අලුත්වැඩියාවට, සේවා සැපයීමට මැදිහත්වන කවර හෝ සමාගමකට සම්බාධක පැනවීමට අදහස් කෙරේ. එහිදී විශේෂයෙන්ම රුසියාවේ විබෝර්ග් (Vyborg) ප්‍රදේශයේ සිට ජර්මනියේ ග්‍රීන්ස්වෝල්ඩ් (Griefswald) ප්‍රදේශය දක්වා, යුක්රේනය මඟහරිමින් ගොඩනැගෙන රුසියානු ස්වභාවික වායු නල පද්ධතිය ඉලක්ක කොට තිබේ. එක්සත් ජනපදය 'උතුරු ධාරාව 2' නමින් හඳුන්වන මෙම නල පද්ධතියට විරුද්ධ වීමට හේතු වශයෙන් දක්වා ඇත්තේ, යුරෝපා සංගමයේ බලශක්ති සුරක්ෂිතභාවයට, මධ්‍යම හා නැගෙනහිර යුරෝපීය ස්වාභාවික වායු වෙළඳපළ සංවර්ධනය, හා යුක්රේනයේ බලශක්ති ප්‍රතිසංස්කරණවලට එමගින් වන හානිය වැළැක්වීමය. (උතුරු ධාරාව නල මාර්ග යේ පළමු අදියරේ වාර්ෂික ධාරිතාව ඝන මිටර බිලියන 55කි. 'උතුරු ධාරාව 2 මගින් එය දෙගුණ කිරීමට එනම් වාර්ෂික ධාරිතාව ඝන මීටර බිලියන 110 දක්වා ඉහළ දැමීමට අපෙක්ෂා කෙරේ. යුරෝපා සංගමය දැනටමත් රුසියාවට පනවා ඇති සම්බාධක නිසා එහි පළමු අදියරේ ධාරිතාවෙන් භාවිත වන්නේ ඝන මීටර් බිලියන 22.5 ක් පමණි.)

මීට අමතරව රුසියානු සමූහාණ්ඩුවේ රාජ්‍ය අයිතිය ඇති දුම්රිය මාර්ග, ආකර ලෝහ කර්මාන්ත, අංශ වෙතද, එක්සත් ජනපදය විසින් සම්බාධක පනවා තිබේ.

රුසියාව ලෝකයේ දැවැන්තම ස්වාභාවික වායු අපනයන කරන රටවල්වලින් එකකි. එසේම යුරෝපා සංගමය යනු විශාලතම ස්වාභාවික වායු වෙළඳපළකි. රුසියාවේ සිට යුරෝපය වෙත ඇති සහ ගොඩනැගෙ නමින් පවතින ස්වාභාවික වායු නල මාර්ග රුසියාවට පමණක් නොව යුරෝපා සංගමයටද එකසේ වැදගත්ය. එක්සත් ජනපදයේ සම්බාධක මගින් 'උතුරු ධාරාව 2' ඉදිකිරීම නැවැත්වීමෙන් අර්බුදයකට යන්නේ රුසියාව පමණක් නොවේ. මෙම ව්‍යාපෘතිය තුළ කටයුතු කරන සියලු සමාගම් විශේෂයෙන් ජර්මන් හා ඕස්ට්‍රියානු සමාගම් මේ නිසා බරපතළ ගැටලුකාරී තත්වයන්ට මුහුණ දෙයි.

එක්සත් ජනපදයේ මෙම උත්සාහය යුරෝපා සංගමයේ ස්වාභාවික වායු වෙළඳපොළ තමන් වෙත සහ සවුදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ක්වේටය වැනි තමන්ට හිතවත් රටවල් අතට ගැනීමය.

### තුර්කි ධාරාව

මේ අතර රුසියාව තම රටේ සිට තුර්කිය දක්වා දිවෙන 'තුර්කි ධාරාව' නමින් හැඳින්වෙන ස්වාභාවික වායු නල මාර්ගය ගොඩනැගීමේ කටයුතු වේගවත් කර තිබේ. මෙම නල මාර්ගය රුසියාවේ සිට කළු මුහුදු පත්ල හරහා තුර්කිය වෙත ඉදිවේ. එහි පළමු කොටස 2018 මාර්තු මාසයේදීත්, දෙවන කොටස 2019 මාර්තුවේදීත් අවසන් කිරීමට නියමිතය. තුර්කිය උත්සහ කරන්නේ, මෙම නල මාර්ගය හරහා යුරෝපයට ස්වාභාවික වායුව අපනයනය කරන කේන්ද්‍රස්ථානය බවට පත්වීමටය.

යුරෝපා සංගමයේ නීති රීති අනුව රුසියානු සමාගම්වලට යුරෝපා සංගමය තුළ රුසියානු නල මාර්ග ගොඩනැගීමට හෝ පවත්වාගෙන යාමට නොහැකිය. 'තුර්කි ධාරාව' නල මාර්ගය අවසන් වන්නේ තුර්කි බල්ගේරියානු දේශ සිමාව අසලින් සහ තුර්කි ග්‍රීක දේශ සීමාව ආසන්නයෙනි. යුරෝපා සංගමයේ කිසියම් රටකට රුසියානු ස්වාභාවික වායුව ලබාගැනීමට අවශ්‍ය නම් එම ස්ථානවල සිට තමන්ට නල මාර්ගයක් ගොඩනගා ගත හැකිය. ඒ අනුව දැනටමත් බල්ගේරියාවත්, සර්බියාවත්, හංගේරියාවත්, 'තුර්කි ධාරාව' මගින් ස්වාභාවික වායුව ලබාගැනීමට ගිවිසුම් අත්සන් කර තිබේ.

මෙම තත්වය ලෝක දේශපාලන බල තුලනයේ වෙනස්වීම්වලටද, බලපා තිබේ. විශේෂයෙන් නැගෙනහිර යුරෝපීය රටවල් වන හංගේරියාව, චෙක් ජනපදය, බල්ගේරියාව, යුරෝපා සංගමය වෙත නොව රුසියාවේ හා චීනයේ නායකත්වයෙන් ගොඩගැගෙන යුරේසියාව වෙත නැඹුරුවන්නට පටන්ගෙන තිබේ.

මේ වන විට එක්සත් ජනපදයත්, බටහිර යුරෝපයත් රටවලුත් න්‍යෂ්ටික බලශක්තිය කෙරෙහි සිය අවධානය අඩුකිරීම හේතුවෙන් රුසියාව න්‍යෂ්ටික තාක්ෂණය අපනයනයේ ප්‍රමුඛයෙක් බවට පත්ව සිටී, දැනටමත් රුසියාව න්‍යෂ්ටික තාක්ෂණික ලෝක වෙළඳපළින් 60% කට වැඩි ප්‍රමාණයක් අත්පත් කරගෙන අවසන්ය. ප්‍රංශය පදනම් කර ගනිමින් ක්‍රියාත්මක වන යුරෝපයේ විශාලතම න්‍යෂ්ටික නිෂ්පාදන සමාගම වන Areva සමාගමට 2007 වසරේ සිට කිසිදු නව විදේශ ගිවිසුමකට එළඹිය නොහැකි විය. එක්සත් ජනපදයේ Westinghouse න්‍යෂ්ටික සමාගම බංකොලොත් වෙමින් තිබේ. ඊට ප්‍රතිවිරුද්ධව රුසියාව පසුගිය වසර කිහිපය තුළදී රටවල් 13ක න්‍යෂ්ටික බලාගාර 34ක් ගොඩගැනීම සඳහා ගිවිසුම් අත්සන් කර තිබේ. මෙම රටවල් අතර හංගේරියාව, චෙක් ජනපදයත්, තුර්කියත් සිටියි.

මීට අමතරව NATO රාජ්‍යයක් වන තුර්කිය, එක්සත් ජනපදයේ හා NATO සංවිධානයේ විරෝධය නොතකා එක්සත් ජනපදයේ පේට්‍රියට් මිසයිල ආරක්ෂණ පද්ධතිය වෙනුවට රුසියාව S-400 ගුවන් ආරක්ෂක පද්ධතිය මිලදී ගැනීමට සූදානම් වේ.

රුසියාව සමග හංගේරියාව, චෙක් ජනපදය, සර්බියාව, බල්ගේරියාව, හා තුර්කිය ගොඩනගා ගනිමින් සිටින මෙම ස්වාභාවික වායු, න්‍යෂ්ටික බලශක්ති සහ යුදමය ගිවිසුම් එක්සත් ජනපදය නොසන්සුන් කරවන්නකි. එසේම එය බෝල්ටික් කලාපීය තුළ රුසියාව හා චීනය මූලික කරගත් එකතුවක් ගොඩනැගීමේ සංඥාවක්ද වේ.

අපි පසුගිය කලාපයේදී මැදපෙරදිග උණුසුම් කළ කටාර් ප්‍රශ්නය පිළිබඳව සාකච්ඡා කළෙමු. එහිදී මතුවූ කරුණු අනුවද පෙනී ගියේ කටාරයද, ඉරානය, රුසියාව, චීනය සහ තුර්කිය සමග වඩා ශක්තිමත් සබඳතා ඇතිකර ගැනීමට ඇති හැකියාවයි. එසේ වුවහොත් එයද තවදුරටත් කලාපය තුළ එක්සත් ජනපද බලපෑම දුර්වල කරනු ඇත.

## උතුරු කොරියාව: හත්වැනි සම්බාධකයටත් ලක්වී




මේ අතර එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය පසුගිය අගෝස්තු 05වැනිදා එක්සත් ජනපදය විසින් කෙටුම්පත් කරන ලද උතුරු කොරියාවට එරෙහිව සම්බාධක පැනවීමට අදාළ යෝජනාව සම්මත කර ගත්තේය. මෙම සම්බාධකවලට අනුව උතුරු කොරියාව විසින් අපනයනය කරනු ලබන ගල් අඟුරු, යකඩ, යපස්, ඊයම් නිධි සහ මුහුදු ආහාර අපනයනය තහනම් කෙරේ. උතුරු කොරියාව සමග නව වෙළඳ කටයුතු ආරම්භ කිරීම හා දැනට ඇති එවැනි ගිවිසුම් පුළුල් කිරීම තහනම් කෙරේ. 2006 වසරේ සිට උතුරු කොරියාවට පැනවූ හත්වන සම්බාධකය මෙයයි. මේ හරහා උතුරු කොරියාවේ අපනයන ආදායම 30% කින් පමණ අඩුවෙතැයි අපේක්ෂා කෙරේ.

උතුරු කොරියාවට පැනවූ මෙම සම්බාධකවලට චීනය හා රුසියාව සිය පක්ෂපාතීත්වය ප්‍රකාශ කළද, ඒ වෙනත් පදනමකිනි. ඔවුන්ගේ අදහස වූයේ, උතුරු කොරියාවේ න්‍යෂ්ටික අත්හදා බැලීම් සහ ඔවුන්ගේ න්‍යෂ්ටික වැඩපිළිවෙළ පිළිගත නොහැකි වුවත් ඔවුන්ට එසේ කිරීමට සිදුවී ඇත්තේ, එම කලාපය තුළ මතුවී යුදමය තත්වය නිසා බවය. දකුණු කොරියාව තුළ THAAD මිසයිල පද්ධතිය ස්ථාපිත කිරීමත් දකුණු චීන මුහුදේ එක්සත් ජනපද ක්‍රියාකාරීත්වය වර්ධනය වීමත් හා එහි ඇති වී ඇති යුදමය නොසන්සුන්කාරීත්වයත් නිසා බවය. එබැවින් ඔවුන් සම්බාධක සඳහා එකඟ වී ඇත්තේ, කලාපය තුළ මතු වී ඇති එවැනි වර්ධනයක් ආපසු හැරවීම සඳහාද ක්‍රියාමාර්ග ගත යුතුය යන පදනමිනි. මේ නිසා එම සම්බාධක පැනවීම හුදෙක් උතුරු කොරියාවට පමණක් නොව කලාපය තුළ එක්සත් ජනපද ක්‍රියාකාරීත්වයටද බලපා ඇති බව පෙනේ.

## ඉන්දියාව-චීනය: දේශසීමා ගැටුමකට මුල පුරා




හිමාලය ප්‍රදේශයේ චීනය, ඉන්දියාව හා භූතාන් රාජධානියේ දේශසීමා එකට මුහුණ ගැසෙන ඩොක්ලාම් සානුවේ වර්ග කිලෝමීටර් 100ක පමණ ප්‍රදේශයක් සම්බන්ධයෙන් චීනය හා ඉන්දියාව අතර ගැටුමක් නිර්මාණය වී තිබේ. මෙම ගැටුම ආරම්භ වී දැනට ගතවී ඇත්තේ මාස 02ක පමණ කාලයක් වුවද ඩොක්ලාම් සානුවේ අයිතිය පිළිබඳ ප්‍රශ්නයට ඊට වඩා වැඩි ඉතිහාසයක් ඇත. එවකට මෙය බ්‍රිතාන්‍ය ඉන්දියාව, ටිබෙටය හා චීන අධිරාජ්‍යය අතර ප්‍රශ්නයක් විය. එකල භූතානය පැවතියේ, බ්‍රිතාන්‍ය ඉන්දියාවේ භාරකාරීත්වය යටතේය. ඉන්දියාව මෙම ප්‍රශ්නයට මැදිහත් වී සිටින්නේ එම ඓතිහාසික අයිතිය පාවිච්චි කරමිනි.

## එ.ජ.: මත්ද්‍රව්‍ය මරණ ඉහළ ගොස්



පසුගිය අගෝස්තු 10 වන දා එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් පැවසුවේ මත්ද්‍රව්‍ය භාවිතය එක්සත් ජනපදය තුළ හදිසි ආපදා තත්වයක් මතුකර ඇති බවය. පසුගිය අවුරුදු 15 තුළ පමණක් එක්සත් ජනපදය තුළ මත්ද්‍රව්‍ය අධිභාවිතය හේතුවෙන් පුද්ගලයන් 183,000 ක් මරණයට පත් වී ඇත.

මේ අතර එක්සත් ජනපදයේ ඖෂධ අධිමාත්‍රාවන් ගැනීමෙන් සිදුවන මරණ සංඛ්‍යාව 2014 වසරට වඩා 2015 වසරේදී ඉහළ ගොස් ඇති බව වාර්තා විය. මේ බව හෙළි වූයේ, රෝග පාලනය හා වැළැක්වීමේ එක්සත් ජනපද මධ්‍යස්ථානය නිකුත් කළ සංඛ්‍යාලේඛන අනුවය. මේ අනුව අවු. 15-19 අතර වයස්වල සිදුවන මරණ අතුරින් 100,000කට මරණ 3.7ක් සිදුවන්නේ ඖෂධ අධිමාත්‍රාවක් ගැනීමෙනි. 2014 වසරේදී එම අගය 3.1ක් ව තිබුණි. ඉන් වැඩි ප්‍රමාණයක් සිදුවන්නේ හෙරොයින් නැමැති මත්ද්‍රව්‍ය හේතුවෙන් බවද සොයාගෙන තිබේ.

## BRICS බැංකුවට ශාඛාවක්




BRICS බැංකුවේ පළමු ශාඛාව පසුගිය අගෝස්තු 17වැනිදා දකුණු අප්‍රිකාවේ ජොහැන්නස්බර්ග් නුවරදී විවෘත විය. එහි මූලස්ථානය පිහිටා ඇත්තේ චීනයේය. BRICS බැංකුව දැන් හඳුන්වනු ලබන්නේ, නව සංවර්ධන බැංකුව ලෙසය. BRICS සංවිධානය විසින් පළමු වරට මෙම බැංකුව පිහිටවනු ලැබුවේ 2014 වසරේ ජූලි මාසයේදීය.

දකුණු අප්‍රිකාවේ පිහිට වූ මෙම නව සංවර්ධන බැංකුව පළමු වසර තුළදී ඩොලර් බිලියන 115ක වටිනාකමකින් යුතු මූල්‍යකරණයක් සිදුකිරීමට බලාපොරොත්තු වන අතර එය කලාපය තුළ ලෝක බැංකුවට එරෙහි තරගකරුවෙකු ලෙස කටයුතු කිරීමටද බලාපොරොත්තු වේ.

# වරාය චීනයට දී ණයට දත නියවීම



ජන සාහිත්‍යයේ අප අසා ඇත්තේ, "වත්ත බද්දට දී ඇස්සට දත නියවීම" කියමනක් ලෙසටය. එහි අදහස තමන් සන්තක වටිනා සම්පත් අනුනට පවරා එහි සුළු වාසියක් දෙස කෑදරකමින් බලා සිටින්නෙකු විස්තර කිරීමයි. ආණ්ඩුවේ රාජ්‍ය සම්පත් පාඩුවට විකිණීමද ඊට කදිමට ගැලපේ. අද ඊට හොඳම උදාහරණය බවට පත්ව ඇත්තේ, හම්බන්තොට වරාය චීනයට විකුණා (බදු දී) ණයට දත නියවාගෙන බලා සිටීමය. ණය බරින් මිරිකා ඇති ලංකාවට ඩොලර් බිලියන 1.12ක් වෙනුවෙන් හම්බන්තොට වරාය විකුණා ගැනීමට හැකිවීම ආණ්ඩුවට අනුව "මහා ජයග්‍රහණයකි. "මීට කලින් ජේ.ආර්. ජයවර්ධනගේ සිට මහින්ද රාජපක්ෂ දක්වා පාලකයින් ආඩම්බර වූයේ ණය ගැනීමට හැකිවීම ගැනය. කලින් රට පාලනය කළ පාලකයාට වඩා තමන්ට ණය ගැනීමට හැකියාව තිබේ යැයි පෙන්වීම පුරුද්දක් විය. ඒ නිසා තමන්ගේ ආණ්ඩුව ජයග්‍රහහණයක් ලැබුවා යැයි ඔවුන් පැවසුවේ ණය ගැනීමට හැකි වීම ගැනය. අවසානයේදී ලංකාව සෑම පුරවැසියකුම රු. පන්ලක්ෂ විසිපන්දහසක් දක්වාම ණයකාරයෙකු කර මේ ණය ගැනීමේ "ජයග්‍රහණය" සැමරීමට පාලකයින්ට හැකියාව ලැබිණි.

දැන් ගත් ණයට පොලිය ගෙවා ගත නොහැකිව, තවදුරටත් ණය ගත නොහැකිව හිරවූ විට කියන්නේ ණයට හිලව්වට වරාය විකුණාගැනීමට හැකිවීම ජයග්‍රහණයක් බවය. මහින්ද රාජපක්ෂ ණය ගැනීම ඔහුට අනුව ජයග්‍රහණයකි. ඒ ණය ගවා ගත නොහැකි නිසා ණය ගෙන ඉදිකළ වරාය, මත්තල ගුවන්තොටුපොළ (ඉදිරියේදී දැන් ඉදිකරන අධිවේගී මාර්ග) විකුණා ගැනීමට හැකිවීම රනිල් වික්‍රමසිංහගේ 'ජයග්‍රහණයකි'. කෙසේ නමුත් මේ ක්‍රියාවන් දෙකම රටේ පරාජයකි; ජනතාවගේ පරාජයකි.

## උපායමාර්ග අවුල

ශ්‍රී ලංකාවේ ආර්ථිකය මුළුමනින්ම කඩා වැටී ඇති බවට දැන් පක්ෂ විපක්ෂ ලෙස හෝ ආණ්ඩු හෝ ආණ්ඩු විරෝධී ලෙස හෝ විවාදයක් බෙදීමක් නැත. පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව කවුරුත් පිළිගන්නා සත්‍යයක් වන්නේ ආර්ථිකය අර්බුදයක ඇති බවය. එසේනම්, ආර්ථිකයේ උපායමාර්ග විය යුත්තේ වත්කම, ආදායම් හානි කර ගැනීමද? නැතහොත් උපයා ගැනීමක්ද? අර්බුදයේ තරමටම කාරණයද පැහැදිලිය. වත්කම් උපයා ගැනීම (රැකගැනීම) වෙනුවට වත්කම හානිකර ගැනීමේ මාවත තෝරා ගතහොත් ප්‍රතිඵලය විය හැක්කේ කුමක්ද? හෙට දවසේ තවත වත් අර්බුදයෙන් අර්බුදයටම ගමන් කිරීමය.

## හම්බන්තොට විශේෂිතය

හම්බන්තොට වරාය ලංකා සිතියමේ විශේෂිතයකි. ඉතිහාසයේද ලංකාවට විවිධ විදේශිකයන්ගේ ගොඩබෑම සනිටුහන් වීමේදී කිරින්ද, හම්බන්තොට ප්‍රදේශ ගැන සඳහන්ය. හම්බන්තොට විශේෂිතයක් වන්නේ, ලෝක සිතියම තුළ ලංකාවේ පිහිටීමට ඇති වැදගත් සුවිශේෂීතාවයට සාපේක්ෂවය. ලංකාව ලෝක සිතියමේ වෙනත් තැනක පිහිටියේ නම් එම ස්ථානය අනුව 'හම්බන්තොට' අදාළ නොවනු ඇත. ඒ සුවිශේෂී පිහිටීම නිසා ඇති වටිනාකමේ මුදල්මය අගය කොපමණදැයි කෙසේ ගණන කළ හැකිද? අද වටිනාකම රුපියල් හෝ ඩොලර්වලින් මෙපමණකැයි කියා අද ගණනය කළ හැක්කේ කාටද? ලෝකය සංවර්ධන වන ප්‍රමාණය, ආකාරය, ලෝකයේ තාක්ෂණය ඉදිරියේ සොයා ගන්නා නව වටිනාකම්වලට සාපේක්ෂව එම හම්බන්තොට හා වරායේ අගය අද කිව හැක්කේ කෙලෙසද? කාටද? අතීත ණයක් වර්තමානයේ ගෙවා ගැනීමට නොහැකිව අර්බුදයේ ගිලී ඇති දුබල පාලකයින්ට එතරම් දෙයක් තේරුම් ගැනීමේ අවශ්‍යතාවයක් නොමැත.

එපමණක් නොවේ. වරායන් හැම තැනකම සෑදිය නොහැකිය. ණයක් ලබාගෙන ව්‍යාපාරයක් හෝ යම් භාණ්ඩ නිපදවන කර්මාන්ත ශාලාවක් ආරම්භ කළහොත් එය ණය ගෙවා ගත නොහැකි නම් වසා දැමිය හැකිවාක් මෙන්ම අවශ්‍ය නම් නැවත මුදලක් යොදවා වෙනත් තැනක ආරම්භ කළ හැකිය. වෙනත් කෙනෙකුට බදු දී තවත් තැනක ආරම්භ කිරීමටද හැකිය. ඉදිකළ වරාය චීනයට විකුණා යළි වෙනත් තැනක හම්බන්තොට වරාය ඉදිකළ නොහැකිය. එම ආවස්ථික (විකල්ප වටිනාකම) අවස්ථාවේ පිරිවැය මෙම කුණු කොල්ලයට හම්බන්තොට වරාය චීනයට පැවරීමේදී ආණ්ඩුව ගණනය කර තිබේද? එසේ නම් ඒ සඳහා (වරායක් අහිමි වීමේ පිරිවැය වෙනුවෙන්) මෙම ගිවිසුමේදී ශ්‍රී ලංකා රජයට චීනයෙන් එකතු කරන ලද ආදායම කවරක්ද? එවැනි ගණන් බැලීමක් ගැන ශ්‍රී ලංකාවේ ආණ්ඩුවෙන් අත්සන් කළවුන් හිතාවත් නැති බව නම් ඉතා පැහැදිලිය.

## මහින්දගේ හැදීම

හම්බන්තොට වරායක් ඉදිකිරීමේ අවශ්‍යතාවය ඇති බවට තර්කයක් නොමැත. එම වරාය ඉදිකළ මහින්ද රාජපක්ෂ දැන් කියන්නේ 'තමන් වරාය හැදුවා, රනිල් ඒක විකුණුවා' යන්නය. ඒ අනුව රනිල් කළේ වැරදි දෙයක් ලෙසට හම්බන්තොට වරාය විකිණීමට ඇති සැබෑ ජනතා විරෝධය තම බාල දේශපාලන වාසි ගැනීමේ තුරුම්පුවක් ලෙස භාවිතා කිරීමට ඔහු උත්සාහ කරනු දැකිය හැකිය. නමුත් එහි ඇති ගැටලුව වන්නේ මහින්ද චීනයෙන් ණය ලබා ගෙන ඉදිකළේ කවර වර්ගයේ අවශ්‍යතාවයකට ගැලපෙන වරායක්ද යන්නය. හම්බන්තොට මූලික කර ඉදිකළ යුතු වූයේ ලංකාවේම නිපදවන භාණ්ඩ රට පටවන සහ ලංකාවට අවශ්‍ය (ආනයනික භාණ්ඩ) ලංකාවට ගෙන්වන වරායක් ලෙස නොව ප්‍රතිඅපනයන අවශ්‍යතාව සහ විශේෂයෙන් හම්බන්තොටට නුදුරු ජාත්‍යන්තර මුහුදේ ගමන් කරන දැවැන්ත නැව් වෙත බංකරින් සේවා සපයන වරායක් ලෙසය. එවැනි තෙල් සහ අනෙකුත් පහසුකම් සැපයීමේ වරායක් මෙම ඉන්දියානු සාගර කලාපයේ ඉදිකිරීමට හැකි සුවිශේෂීම පිහිටීම ඇත්තේ මාලදිවයිනට, පාකිස්තානයට හෝ ඉන්දියාවට නොව ශ්‍රී ලංකාවටය. දකුණු ආසියානු කලාපයේ රටක් වුවත් නේපාලයට අඩු තරමේ වරායක් හැදීමේ වාසනාවක් නැත. නේපාලය භාවිතා කරන්නේ ඉන්දියාවේ වරායන්ය. ලංකාවේ අපට ස්වභාව ධර්මයෙන් ලබා දී ඇති ස්වාභාවික පහසුකම උපරිම ප්‍රයෝජන ගත හැකි ලෙස යොදා ගත හැකිව තිබියදී රාජපක්ෂවරුන් "මාගම්පුර රාජපක්ෂ වරාය" ඉදිකළේ ඒ වෙනුවෙන් නොව තම ප්‍රතිරූපය පුම්බා ගැනීමටය. ඒ නිසා සකස් කළේ බංකරින් වරායක් නොව රථගාලක් වැනි සාමාන්‍ය නැවතුම්පළකි. එයට ලබාගත් ණය ඉක්මනින් වියදම් කර කොමිස් මුදලක් තමන්ට එකතු කර ගැනීමට සිහින දැකීමේ ප්‍රතිඵලය වූයේ ණය ගෙවාගැනීමට තරම් ආදායමක් නූපදවන සුදු අලියෙකු මට්ටමේ නැව් නැති වරායක් ඇතිවීමය.

හම්බන්තොට වරාය 2015 වර්ෂය දක්වා පාඩුව (රාජපක්ෂවරුන් නතර කරන විට) රු. මිලියන 37,186කි. එම පාඩුව දරා ගැනීමට සිදුවූයේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය ලෙස කොළඹ වරායටය. ඒ නිසා 2015 වසරේදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පාඩුව මිලියන 14,168ක් විය. (ශ්‍රී ලංකා වරාය 2013දී ලද ලාභය මිලියන 8896කි) වසරක් තුළ ශ්‍රී ලංකා වරාය මෙතරම් විශාල පාඩුවකට හේතු වූයේ, මහින්ද කයිවාරු ගැසූ අපූරු වරාය නිසාය. ඒ නිසා රනිල් විකුණුවේ තමන් හදාපු වරාය යැයි උදම් ඇනීමේ සදාචාර අයිතියක්වත් අඩු තරමේ රාජපක්ෂලාට ඇත්දැයි විමසිය යුත්තේ ජනතාවය. රනිල්ට විකිණීමට පාර කපා මඟ සකස් කරදුන්නේ මහින්ද රාජපක්ෂ පාලනය බව නම් ඉතා පැහැදිලිය.

## රනිල්ගේ විකිණීම

මහින්ද පාඩු ලැබීමට හැදූ වරාය විකුණා (ආණ්ඩුවට අනුව සාර්ථක බදු දී) නිවැරදිම තීරණය ගනු ලැබුවේ තමන් යැයි උදම් අනන රනිල් වික්‍රමසිංහ හා මෛත්‍රීපාල හවුල් ආණ්ඩුව සිදුකර ඇත්තේ, නිවැරදිව ලංකාවට වාසිදායක (අඩු තරමේ පාඩු නොවන) ගනුදෙනුවක්දැයි අප විග්‍රහ කරගත යුතුව ඇත. අක්කර 1235ක්, (වර්ග කිලෝ මීටර් 05ක්) හම්බන්තොට ඉඩම සහිත වරාය විකුණා (බදු දී) ඇත්තේ ඩොලර් බිලියන 1.2කටය. ලංකාව වසරකට ආනයනය වෙනුවෙන් වියදම් කරන ප්‍රමාණය ආසන්න වශයෙන් ඩොලර් බිලියන 20කි. (වසරකට ආනයන වියදම, වරායන් 17ක් සඳහා ලබනා විකුණුම් ආදායමට සමානය.) වසරකදී නාස්තිකාර ආනයන 20න් පංගුවක් ඉතිරි කරන වැඩපිළිවෙළක් රජයට තිබුණේ නම් අවුරුදු 99කට නැතිකරගත් වරායේ අයිතිය ලංකාවට තබා ගත හැකිව තිබුණි. තවත් විස්තර කරතොත් එම වියදම කළමනාකරණය කරගන්නේ නම් වරායට නැව් නොපැමිණියත් ණය හා පොලී වාරික ගෙවිය හැකිය.

ලංකාවේ රජය යටතේ අයිතිය කළමනාකරණය පවතින විට ලෝකයේ නැව් ලංකාවට නොපැමිණේය. එම අයිතිය චීනයට ඇති විට පමණක් නැව් පැමිණෙන්නේ යැයි ආර්ථික විද්‍යාත්මක තර්කයක් පවතින ගෝලීය ආර්ථික යථාර්ථය තුළ නොමැත. ලංකාවට නැව් පැමිණීමට නම් හම්බන්තොට වරාය චීනයට 80%ක් හිමි විය යුතුමයැයි තර්ක කරන්නේ විකිණීමට හිත හදා ගෙනමය.

එක්සත් ජාතික පක්ෂ පාලනය ඉතිහාසය තුළ අතීතයේදී ඇමතිවරුන් වැඩිම දූෂණයක් සිදු කළේ යැයි චෝදනා ලැබ ඇත්තේ කඩිනම් මහවැලි ඉදිකිරීමේදීය. අද වර්තමානයේ එම දූෂිත ඇමතිවරුන් ජීවතුන් අතර නැතත් හොරකම කළත් ජනතාවට යම් ප්‍රතිලාභයක් ලැබෙන මහවැලි වාරි පද්ධතියක් ඉතිරි වී ඇත. නමුත් හම්බන්තොට වරාය විකිණීම ඊටත් වඩා ජාතික අපරාධයක් වන්නේ, මෙම වර්තමාන දූෂිත පාලකයින් ජීවතුන් අතර සිටියදීම වරාය අයිතිය රටට ජනතාවට සම්පූර්ණයෙන්ම අහිමි වන නිසාය. ඒ නිසා ජනතාව වරාය ගැන පමණක් නොව මෙවැනි ජාතික සම්පත් අලෙවි කරන නාස්තිකාර පාලකයින් ගැනත් පාලකයින් පත්කිරීම වෙනුවෙන් තමන් (ජනතාව) කළ දේ ගැනත් නැවත සිතා බැලිය යුතුය.

> දැන් ගත් ණයට පොලිය ගෙවා ගත නොහැකිව, තවදුරටත් ණය ගත නොහැකිව හිරවූ විට කියන්නේ ණයට හිලව්වට වරාය විකුණාගැනීමට හැකිවීම ජයග්‍රහණයක් බවය. මහින්ද රාජපක්ෂ ණය ගැනීම ඔහුට අනුව ජයග්‍රහණයකි. ඒ ණය ගවා ගත නොහැකි නිසා ණය ගෙන ඉදිකළ වරාය, මත්තල ගුවන්තොටුපොළ (ඉදිරියේදී දැන් ඉදිකරන අධිවේගී මාර්ග) විකුණා ගැනීමට හැකිවීම රනිල් වික්‍රමසිංහගේ 'ජයග්‍රහණයකි'. කෙසේ නමුත් මේ ක්‍රියාවන් දෙකම රටේ පරාජයකි; ජනතාවගේ පරාජයකි.



"යුක්තිය ප්‍රතික්ෂේප කෙරෙන්නාවූද දරිද්‍රතාවය ශක්තිමත් කෙරෙන්නා වූද නූගත්කම නොනසා පවත්වා ගන්නා වූද සමාජය යනු පීඩිතයන්ට එරෙහි සංවිධානාත්මක කුමන්ත්‍රණයක් යැයි හැඟී යන්නා වූද සොරකම් කරනු ලැබෙන්නා වූද අවමානයට ලක් කෙරෙන්නා වූද පංතියක් ඇති තැනක කිසිවෙකුගේ දේපළ සුරක්ෂිත නොවන්නේය."

**ෆෙඩ්‍රික් ඩග්ලස්**

**(1818-1895)**

**ඇමරිකානු වහල්භාවයට එරෙහි සටනේ නායකයෙකි. ලේඛකයෙකි.**

# සිදුවීමකින් නිම නොවන බේදවාචකයක්...

ළමයින් මල් වැනිය. සියලු ළමුන් එක්ව මේ ලෝකය මනස්කාන්ත මල් උයනක් බවට පත් කළ හැක. එහෙත් ලෝකය එසේ වන්නේ ළමුන්ගේ අවශ්‍යතා සපුරන, ළමා අයිතීන් සුරකින, ළමුන්ට ආරක්ෂාව හා රැකවරණය තහවුරු කරන සමාජයක් ස්ථාපිතව ඇත්තේ නම් පමණය. ලෝකයේ දියුණු යැයි කියාගන්නා ධනේශ්වර රටවල පවා ළමුන්ගේ අයිතීන් කඩවුන අවස්ථා, ළමුන් ඝාතනයට ලක්වුණු අවස්ථා අපට නොයෙක්වර අසන්නට ලැබී ඇත. නොදියුණු පසුගාමී රටවල මේ තත්වය වඩාත් බරපතළ ලෙස වර්ධනය වෙමින් ඇත.

ලංකාවේ වසර ගණනාවක් තිස්සේ ළමුන්ට එරෙහිව සිදුවන අපරාධ, අපචාර සිද්ධීන් ඉහළ යමින් තිබෙන බව ආණ්ඩුවේ සංඛ්‍යාලේඛනවලින් පෙන්නුම් කරයි. ළමයෙකුගේ කැමැත්ත නැතිව හෝ ඇතිව යම් පුද්ගලයෙකු විසින් යම් ළමයෙකු අපචාරයකට පොළඹවා ගැනීම බරපතළ වරදකි. පසුගිය මාසයේ ගම්පහ දොම්පේ ප්‍රදේශයේ පාසල් යන වයසේ පසුවන බාල වයස්කාර දැරියන් ගණිකා වෘත්තියේ යොදවා ඇති බවට මාධ්‍ය වාර්තා පළ විය. මෙවැනි සිදුවීමක් වාර්තා වූ පළමු අවස්ථාව මෙය නොවූවත් මෙය සමාජය තුළ වඩාත් අවධානයට ලක්විය යුතු කාරණයකි.

දොම්පේ ප්‍රදේශයේ ගණිකා වෘත්තියේ යොදවනු ලැබ පොලීසියට හසු වූ වයස අවුරුදු 15ක් වූ දැරිය පවසා සිටියේ තමාට ඇඳුම් ගැනීමට එසේ කළ බවය. එහෙත් මෙම දැරියන්ට තම ජීවිත විනාශයට පත්වීම ගැන අවබෝධයක් නොමැත. එය අවබෝධ වනවිට ඔවුන් එයින් ගැලවීමට නොහැකි ලෙස මෙම පසුගාමී ධනේශ්වර සමාජයේ ගොදුරු බවට පත්ව අවසන්ය. ධනපති පරිභෝජනවාදී සමාජය ළමුන් පමණක් නොව වැඩිහිටියන්ද මෝහනයට, මුලාවට පත්කර හමාරය.



අප ජීවත්වන්නේ සියල්ල මුදල මත තීරණය වන පරිභෝජනවාදී සමාජයක් තුළය. වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදකයින් පාරිභෝගික අවශ්‍යතාවන්ට අනුව භාණ්ඩ නිෂ්පාදනය කරනවා වෙනුවට ඉල්ලුමක් නොමැති භාණ්ඩ විවිධ වෙළෙඳ ප්‍රචාරණ උපක්‍රමයන් මගින් පාරිභෝගිකයන්ට විකිණීමට උත්සාහ දරයි. පසුගාමී සමාජයක ජීවත්වන ජනතාවගේ සමාජ විඥානයද පසුගාමී බැවින් වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදකයන්ගේ විවිධ ගැටවලට ඔවුන් හසුව ඇත.

සාමාන්‍යයෙන් යම් පුද්ගලයකුගේ පෞරුෂත්වය ගොඩනැගෙනුයේ එම පුද්ගලයා සමාජය තුළ ක්‍රියා කරන, හැසිරෙන ආකාරය අනුවය. නමුත් වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදකයින් තමන්ගේ භාණ්ඩ (අසවල් වෙළෙඳ නාමයේ ඇඳුම් පැළඳුම්, අසවල් වෙළෙඳ නාමයේ ස්මාර්ට් දුරකතන) පරිභෝජනය මගින් පෞරුෂත්වය ගොඩ නැගෙන බව පවසන විට එය අවිචාරවත්ව පිළිගන්නා පසුගාමී සමාජ විඥානයක් සහිත ජනතාවක්ද අප රටේ වාසය කරයි. මෙය ඊට එක් උදාහරණයක් පමණි.

අප රට තුළ නිෂ්පාදන ආර්ථිකයක් නොමැති නිසා රැකියා අවස්ථාවන්ද විරලය. තරුණ ජනගහනයෙන් විශාල පිරිසක් රැකියා විරහිතය. එයින්ද වැඩි පිරිස ස්ත්‍රීන්ය. අමාරුවෙන් රැකියා අවස්ථාවක් සොයා ගත්තද ජීවත්වීමට සරිලන වැටුපක් නොලැබේ. භාණ්ඩ මිලදී ගැනීමට හැකියාවක් නොමැති ජනතාවක්, වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදකයින් විසින් බලහත්කාරයෙන් ඉල්ලුමක් ඇති කළ භාණ්ඩ මිලදී ගැනීමට මුදල් පසුපස හඹා යාමේදී බාල, තරුණ, වැඩිහිටි පරම්පරාවන් මේ ධනේශ්වර සමාජයේ ගොදුරු බවට පත්වීම වැළැක්විය නොහැක.

ඉදින්, ද්‍රව්‍යමය දේවල් පමණක් නොව ආදරය, විවාහය වැනි අධ්‍යාත්මික බැඳීම් පවා මුදල මත තීරණය වන මෙවැනි සමාජයක් තුළ මුදල් පසුපස හඹා යාමේදී වැඩි වශයෙන් එහි ගොදුරු බවට පත්වන්නේ ස්ත්‍රීන්ය. එවැනි සමාජයක් පවත්නාතාක් හෙට දවසේදීද අපට ඉහත ආකාරයේ සිදුවීම් වාර්තා වීම වළක්වාලිය නොහැකි වනු ඇත.

## පොත් අස්වැන්න

**කටුක සැප්තැම්බරය සිඳලා**
**සහිත මාරුත හමාලා**
**හිතේ දාහය නිවාලනු ඇත**
**හිඳින්නෙමු අපි මඟ බලා**

**වියළි ගම්බිම් සිසාරා යන**
**සහිත ගඟුලැලි ගලාවී**
**මඳක් නවතිනු, එයින් දෝතක්**
**සා පිපාසා නිවාවී**

**මතක් කර එක් දිනක් කැපකර**
**පොත් සයුර තුළ කිමිදිලා**
**බලමු පතුලෙහි නොදුටු ලෝකය**
**මොන තරම් සොඳුරුද කියා**

**සිතක් ඇත්නම් පොතක් ගන්නට**
**අලුත් ලොව කියවනු සිතා**
**නෙතක් හිම්වුන සේ හැඟෙනු ඇත**
**තවත් කුමටද වනු පමා**

**කුළක් වුව සරු බිමක් කළ හැකි**
**තැතක් අප තුළ ඇති නිසා**
**පොතක් ගෙන එක් මිටක් වපුරා**
**නෙළමු අස්වනු අතු පුරා**

> **ඔබට සතුටින් ජීවත් වීමට අවශ්‍ය නම් ජීවිතය මිනිසුන් හෝ දේවල් මත නොව අරමුණක් සමග ගැට ගසන්න.**
>
> **ඇල්බට් අයින්ස්ටයින්**

## කියවා ගත යුතු සාහිත්‍ය මාසය

සාහිත්‍ය යන්නෙන් අර්ථ ගැන්වෙන්නේ 'සහිත බව' යන්නයි. අර්ථ පූර්ණ සාහිත්‍ය කෘති ජීවිතේ සෑම පැතිකඩක්ම විවරණය කරයි. එය මිනිසාට නැවත නැවතත් තමන්ගේ ජීවිතය දෙස හැරී බැලීමට අවස්ථාව ලබාදේ. එයින් ජීවිතයේ අධ්‍යාත්මය පොහොසත් කරයි. යහපත් ලෙස සිතන්නට පොළඹවයි.

දරුවන් නළවන දෑත සාහිත්‍යය පරිහරණය කරන විට ඇය පමණක් නොව අනාගත පරම්පරාවද වඩා නිවැරදි දැක්මකින් කටයුතු කිරීමට, මෙහෙයවීමට ඉඩ ප්‍රස්ථාව ලබාදෙයි.

දරුවන් ඇති දැඩි වෙන්නේ මවගේ ඇසුරේ හිඳිමින්ය. ඇය සිතන්නේ තමන් ලද අත්දැකීම් අනුවය. දරුවාට දක්වන සෙනෙහස, දයාව, කරුණාව, යම් ගැටලුවකදී විචාරශීලිබව උසස් මට්ටමක පවතින්නේ ඇගේ සිතීමේ පොහොසත් බව අනුවය. මව එය ලබන්නේ එදිනෙදා සමාජයෙන් මෙන්ම ඇගේ අධ්‍යාපනය හා හැදෑරූ පත පොතද උදව්වෙනි.

ඒ නිසා සාහිත්‍ය කෘති ඇසුරු කළ මවකගේ දරුවන් තුළ දියුණු මතයන්, දැක්මක් මෙන්ම මවට, පියාට, සමාජයට ආදරය, රටට ආදරය කිරීමේ හැකියාව වැඩිවේ.

එහෙත් 77න් ඇරඹි සමාජ පෙරළියෙන් සමාජය උඩු යටිකුරු වුණි. ඇය සාහිත්‍යයෙන් ඈත් වුණි. සාහිත්‍යය ඇගෙන් ඈත් කෙරුණි. හරසුන් දෙය ඇගේද ජීවිතේ විය. ධනවාදයේ අනිවාර්යයක් වූ පරිභෝජනවාදී සමාජයේ කොටස්කාරියක් බවට වැඩියෙන්ම අද පත්ව ඇත්තේ ස්ත්‍රීන්ය. කිසිදු හිරිකිතයකින් තොරව භාණ්ඩ වෙළඳපොළේ කොටස්කාරියන් බවටද පත්ව ඇත. එතෙකින් නොනැවතී දරුවන්ද එතැනට තල්ලුකර දමා ඇත.

ඉතින් ඇයට සයිටම් ප්‍රශ්නයක් නොවේ. කුණු කඳු කීයක් නාය ගියත් කම් නැත. උමා ඔයට බිලිවෙන ගෙවල් හා මිනිසුන් ප්‍රශ්නයක් නොවේ. රටට කුමක් සිදුවුවද කම් නැත. තමන්ද එහි කොතැනක හෝ විපතට පත්වන බවට වගක් නැත.

මෙවැනි තත්වයක් තුළ 2017 සාහිත්‍ය මාසය ඇරඹේ. සුපුරුදු පරිදි පොත් ප්‍රදර්ශන කානිවල් බවට පත්කර ඇත. සමාජයට හරවත් දෙයක් ලබාදීමේ මූලික ඉලක්කය වෙනුවට සිදුවන්නේ මුදල් ඉපයීමය. එබැවින් නැවත මිනිසුන්ට සිතීමට නව දැක්මක්, නව දෑස් ලබාදීම අවශ්‍යව ඇත. එය පැවති, පවතින ආණ්ඩුවලින් බලාපොරොත්තු විය නොහැක. ඒ සඳහා රටට ආදරය කරන සියලුදෙනා නව සමාජයක් උදෙසා පෙළ ගැසිය යුතුය. එහිදී ස්ත්‍රීන් එහි ඉදිරියෙන්ම ගමන් කළ යුතුය.



# වෙනස්වීමට බිය මිනිසා!



අප ජීවත්වන වත්මන් සමාජය මිනිසුන්ට ජීවත්වීමට නොහැකි තරමින් පිරිහීමට ලක්ව ඇත. අර්බුදයට ගොස් ඇත. මෙම පිරිහුණු අසාධාරණ සමාජය වෙනස්කර වඩා හොඳ නව සමාජයක් සෑදිය යුතුය. ඒ සඳහා උත්සාහ දරන අයද සිටිති. එහෙත් ලෝකය තවම පැරණි මඟෙහිම ගමන් කරයි. ඒ, ඇයි? වත්මන් සමාජයේ හිමිකරුවන් වන ධනවාදීන් මෙම සමාජය මෙලෙසම පවත්වාගෙන යාමට විවිධ උපක්‍රම මගින් විවිධ ආයතන උපයෝගී කර ගෙන ක්‍රියාත්මක වේ. ඒ, එක් හේතුවකි. අනෙක් හේතුව නම් වෙනස් වීමට මිනිසා පොදුවේ දක්වන අකමැත්ත හා බියයි. සමාජය වෙනස් කිරීමට නම් ඊට පෙර බහුතරයක් ජනතාව සිතන ආකාරය, තීරණ ගන්නා ආකාරය වෙනස්කර ගත යුතු වේ. එහෙත් එයට බොහෝ මිනිසුන් කැමැති නැත. ඒ, ඇයි?



"මිනිසුන් රැවටී ඇති බව ඔවුන්ට තේරුම් කිරීමට වඩා මිනිසුන්ව රැවටීම පහසුය."

**මාක් ට්වේන්**

### ගතානුගතික වීම හා නොවීම

අප ජීවත්වන මානව සමාජය ප්‍රගතිය කරා ඉදිරියට ගොස් ඇත්තේ, සම්ප්‍රදායට කොටුනොවී වෙනස් ලෙස සිතූ මිනිසුන් නිසාය. එහෙත් බහුතරය එසේ නොවේ. ඔවුහු සම්ප්‍රදායේ සිරකරුවන් වන අතර ගතානුගතිකත්වයේ වහල්ලු ලෙස ජීවත්වෙති. ලෝකයේ ප්‍රගතිය සඳහා දායකවූ වෙනස්ව සිතූ මිනිසුන් රැසක් අතර ගැලිලියෝ කවුරුත් දන්නා කෙනෙකි. ගැලිලියෝ වෙනස්ව සිතුවද පොදු ජනතාව එලෙස සිතුවේ නැත. ඔවුහු පල්ලියේ ඉගැන්වීම්වලින් හා ආගමික මතවාදයෙන් වෙනස්ව සිතීමට සූදානම් නොවූහ. ඒ, නිසා ගැලිලියෝට බොහෝ දුක්කරදරවලට මුහුණ දීමට සිදුවිය. ඉතාලි ජාතික බෘනෝද එලෙස වෙනස්ව සිතූ හා වෙනස්ව මත පළ කළ කෙනෙකි. එහෙත් බහුතර ජනයා එලෙස නොසිතූ නිසා ඔහුට පල්ලියේ තීරණය හමුවේ ජීවිතයෙන් වන්දි ගෙවීමට සිදුවිය. අයිසෙක් නිව්ටන්, අයින්ස්ටයින්, කාල්මාක්ස් හා එංගල්ස් එලෙස වෙනස්ව සිතූ හා සමාජ ප්‍රගතිය වෙනුවෙන් දැවැන්ත මෙහෙයක් කළ අය වූහ. වඩා හොඳ සමාජයක් නිර්මාණය කර ගැනීම සඳහා මාක්ස් - එංගල්ස් ඉගැන්වූ ඉගැන්වීම් ලොව පීඩාවට පත් බහුතරය තවම පිළිගන්නේ නැත. තම පැරණි චින්තනයේ සිරගෙයින් මිදීමට ඔවුන්ට නොහැකිවී ඇත. ඒ, මිනිසා තුළ ස්වභාවයෙන්ම සම්ප්‍රදායට සිරවන හා ගතානුගතිකත්වයට කැමති ස්වභාවයක් පවතින නිසාය.

මිනිසා හෝ මිනිස් සමාජය වෙනස් නොවීම පවතින්නේ නැත. එහෙත් පොදුවේ මිනිසුන් වෙනස් වන්නේ, එක්කෝ බොහෝ කාලයක් ගෙන ඉතා සෙමින් ක්‍රමිකවය; නැතිනම් මිනිසාගේ පීඩාව දරාගත නොහැකි මට්ටමකට පැමිණ එය පුපුරා යන විට හා මිනිසා වෙනස් කිරීමට තරම් බලවත් මිනිස් මැදිහත්වීමක් පිටතින් සිදුවන විටය. එතෙක් මිනිසුන් වෙනස් වීමටද බියේ සිටිති. වෙනස් වීමට හෝ වෙනස් කිරීමට යාම නැති කරදර ඇතිකර ගැනීමක් ලෙස සලකති.

### ගෝර්කිට අනුව

වෙනස්වීමට අකමැති මිනිසාගේ මෙම සමාජමය ස්වභාවය මැක්සිම් ගෝර්කි සිය 'අම්මා' නම් සුප්‍රසිද්ධ නවකථාවේ ආරම්භයේදීම විස්තර කර තිබේ. එය ගෝර්කිගේ වචනවලින්ම සඳහන් කරන්නේ නම් මෙසේය. පසුගාමී ධනවාදය තුළ දේවල් සිදුවන ආකාරය හා මිනිසුන් සිතන ආකාරය ගෝර්කි මෙලෙස සඳහන් කරයි.

"එකිනෙකා අතර තිබූ සබඳකම් කෝපයෙන් හා කුහකකමින් පිරී පැවති අතර එයද සුවකළ නොහැකි රෝගයක් සේ නිදන් ගත විය. කෝපය හා ක්‍රෝධය නැමැති රෝගයත් සමගම උපන් මිනිස්සු එය පිය පුතු පරම්පරාවෙන් ලැබූ දායාදයක් කර ගත්තෝය."

> මිනිසා හෝ මිනිස් සමාජය වෙනස් නොවීම පවතින්නේ නැත. එහෙත් පොදුවේ මිනිසුන් වෙනස් වන්නේ, එක්කෝ බොහෝ කාලයක් ගෙන ඉතා සෙමින් ක්‍රමිකවය; නැතිනම් මිනිසාගේ පීඩාව දරාගත නොහැකි මට්ටමකට පැමිණ එය පුපුරා යන විට හා මිනිසා වෙනස් කිරීමට තරම් බලවත් මිනිස් මැදිහත්වීමක් පිටතින් සිදුවන විටය. එතෙක් මිනිසුන් වෙනස් වීමටද බියේ සිටිති. වෙනස් වීමට හෝ වෙනස් කිරීමට යාම නැති කරදර ඇතිකර ගැනීමක් ලෙස සලකති.

එම සමාජයේ මිනිසුන් සිතන හැටි ගෝර්කි සඳහන් කරන්නේ මෙසේය. "ජීවිතයේ හැටි ඔහොම තමයි. සෙමෙන් ගලායන මඩගොහොරු මුසු දියකඳක් සේ ජීවිතය අවුරුදු එකතු කරමින් කොහේදෝ සෙමෙන් සෙමෙන් ගලා බසී. එය දිනපතාම එකම දෙයක් කිරීමටත්, එකම දෙයක් ගැන කල්පනා කිරීමටත්, එකිනෙකට දැඩි ලෙස වෙළුණු පැරණි පුරුද්දක් ලෙස පැවතිණි. මේ ක්‍රියාදාමය වෙනස් කිරීම සඳහා කිසිවෙක් ඉදිරිපත් නොවූහ. නොපැතූහ."

එහෙත් මෙම තත්වය වටහාගෙන ජීවිතයේ වෙනසක් කිරීමට කිසිවෙකු ඉදිරිපත්වූ විට මිනිසුන් හැසිරෙන්නේ කෙසේද යන්න ගෝර්කි දකින්නේ මෙසේය. "තමන්ගේ අමිහිරි දුක්බර එහෙත් නිසොල්මන් දිවිපෙවෙත නැතිකර දමනු වස් අර මිනිසා මොනවා හෝ කරතියි ඔවුහු බියපත් වෙති. ජීවිතය හැමදාම එකලෙස තමන්ට පීඩාකරන්නේ යැයි සිතන මිනිස්සු, එය හොඳ අතට හැරෙතැයි කිසිදිනක කල්පනා නොකරන අතර, ඇතිවන වෙනස්වීම්වල එකම විපාකය මර්දනය වැඩිවීම යයි සිතති"

1880 - 1900 දශකයේ රුසියාවේ මිනිසුන් සිතූ ආකාරයත් අද අපේ රටවල පීඩිත පොදු ජනතාව සිතන ආකාරයත් එතරම් වෙනස් නැති බව ඉතා පැහැදිලිය. ඒ මිනිසාගේ චින්තනය වහල්භාවයටත් ගතානුගතිකභාවයටත් සියවස් ගණනක් තිස්සේ ගොදුරු කරනු ලැබ තිබූ නිසාය.

### යකඩ දම්වැල් පැණි රස වූ විට

මිනිසුන්ගේ මෙම ස්වභාවය වාසිදායක වන්නේ, ධනවාදයටත් ඉන් යැපෙන බලවේගයන්ටත්ය. ඒ නිසාම ධනවාදය තුළ මෙම මිනිස් ස්වභාවය සාධාරණය කරන විවිධ යෙදුම් හා කියමන්ද නිර්මාණ කරනු ලැබ තිබේ. "නොදන්නා දෙවියන්ට වඩා දන්නා යකා හොඳය" යන කියමන එවැන්නකි. වෙනස් අත්දැකීමකට මුහුණදීමට ඇති බිය හා අකමැත්ත ඒ තුළ ගැබ්ව ඇත. "නුපුරුදු දීගෙට වඩා පුරුදු කනවැන්දුම හොඳය" යන කියමන තුළද මේ අදහස තිබේ. මෙවැනි වර්ගයේ ආප්තෝපදේශ ඕනෑ තරම් අපේ ජනශ්‍රැතිය තුළ ඇත. ඒවා සකසා තිබෙන්නේ, මිනිසාගේ මෙම දුබලතාවය සාධාරණය කර ගැනීම සඳහාය. මිනිසුන් එකම දේකට හුරුවූ විට ඊට ඇබ්බැහි වන ස්වභාවයක් තිබේ. මෙම ඇබ්බැහිවීම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම, එකම ජීවන රටාවකට, චර්යාවකට ඇබ්බැහිවීමේ සිට පීඩාවට අබ්බැහිවීම දක්වා සිදුවේ. "කාලයක් යනකොට යකඩ දම්වැල් පැණි රස වන්නේය"යි කියමනක් තිබෙන්නේද මෙම තත්වය තේරුම් ගැනීම සඳහාය. මෙයට සරල උදාහරණයක් ගන්නේ නම් යාචකයන්ගේ ජීවිතය ගතහැක. මිනිසෙක් යාචකයෙක් වන්නේ සමාජය තුළ ඔහු මුහුණ දෙන තත්වයන්ට, සමාජ කොන්දේසිවලට අනුවය. කිසිවකු යාචකයකු වීමට කැමැති නැත. එහෙත් යාචකයෙක් වී කාලයක් ගියවිට ඔහුට ඉන්මිදීමට නොහැක. එය හරියටම මත්ද්‍රව්‍යයට ඇබ්බැහිවීම වැනිය. යාචකයන් පුනරුත්ථාපනය කර සාමාන්‍ය සමාජයට මුදාහැරීමට උත්සාහ කරන විට ඔවුන් පුනරුත්ථාපන කටයුතුවලින් පලාගොස් යළි යාචක වෘත්තියේ යෙදෙන අවස්ථා බොහෝ තිබේ. ගණිකා වෘත්තියට ද මෙය තරමක් අදාළය. මුඩුක්කු පරිසරයක ජීවත්වන මිනිසුන් ඉන් ඉවත් කිරීමට උත්සාහ දැරීමේදීද මෙම අභියෝගය මතුවේ.

මෙම සරල උදාහරණ මෙන්ම සමාජයේ පොදු උදාහරණ හා දේශපාලනයේ උදාහරණවලින් තහවුරු කිරීමට අප උත්සාහ කරන්නේ, මිනිසුන් වෙනස් කිරීමට නොහැකි වෙනස් නොවන වර්ගයක් බව නොවේ. එහෙත් මිනිසාගේ බහුතරය වෙනස් කිරීම ඉතා දුෂ්කර කාර්යයක් බවය. ඒ, ඔවුන් තමා ජීවත්වන පරිසරයට, රටාවට හා එම රටාව සාධාරණීකරණය කරන මතවාදයන්ට ගොදුරුවී ඊට ඇබ්බැහි වන නිසාත් ස්වභාවයෙන්ම ගතානුගතික ලක්ෂණ ඔවුන් තුළ පිහිටන නිසාත්ය. එය සමාජ සංවර්ධනයට, සමාජයේ ප්‍රගතියට විශාල බාධාවක් වන අතර ජීවිතය වඩා යහපත් කර ගත හැකිව තිබියදී ජීවිතය වඩා යහපත් කර ගැනීමේ පැහැදිලි විද්‍යාත්මක මාර්ගයක් තිබියදී ඊට බියවන මිනිසා තම දුක්බර එහෙත් නිසොල්මන් ජීවිතයට අබ්බැහි වී එය වෙනස් කර ගැනීම සඳහා වෙනස් නොවීම බේදවාචයක් වේ.

මෙම තත්වය නිසා සමාජය වෙනස් කිරීමට වෙහෙසෙන අය හෝ සංවිධාන බලාපොරොත්තු කඩකර ගැනීම හෝ මිනිසාට දොස් පැවැරීම කළ යුතු නොවේ. සමාජය වෙනස් කිරීමට මඟ පෙන්වන ඊට නායකත්වය දෙන අය කළ යුත්තේ මිනිසාගේ මෙම පොදු ස්වභාවය හඳුනා ගැනීමත් මිනිසාට වෙනස් වීමට බල කරන සමාජීය තත්වයන් හා සාධක හඳුනාගෙන එයට අනුව ක්‍රියාත්මක වීමත් මිනිසා ගතානුගතිකත්වයේන් මුදාගැනීමට තරම් සමත් බලයක් මතවාදීවත් සංවිධානාත්මකවත් බාහිරින් මිනිසා වෙත යෙදීමත්ය. මන්ද ලෝකයේ වෙනස් නොවන, වෙනස් කළ නොහැකි කිසිවක් නොමැති නිසාය.

# මහඉලුප්පල්ලම ගොවිපළත් බීජ අයිතියත් විදේශ සමාගමකට?

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පවතින බීජ පර්යේෂණ ආයතන අතර ප්‍රධාන බීජ නිෂ්පාදන ගොවිපළක් ලෙස මහඉලුප්පල්ලම ගොවිපළ රට තුළ ඉතා ප්‍රචලිතය. එහි ප්‍රධාන අරමුණ වන්නේ, නව බීජ ප්‍රභේද පිළිබඳව පර්යේෂණ පැවැත්වීම, විශේෂයෙන් වියළි කලාපයට අදාළ වී ප්‍රභේද, පලතුරු, එළවළු, ධාන්‍ය වර්ග පිළිබඳ පර්යේෂණ පවත්වා නව බීජ ප්‍රභේදයන් සම්බන්ධ මූලික බීජ නිෂ්පාදනය, පලිබෝධනාශක පිළිබඳ පර්යේෂණයන් පස් පරීක්ෂණය සහ ගොවීන් පුහුණු කිරීමේ වැඩසටහන් යනාදී සිදු කිරීමය.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ එප්පාවල නගරයට ආසන්නව පිහිටා ඇති අක්කර 1000ක පමණ වපසරියකින් යුත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හදවත බඳු මෙම ගොවිපළ යටතට අගුණකොලපැලැස්ස, අරලගංවිල, කිලිනොච්චිය යන බීජ පර්යේෂණ හා නිෂ්පාදන ගොවිපලවල් අයත් වේ. මහඉලුප්පල්ලම බීජ පර්යේෂණ ගොවිපළ තුළ වී, මිරිස්, එළු, බඩඉරිඟු, මුං කව්පි, සෝයා, රටකජු යනාදිය සම්බන්ධ පර්යේෂණ පවත්වමින් මූලික බීජ නිෂ්පාදනය කරනු ලැබේ. බීජ පර්යේෂණ අංශය හා බීජ නිෂ්පාදන අංශය සහ යාන්ත්‍රික අංශයකින් සමන්විත මෙම ගොවිපළ මගින් හඳුන්වා දුන් බීජ ප්‍රභේද අතර MI-1 , MI-2 මිරිස් බීජ ප්‍රභේදය මිරිස් ගොවීන් අතර ඉතා දීර්ඝ කාලයක සිට ප්‍රචලිතය.

ශ්‍රී ලංකාවේ බිත්තර වී නිෂ්පාදනයෙන් 70%ක් ගොවීන් විසින්ම නිෂ්පාදනය කර ගන්නා අතර 20% ප්‍රමාණයක් නිෂ්පාදනය කරනු ලබන්නේ දේශීය සමාගම් විසිනි . තවත් 10%ක ප්‍රතිශතයක් කෘෂි පර්යේෂණ ගොවිපළ සහ ඊට අනුබද්ධ බිත්තර වී නිෂ්පාදන ගොවි සමිති මගින් සිදු කෙරේ. එළවළු බීජ නිෂ්පාදනයෙන් 40% ආසන්න ප්‍රමාණයක් ගොවීන් විසින්ම නිෂ්පාදනය කරගන්නා අතර 60%ක බීජ නිෂ්පාදන ප්‍රමාණය දේශීය එළවළු බීජ නිෂ්පාදකයින් දස දහසක (10,000) පමණ පිරිසක් විසින් සිදු කරන බව වාර්තා වේ. මේ සියලු කරුණුවලින් පැහැදිලි වන්නේ ඉතා උසස් තත්වයේ බීජ ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කර ගැනීමේ හැකියාව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් බීජ පර්යේෂණ ගොවිපළ සතුව පවතින බවයි.

නිදසුනක් ලෙස මෑතකදී MI-6 නැමැති දෙමුහුන් මිරිස් බීජ

LAL TEER SEED LIMITED
(First Research Based Seed Company in Bangladesh)





ප්‍රභේදනය නිෂ්පාදනය කර ඇති අතර, එය විදේශීයව ආනයනය කරනු ලබන දෙමුහුන් මිරිස් බීජවලට වඩා ශ්‍රී ලංකාවට යෝග්‍ය සහ අස්වැන්න අතින් ඉතා ඉහළ ප්‍රභේදයක් බව අනාවරණය වේ.

තත්වය මෙසේ තිබියදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතු මහඉලුප්පල්ලම බීජ පර්යේෂණ ගොවිපළෙහි කොටසකුත් බීජ නිෂ්පාදනයත් විදේශ සමාගමකට ලබා දීමට ආණ්ඩුව පිඹුරුපත් සකස් කරමින් සිටී.

ශ්‍රී ලංකාවේ බීජ පර්යේෂණ ගොවිපළ ක්ෂේත්‍රගත පර්යේෂණයන්හි යෙදී සිටින කෘෂි විද්‍යාඥයින්ට සහ පර්යේෂකයන්ට අවශ්‍ය පහසුකම් සහ මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් පරිදි ලබාදෙන්නේ නම් ශ්‍රී ලංකාවේ වඩාත් සුදුසු දෙමුහුන් බීජ ප්‍රභේදයන් නිෂ්පාදනය කිරීමේ හැකියාව පවතී. දැනට ශ්‍රී ලංකාවට පෞද්ගලික අංශ විසින් දෙමුහුන් බීජ ආනයනය කිරීමේදී ශාක නිරෝධායන පනත යටතේ සිදු කරනු ලබන අධීක්ෂණය හැරුණු කොට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් හෝ වෙනත් ආයතනයක් විසින් කිසිදු සොයා බැලීමක් සිදු නොවේ.

ශ්‍රී ලංකාව සතු දේශීය බීජ වර්ග සහ ඒ ආශ්‍රිතව දියුණු කරන ලද වෙනත් බීජ ප්‍රභේදයන් සහ බීජ ජාන සම්පත රැකගැනීමත් රජය සතු ප්‍රබල වගකීමක් වේ. එහෙත් කෘෂි කර්මාන්තය ක්‍රමිකව වානිජකරණය කිරීමත් රටේ ජනගහනයෙන් 80%කගේ ජීවනෝපාය මාර්ගයන් නිර්මාණය කරන කෘෂි ක්ෂේත්‍රයෙන් රජය ක්‍රමිකව ඉවත්වීම සනාථ කරමින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මහඉලුප්පල්ලම බීජ පර්යේෂණ ආයතනය සතු අක්කර 300ක පමණ භූමිභාගයක් සහ බීජ නිෂ්පාදන අයිතිය බංගලිදේශයේ ලාල් ටීර් සීඩ් ලිමිටඩ් (Lal Teer Seed Limited) සමාගම වෙත ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා ගෙන ඇති බව අනාවරණය වේ.

වත්මන් රජය වරාය, තෙල් ටැංකි, ධීවර වරායන් විදේශීය සමාගම්වලට විකුණා දැම්මට අවශ්‍ය මූලික පියවර ගෙන ඇතිවා සේම ආණ්ඩුව රටේ ජාතික සම්පතක් වූ බීජ නිෂ්පාදනය විදේශීය සමාගමකට විකුණා දැමීමේ සැලැස්මක නිරත වෙමින් සිටී. ඒ සඳහා මේ වන විට අභිමතය ප්‍රකාශ කිරීමේ ලියවිල්ලකට අත්සන් කර ඇති බවද වාර්තා වේ. ජාන සම්පත් මංකොල්ලය ලෝකයේ විශාල වශයෙන් සිදුවෙමින් පවතින අවස්ථාවක අපගේ දේශීය බීජ ජාන සම්පත්ද මෙමගින් හෙළනු ඇත්තේ බලවත් අනතුරකය.

කෘෂිකර්ම දෙපාර්තමේන්තු බලධාරීන් සඳහන් කරනුයේ, ගොවීන් අතර ඉතා ජනප්‍රිය විදේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලබන දෙමුහුන් බීජ මෙරටට ආනයනය කර බෙදා හැරීමේ සමාගම් ඉතා ඉහළ මිල ගණන් යටතේ අලෙවි කරන බැවින් අදාළ බංගලිදේශ සමාගමේ බීජ නිෂ්පාදනයන් සමඟ අඩු මිලට ගොවීන්ට හයිබ්‍රිඩ් බීජ ලබාදීමට ඉඩකඩ සැලසෙන බවය.

> “වත්මන් රජය වරාය, තෙල් ටැංකි, ධීවර වරායන් විදේශීය සමාගම්වලට විකුණා දැම්මට අවශ්‍ය මූලික පියවර ගෙන ඇතිවා සේම ආණ්ඩුව රටේ ජාතික සම්පතක් වූ බීජ නිෂ්පාදනය විදේශීය සමාගමකට විකුණා දැමීමේ සැලැස්මක නිරත වෙමින් සිටී. ඒ සඳහා මේ වන විට අභිමතය ප්‍රකාශ කිරීමේ ලියවිල්ලකට අත්සන් කර ඇති බවද වාර්තා වේ. ජාන සම්පත් මංකොල්ලය ලෝකයේ විශාල වශයෙන් සිදුවෙමින් පවතින අවස්ථාවක අපගේ දේශීය බීජ ජාන සම්පත්ද මෙමගින් හෙළනු ඇත්තේ බලවත් අනතුරකය.”

එය කිසිසේත්ම යථාර්ථයක් විය නොහැක්කේ, ප්‍රධාන පෙළේ සමාගම් තරඟකාරී ලෙස හයිබ්‍රිඩ් බීජ මෙරටට ගෙන්වා ගොවීන් අතර අලෙවිකරමින් සිටීමය. බංගලිදේශයේ Lal Teer Seed Limited වැනි සමාගමක් එවැනි තත්වයක් තුළ අඩු මිල ගණන් යටතේ හයිබ්‍රිඩ් බීජ ලබාදේයැයි කිසිසේත් උපකල්පනය කළ නොහැක. එසේම අත්සන් කර ඇති අවබෝධතා ගිවිසුම (MOU) තුළද එවැන්නක් සඳහන් නොවේ.

මේ සියල්ල තුළ සැඟවී ඇති කාරණය වන්නේ, බංගලිදේශයේ Lal Teer Seed Limited මේ සඳහා තෝරා ගත්තේ කෙසේද යන්නයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තු ආරංචි මාර්ග සඳහන් කරන්නේ, කිසිදු ප්‍රසම්පාදන ක්‍රියාමාර්ගයක් අනුගමනය නොකර ජපානය, තායිලන්තය වැනි හයිබ්‍රිඩ් බීජ නිෂ්පාදනයේ ප්‍රමුඛ ස්ථානයේ සිටින රටවල සමාගමකට අවස්ථාව නොදී අදාළ සමාගම තෝරා ගෙන ඇති බවය. එසේම අදාළ සමාගමට බීජ නිෂ්පාදනය, බීජ විදේශ වෙළඳපළට අපනයනය කිරීම මෙන්ම බීජ ආනයනය කිරීමේ අයිතියද ලබා දීමට එකඟ වී ඇත. එයද පරස්පර විරෝධී තත්වයකි. බංගලිදේශයේ Lal Teer Seed Limited සමාගම සමඟ අත්සන් කර ඇති අවබෝධතා ගිවිසුම තුළ බොහෝ කොන්දේසි ඇතුලත්ව නැත. ඊට හේතු වන්නේ, එය අභිමතය ප්‍රකාශ කිරීමේ ලියවිල්ලක් පමණක් බැවිනි. කෙසේ වුවද අහිතකර බොහෝ කොන්දේසි ඇතුලත් විය හැක්කේ අවසන් කෙටුම්පතෙහිය.

වත්මන් රජය දේශීය කෘෂිකර්මාන්තය සංවර්ධනය අතහැර දමා අතිවිශාල විදේශ විනිමය ප්‍රමාණයක් යොදා ගනිමින් මෙරට තුළ නිපදවාගත හැකි කෘෂිකර්මික නිෂ්පාදන ආනයන කිරීම තුළින් කෘෂිකර්මාන්තය බිඳවැටීමට ඉඩ සලස්වා ඇති අතර මෙසේ බීජ නිෂ්පාදන අයිතිය විදේශීය සමාගමකට පැවරීම එහි තවත් එක් දිගුවක් පමණි. 2017 වර්ෂය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් හයිබ්‍රිඩ් බීජ නිෂ්පාදනය හා ඊට අදාළ පර්යේෂණ සඳහා ඉල්ලා සිටින ලද ප්‍රාග්ධන වියදම් කපාහැර තිබීම තුළින්ද මෙය තවදුරටත් තහවුරු වේ.

ශ්‍රී ලංකාව තුළ පසුගිය මහින්ද රාජපක්ෂ රජය යටතේ ක්‍රියාත්මක කළ මහා පරිමාණ ව්‍යාපෘති තුළ මෙන්ම විදේශිකයන්ට ඉඩම් පැවරීමේදීද කොමිස්, අල්ලස්, දූෂණ විශාල වශයෙන් පැවති අතර වත්මන් රජය යටතේද එය එලෙසින්ම ක්‍රියාත්මක වන බව කිසිදු ප්‍රසම්පාදන ක්‍රියාමාර්ගයකින් තොරව මෙම සමාගම තෝරා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදීමෙන් පැහැදිලි වේ.

අවසානයේ සිදුවිය හැක්කේ, පොළොන්නරුව, පැල්වැහැර වැනි කෘෂිකාර්මික ගොවිපළ පෞද්ගලික අංශයට ලබා දුන්නා සේම මහා ඉලුප්පල්ලම ගොවිපළද විදේශීය සමාගමක් යටතට පත් කිරීමට පාර කැපීමය. ඒ හෙරෙන්නට මෙමගින් ගොවිජනතාවට අත්වන වෙනත් සෙතක් නොමැත.

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස් වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

2017 අගෝස්තු 08

# නිසි වැඩපිළිවෙළක් නොමැතිවීම නිසා වෘත්තීය පුහුණු ආයතන පද්ධතිය බිඳවැටී තිබෙනවා

පාර්ලිමේන්තු මන්ත්‍රී

## බිමල් රත්නායක සහෝදරයා

අද පනත් කෙටුම්පත් දෙකක් විවාදයට ලක් කරනවා. එකක් ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය පනත් කෙටුම්පත. අනෙක් එක, සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත. මම මුලින්ම කැමැතියි, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයට අදාළව කරුණු දෙකක් මතු කරන්න. එකක් තමයි, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයට සම්බන්ධ කරුණ. ඔබතුමා දන්නවා, අපේ රටේ තරුණ, තරුණියන්ට සැලකිය යුතු ඉහළ මට්ටමක වෘත්තීය පුහුණුවක් ලැබෙන, කාලයක් තිස්සේ පවත්වාගෙන යන ආයතනයක් තමයි ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය කියලා. අපිත් ඒක පැහැදිලිව දකිනවා. ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ රජයේ ආයතන ගොඩක නම් දාලා නැහැ.

අපි ගොඩක් මහන්සි වෙලා තමයි ප්‍රතිපත්ති ප්‍රකාශනයක් හදන්නේ. ඒක මැතිවරණයට දාන බොරුවක් නොවෙයි. දිගු කාලීනව අපි ඒක පාවිච්චි කරනවා. අපි එහි සඳහන් කරපු ප්‍රධාන ආයතනයක් තමයි ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය. එය, අපේ රටට යම් කිසි පිළිගැනීමක් ලැබෙන, පිළිගන්න පුළුවන් වෘත්තීය පුහුණුවක් ලැබෙන ආයතන අතළොස්සෙන් එකක්.

මගේ දැනීමේ හැටියට ආණ්ඩුව කිලිනොච්චියේ ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ ශාඛාවක් ආරම්භ කරන්න යෝජනාවක් කරලා තිබුණා. මට අවබෝධයක් නැහැ. ඒකේ දැනට තිබෙන මට්ටම කුමක්ද කියලා. ඒ ආයතනයේ පරිපාලනය බිඳ වැටීම පිළිබඳව අවුරුදු ගණනාවක් තිස්සේ එහි ආචාර්ය මණ්ඩලය විසින් හැම කෙනාටම පැමිණිලි කරලා තිබෙනවා. අපිටත් පැමිණිලි කරලා තිබෙනවා.

මේ ආයතනය ව්‍යාප්ත කරන්න කියා අප යෝජනා කරනවා. කිලිනොච්චියේ පමණක් නොවෙයි, මේ වාගේ ආයතන හම්බන්තොට, මොණරාගල වැනි දිස්ත්‍රික්කවලත් ඇති කරනවා නම් හොඳයි. මෙවැනි ආයතන රාශියක් කොළඹට අවශ්‍ය නැහැ. ග්‍රාමීය ප්‍රදේශවලට මෙම ආයතනය ගෙන යන්න ඕනෑ. සමහර අය තුළ මතයක් තිබෙනවා. සාමාන්‍යයෙන් Ceylon German Technical Institute එකේ



Certificate එක කියා කියන්නේ, Australian Visa එකට තිබෙන එක ප්‍රධාන සුදුසුකමක් කියලා. අතීතයේදී මෙම ආයතනයේ එවැනි මට්ටමක් ගොඩනැගිලා තිබුණා. නමුත්, පසු කාලයක විශේෂයෙන්ම පසුගිය අවුරුදු ගණනාව ඇතුළත - මේ ආයතනයේ පරිපාලනය ඉතාම දරුණු ලෙස බිඳ වැටුණා. ඒ දූෂිත පරිපාලනයේ තිබෙන ප්‍රශ්නවලට මැදිහත් වෙන්න කියමින් එහි ආචාර්ය මණ්ඩලය කීප වතාවක් අප මුණ ගැසුණා. නමුත්, වගකීම් භාරගත් ඇමතිවරු ඒ ගැන කිසිම ආකාරයකින් උනන්දුවක් දැක්වූයේ නැහැ. කලින් සිටි ඇමතිවරයා වුණත් යම් යම් පියවර නොගත්තා නොවෙයි. නමුත්, පරිපාලනය නිවැරදි කරන්න උනන්දුවක් තිබුණේ නැහැ. කලින් සිටි ඇමතිවරයා සහ ඒ සමග සිටි රාජ්‍ය ඇමතිවරයා අතර ලොකු රණ්ඩුවකුත් තිබුණා. එම නිසා මේ වෘත්තීය පුහුණු ආයතන පද්ධතිය බිඳ වැටිලායි තිබුණේ.

සාගර විශ්වවිද්‍යාලයත් කිසිම අනාගත සැලැස්මක්, දැක්මක් නොමැතිව එක්තරා මොහොතක මේ රටේ පටන්ගත් ආයතනයක්. නමුත්, පසුකාලිනව මෙම විශ්වවිද්‍යාලයට ආපු ශිෂ්‍යයන් කරන ලද විවිධාකාර අරගලවල ප්‍රතිඵලයක් වශයෙන් සාගර විශ්වවිද්‍යාලයත් දැන් යම් ප්‍රමාණයකට විශ්වවිද්‍යාලයක මට්ටමට පත් වෙමින් පවතිනවා. ඒ වාගේම, වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ තිබෙන, යම්කිසි පිළිගත හැකි අධ්‍යාපනයක් ලැබෙන මට්ටමේ අඩු ගණනේ A/Lවලින්, Z score එකෙන් දරුවන් බඳවා ගන්නා - ආයතනයක් බවට පත් වෙලා තිබෙනවා. නමුත්, මෙහි තිබෙන ප්‍රශ්නය මේකයි. මෙම විශ්වවිද්‍යාලයේ ඉතාම ඉහළ මට්ටමේ, වෘත්තීමය වශයෙන් ඉස්සරහට යන්න පුළුවන් පාඨමාලා තිබෙනවා. අපේ රට සාගරයෙන් වටවූ රටක්. එය බෙහෙවින් වැදගත්. මම හිතන 15වැනි පිටුවට

> අපේ රට සාගරයෙන් වටවූ රටක්. එය බෙහෙවින් වැදගත්. මම හිතන විධියට ලංකාවට වැඩියෙන්ම රැකියා හොයන්න පුළුවන් ක්ෂේත්‍රයක් තමයි නාවුක ක්ෂේත්‍රය. නමුත්, ඒකට අදාළ කරන නිසි ආයතනයක් ලංකාවේ නැහැ. ඒවා සියල්ල privatize කරලා තිබෙන්නේ.

2017 අගෝස්තු 09

# සමුද්‍ර දූෂණය වළක්වා ගැනීම සඳහා නීතිවලින් ඔබ්බට ගිය වැඩපිළිවෙළක් අවශ්‍යයි

පාර්ලිමේන්තු මන්ත්‍රී

## වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා

අප ජීවත් වෙන්නේ මහ මුහුදත් එක්ක ඉතාම සමීප සම්බන්ධයක් තිබෙන, ඒ බැඳීම කිසිදා කැඩිය නොහැකි රාජ්‍යයක. පෘථිවි ගෝලයෙන් සියයට 20ක් වසාගෙන තිබෙන ඉන්දියන් සාගරයේ තමයි අපේ රට පිහිටා තිබෙන්නේ. ඉතිහාසය පුරා අපේ රට "ඉන්දියන් සාගරයේ මුතු ඇටය" නමින් හැඳින්වුවා. සාමාන්‍යයෙන් සාගරයේ තිබෙන දූපතකට "මුතු ඇටය" කියන විරුදාවලිය ලැබෙන්න තිබෙන්නේ දුර්ලභ අවස්ථාවක්. අපේ මහ මුහුදේ විචිත්‍රත්වය පිළිබඳව අතීත කාලය පුරා මේ ලෝකයේ ජනතාව දැනගෙන සිටි බවට එය සාක්ෂියක් වෙනවා. ඒ වාගේම අපේ මුහුදු සේද මාර්ගය ඉතා වැදගත් තැනක තිබුණා. ඒ නිසා අපට මහ මුහුදෙන් ඈත් වෙලා ජීවත් වෙන්න බැහැ. කිලෝමීටර් 1,340ක වෙරළ තීරය, නාවික සැතපුම් 200ක් වන අපේ මුහුදු සීමාව යන සියල්ලම අප සමග චෛන්ද්‍රීයව බැඳී තිබෙනවා.

අපේ රටේ ආර්ථිකයත් මේ සාගරයත් එක්ක බැඳී තිබෙනවා. ධීවර කර්මාන්තය අපේ රටේ දළ ජාතික නිෂ්පාදනයට සියයට 1.3ක් සෘජුවම එකතු කරනවා. දළ වශයෙන් ධීවර කර්මාන්තයේ සෘජුවම නියැලෙන ලක්ෂ හතරහමාරක - පහක පමණ ජනතාව මහ මුදත් එක්ක සම්බන්ධයි. ඒ වාගේම ලක්ෂ එකහමාරක - දෙකක ජනතාවක් සෘජු රැකියාවල නිරත වන, දළ දේශීය නිෂ්පාදනයට සියයට 4.5ක් පමණ එකතු කරන සංචාරක ව්‍යාපාරයත් මේ මහ මුහුදත් එක්ක සම්බන්ධයි. ඒ නිසා මහ මුහුද කියන්නේ අපට පාරිසරික වශයෙන්, ජෛව විද්‍යාත්මක වශයෙන් වාගේම ආර්ථික වශයෙනුත් ඉතාම වැදගත් සම්පතක්. නමුත් මේ වන විට අපි ලෝකයක් හැටියට සාගර දූෂණයට මුහුණ දීලා තිබෙනවා. ඒ පිළිබඳව අවධානය යොමු වෙලා තිබෙනවාට වඩා වැඩි ප්‍රමාණයකින් සාගරය මහා පරිමාණ වශයෙන් දූෂණය වෙලා තිබෙනවා. සංඛ්‍යා ලේඛන අනුව ගත්තොත්, මේ වනවිට මෙට්‍රික් ටොන් 250ක පමණ අපද්‍රව්‍ය ප්‍රමාණයක් සාගරවල තිබෙනවා කියලා කියනවා. වාර්ෂිකව අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 4ක්-12ක් අතර ප්‍රමාණයක් සාගරයට එකතු වන බව කියනවා.

විශේෂයෙන්ම ලෝකය පුරා භාවිතයට ගෙන ඉවතලන ප්ලාස්ටික් කැබලි සාගරයට අපද්‍රව්‍ය එකතු වීමට ප්‍රධාන වශයෙන් බලපානවා. මේ 2017 වසර වන විට සාගරවල පවතින ප්ලාස්ටික් කැබලි ප්‍රමාණය බිලියන 5,000කට වැඩියි කියලා තමයි සංඛ්‍යා ලේඛනවල තිබෙන්නේ. හැම වසරකම මෙට්‍රික් ටොන් 8කට වඩා වැඩි ප්ලාස්ටික් ප්‍රමාණයක් අපෙන් මුහුදට එකතු වනවා. මම කලින් කිව්වා වාගේ ලෝකයේම ඇගැයීමකට ලක්වුණු මහ මුහුදක් අපේ රටේ තිබුණාට අද අපි ඉන්නේ ඉතාම අන්තරායකාරී තත්වයක.



අපේ මහ මුහුදට වසරකට මෙට්‍රික් ටොන් 850,000ක, 900,000ක පමණ අපද්‍රව්‍ය ප්‍රමාණයක් අප විසින් එකතු කරනවා.

**ඒ විතරක් නොවෙයි. ලෝකයේ සාගර දූෂණය පිළිබඳ වාර්තා, දත්ත ඇතුළත් Global Coastal Pollution Index එකේ ලෝකයේ දූෂිතම සාගර තිබෙන රටවල් අතරින් පස්වන ස්ථානයේ අපේ රට ඉන්නවා. පස්වන ස්ථානය කියලා කිව්වාට මම හිතන්නේ මේ ස්ථානයට වඩා අපි ඉන්න තැන අනතුරුදායකයි කියලයි.** අපට ඉහළින් චීනය, තායිලන්තය, වියට්නාමය සහ පිලිපීනය ඉන්නවා. නමුත් අපේ මුහුදු තීරයත් එක්ක, අපේ ජනගහනයත් එක්ක, අපේ මුහුදේ සැරි සරන නැව් ප්‍රමාණයත් එක්ක සංසන්දනය කළාට පස්සේ අපි ඉන්න පස්වන ස්ථානය පිළිබඳව වඩාත්ම සැලකිලිමත් විය යුතුයි. චීනය පළමුවෙනි ස්ථානයේ ඉන්නේ කිලෝමීටර් 14,500ක් දිග මුහුදු තීරයක් සහ මිලියන 1,300ක ජනගහනයක් ඇතිවයි. ලෝකයේ මහා ආර්ථිකයක් සහ ලෝකයේ තිබෙන වේගයෙන්ම ක්‍රියාකාරී වන වරායන් 25න්, 8ක් ඔවුන් සතුව තබා ගෙන තමයි චීනය මේ මුහුදු දූෂණයට දායකවෙලා තිබෙන්නේ. පිලිපීනය අපට වඩා ඉහළ ස්ථානයක ඉන්නේ කිලෝමීටර් 36,289ක මුහුදු තීරයක් තබා ගෙනයි; අපට වඩා වැඩි ජනගහනයක් තබා ගෙනයි. අපට වඩා වැඩි ජනගහනයක් සහ මුහුදු තීරයක් තිබෙන ඉන්දුනීසියාව අපට වඩා පිටුපසිනුයි ඉන්නේ.

> ඒ විතරක් නොවෙයි. ලෝකයේ සාගර දූෂණය පිළිබඳ වාර්තා, දත්ත ඇතුළත් Global Coastal Pollution Index එකේ ලෝකයේ දූෂිතම සාගර තිබෙන රටවල් අතරින් පස්වන ස්ථානයේ අපේ රට ඉන්නවා. පස්වන ස්ථානය කියලා කිව්වාට මම හිතන්නේ මේ ස්ථානයට වඩා අපි ඉන්න තැන අනතුරුදායකයි කියලයි.

ඉන්දුනීසියාවේ මුහුදු තීරය කිලෝමීටර් 54,000ක්. ඉන්දියාවේ මුහුදු තීරය කිලෝමීටර් 7,000ක්. ජපානයේ මුහුදු තීරය කිලෝමීටර් 29,000ක්. නමුත්, ලෝකයේ දූෂිතම සාගර තිබෙන රටවල් අතරින් අපි පස්වෙනි තැන ඉන්නවා. මේ පස්වෙනි තැන කියලා කිව්වාට මා නැවතත් අවධාරණය කරන්නේ, අපේ ආර්ථිකයේ කුඩා බව; අපේ ජනගහනය අඩු වීම සහ අපේ මුහුදු තීරයේ කුඩා වීම යන සාධක එක්ක බැලුවාට පස්සේ අපි ඉන්නේ ඉතාම අන්තරාදායක තැනක බවයි.

National Geographic Magazine එකේ 2017 අප්‍රේල් කලාපය මා ළඟ තිබෙනවා. ඔවුන් වාර්තා කරලා තිබෙනවා, මුහුදු කලාපවල X-ray එකක්. ඒ අනුව එහි කළු පාටින් දක්වා තිබෙන්නේ ලංකාව ආශ්‍රිතව තිබෙන මුහුදයි. සමුද්‍ර දූෂණය පැත්තෙන් ගත්තාම වැඩිපුරම මුහුද දූෂණය වන්නේ මුහුදේ ක්‍රියාකාරකම් නිසා නොවෙයි. අපි අද සාකච්ඡා කරන්නේ සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ වූ නියෝග පිළිබඳවයි. ඒ නියෝග යටතේ අපි සාකච්ඡා කරන්නේ මුහුද ආශ්‍රිතව සිදුවන දූෂණ වැළැක්වීම පිළිබඳවයි. මේ සාගර දූෂණයෙන් සියයට 90කට වගකියන්න ඕනෑ, ගොඩබිම ආශ්‍රිතව සිදුවන මනුෂ්‍ය ක්‍රියාකාරකම්, මුහුද ආශ්‍රිතව සිදුවන ක්‍රියාකාරකම් බලපාන්නේ සියයට 10ක පමණ ප්‍රමාණයක්. නැව්වලින් පිටවන අපද්‍රව්‍ය, දැවි තෙල් වාගේ දේවල්, මළ අපද්‍රව්‍ය, ඝන අපද්‍රව්‍ය වාගේ දේවල් මේවාට බලපානවා.

අපට නිල්වන් මුහුදු තීරයක් තිබුණොත් තමයි, ලස්සන වෙරළක් තිබුණොත් තමයි සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න පුළුවන්කම ලැබෙන්නේ. හැබැයි, සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ බොහෝ හෝටල් තමන්ගේ අපද්‍රව්‍ය සියල්ල තමන් හම්බ කරගෙන කන මුහුද වෙතට යොමු කරන්න තමයි දැන් කටයුතු කරලා තිබෙන්නේ. ඔවුන් පළාත් පාලන ආයතනවලින් බලපත්‍ර ගන්න කොට අදාළ කරන කොන්දේසි සියල්ලටම එකඟ වෙලා තමයි අනුමැතිය ලබාගෙන යන්නේ. හැබැයි, රාත්‍රි කාලයේදී බොහෝ හෝටල්වලින්, කර්මාන්තශාලාවලින් අපද්‍රව්‍ය මහ මුහුදට බැහැර කරනවා. එම නිසා දැන් අපට මේ පිළිබඳව සංයුක්ත සැලැස්මක් වුවමනා කර තිබෙනවා. පළාත් පාලන ආයතනවලට ඊට අදාළ නීති තිබෙනවා. මධ්‍යම පරිසර අධිකාරියට, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියට ඊට අදාළ නීති තිබෙනවා. සංචාරක මණ්ඩලයේ වෙනම නීති තිබෙනවා. නමුත්, අපි රටක් හැටියට කල්පනා කරන්න ඕනෑ අපේ මුහුදු සම්පතත් ආරක්ෂා කරගෙන, ධීවර කර්මාන්තයට ඉඩකඩ සලසමින්, සංචාරකයනුත් ආකර්ෂණය කර ගන්නා සැලැස්මක් හා ප්‍රතිපත්තියක් ඇතිව ඒ සඳහා වූ වැඩපිළිවෙළකට අපි යන්නේ කොහොමද කියලා. 15වැනි පිටුවට

කවුළුව හැරම් තබමි

# බල තණ්හාවට කියවෙන කථා!



ජනතාවට විහිළු සැපයීම සම්බන්ධයෙන් කප්ගැසූ දේශපාලුවන් සිටිනා රටක් ලෙස ලංකාව ලෝකයේම ප්‍රසිද්ධය. ඒ අතර ජනතාවට බොරුකීම සම්බන්ධවද ලෝක කුසලානය දිනූ දේශපාලුවන් සිටිනුයේද ලංකාවේය. උදේට එකක් කියා දවල්ට තව එකක් කියා රෑට වෙන එකක් කියන දේශපාලුවෝ අපේ රටේ ඕනෑ තරම් සිටිති. එහෙත් රටේ ජනාධිපතිකම වැනි රටේ ඉහළම තනතුර හෙබවූවෙකු එසේ කරන විට, එය විශේෂිතය. ඒ රටට අත්වී තිබෙන සන්තාසිය ගැන නම් නැවත නැවතත් කථා කළ යුතුමය. ඒ අතින් මහින්ද රාජපක්ෂ හැරෙන්නට කෙනෙක් නැති තරම්ය. ඒ තරමට ඔහු අංක එකේ වැජඹෙන්නෙකි. ඔහු මේ ආණ්ඩුවේ ප්‍රබලයින්ට විරුද්ධව ගෙනා හැම විශ්වාසභංගයකදීම මුලින් ඡන්දය දෙන බව කියා පසුව පාර්ලිමේන්තුවටත් නොපැමිණ මඟහැර ගිය කෙනෙකි. තම ගෝලබාලයන් අමාරුවේ දමා ඒ හැම මොහොතකම ඔහු මඟහැර ගියේය. හිටපු ඇමති රවීට ගෙනා විශ්වාසභංගයේදීද ඔහු හැසිරුණේ එලෙසමය. ඔහු උදේ කීවේ විශ්වාසභංග ගෙන ඒමෙන් ඵලක් නොමැති බවය. ඒ සඳහා ඡන්දය නොදෙන බවය. ඒත් හවස කීවේ "මම ඡන්දය දෙනවා" කියාය. විශ්වාසභංගය නොආ නිසා ගැලවීමට නියමිතව තිබූ ඔහුගේ තවත් යට ඇඳුමක් ආරක්ෂා විය.

එදා ශ්‍රී.ල.නි.ප. සභාපතිකම මෛත්‍රීට කැමැත්තෙන් දුන් බව කියූ මහින්ද අද කියන්නේ තමන් එසේ නොකළ බවය; එසේ කිරීමට තරම් තමන්ට පිස්සුවක් නැති බවය; තමන් තවමත් ශ්‍රී.ල.නි.ප. සභාපති බවය. මේ ආණ්ඩුව තමන්ට කරන අපරාධ ගැන දෙවියෝත් කුපිතවී සිටින බවද ඔහු කියයි. ඒ ඔහු නීති වෙනස් කර තම ඥාති පුතා බස්නායක නිලමේ කරන විට නිහඬව සිටි දෙවියන් විය යුතුය. බලය වෙනුවෙන් ඕනෑම කුජීත වැඩක් කිරීමට කිසිදු හිරිකිතයක් නැති ලංකාවේ දේශපාලුවන් ගැන නම් අපට පුදුමයක් නැත. ඒත් රටේ මහපුටුව හෙබවූවෙකු මෙසේ දිව දෙකේ කතා කියන විට ඔහු නැවත බලයට ගෙන ඒමට කෙනෙකු සිහින දකී නම් ඔහුගේ මොළය ස්කෑන් කළ යුතුමය.

# විමල්ගේ කොමල කථා



“ඊළඟට ගේන අධිකරණ ඇමති චෝදනා නැති කෙනෙක් වෙන්න ඕනෑ” මේ මෙම ආණ්ඩුවේ අලුත් මුදල් ඇමති පත් කිරීමේදී සැලකිල්ලට ගත යුතු ප්‍රධාන කරුණ බව ඊයේ පෙරේදා විමල් වීරවංශ කියූ කථාවකි. ඒ සමගම එවැනි පිරිසිදු අය කැබිනෙට්ටුවේ සිටීද යන්න සැක සහිත බවද ඔහු කීවේය. ඒ අනුව මෙය පසුගිය රාජපක්ෂ කැබිනට්ටුවටද වලංගු වී නම් ඔහුටද එහි සිටිය හැකි වන්නේ නැත! විමල් යනු රාජ්‍ය දේපොළ අවභාවිතය සහ හොර පාස්පෝට් හදා රටගිය හිටපු ඇමතියෙකු බවද රටම දනී. ඒ අනුව ඉහත නිර්දේශය කරන්නේ, දූෂණ චෝදනා සම්බන්ධයෙන් හත්පොළේ ගාගත් හිටපු ඇමතියෙකි. මෙහිදී අපට මතක් වන්නේ "නමින් කපුරුහාමි ඒත් කට නම් ගඳයි" කියන ගැමි කියමනයි. මේ සෑම ධනපති ආණ්ඩුවකම දූෂණ චෝදනා නැති ඇමතියෙකු සෙවීම කළුනික සොයනවා වැනි වැඩක් වීම වෙනම කරුණකි.

කෙනෙක් මුළු ශරීරයේම අසූචි තවරාගෙන අනෙකාගේ ගඳ සුවඳ සොයන්නේ නම් ඒ තරම් විහිළුවක් තවත් තිබේද? මහින්දගේ සාටකයේ එල්ලී සිටින විමල් වැනි කෙනෙකු ඉහත වර්ගයේ කථාවක් කියන විට ඒ සඳහා සිනහවීමට ශරීරයට වෙනම අවයවයක් හයිකර ගත යුතුය. තම පවුලේ අයටත් ඥාති ගණයාටත් හිතවතුන්ටත් ජනතා දේපොළ රිසිසේ භුක්ති විඳීමට ඉඩකඩ සලසා දුන් අයෙකු "ශුද්ධභාවය", "පිරිසිදුභාවය" ගැන කථා කරන විට අපට සිහිවන්නේ, නිරුවතින් නටමින් අනුන්ගේ හෙළුව ගැන ඇඟිල්ල දිගුකරන්නෙකුය. හොඳට නටපං කොල්ලෝ හොඳට නටපං...

# විජේදාසගේ ලැජ්ජාව



සිය ඇමති ධුරයෙන් ඉවත් කළ පසු පසුගියදා විජේදාස රාජපක්ෂ කියා සිටියේ මෙවැනි ඇමති මණ්ඩලයක සිටීම තමාට විශාල ලැජ්ජාවක් බවය. ඔහුට ලැජ්ජාවීමට මෙතරම් කල් ගතවුණේ ඇයිද? යන්න නම් අපනම් නොදනිමු. එහෙත් ලැජ්ජා භය ඇති මැති ඇමතියන් මේ රටේ සිටීද යන්න නම් ජනතාවට ගැටලුවකි. එසේ වූයේ නම් මේ රට දේශපාලනික අතින් මේ තරම් පහත් තත්වයකට ඇද නොවැටෙන බව පොඩි එකෙකු පවා නොදැන සිටින්නට ඉඩක් නැත. එදා ඇවන්ගාඩ් සිද්ධියේදී ඇවන්ගාඩ් අයිතිකරුවා සේවාදායකයෙකු කරගෙන ඔහුගේ නීතිඥයා ලෙස කටයුතු කළ විජේදාස ඇවන්ගාඩ් නැවේ තිබූ අවිවල අංක මැකී ඇත්තේ, ඒවා එකිනෙක ඇතිල්ලීම නිසා යයි යන නිගමනයට එන විට විජේදාසගේ ඔය කියන ලැජ්ජාව කොහේ තිබුණාදැයි අපි නොදනිමු. එදා මාධ්‍යවේදියෙකු 'මෙය සිංහල බෞද්ධ රටක් කියල පිළිගන්නවාදැ'යි ඔහුගෙන් ඇසූවිට ඔහු කිවුවේ 'ඕක ගෝත්‍රික ප්‍රශ්නයක්, මේක හැම ආගමිකයාටම අයිති රටක්ය' කියාය. එහෙත් ඇමතිකම අහිමි වීමෙන් පසු විජේදාස මල්වතු අස්ගිරි නායක හාමුදුරුවරු හමුවී අද කියන්නේ 'මේක සිංහල බෞද්ධ රටක්' කියාය. 'රටේ සම්පත් විකුණනවාට තමා තරයේ විරුද්ධ බව'ය. එය 'තම හෘදය සාක්ෂියට එකඟ නැති බව'ය. එහෙත් විජේදාසලාගේ හෘදය සාක්ෂිය මැනීමට ඉහත සිදුවීමම ප්‍රමාණවත්ය.

මේ රටේ හැම හොර දේශපාලුවාටම ලැජ්ජාව, භය, දේශප්‍රේමය මතක්වන්නේ තමන් කුජීතව යන විටය. මේ රටේ හැම පල්හොර දේශපාලුවෙකුම අවසානයේ පැළඳගන්නා වෙස් මුහුණ ආගම සහ දේශප්‍රේමයයි.

# පොලිටිකල් පංතිය

දවසක් ළමයි එනකොට පොලිටික්ක උදෙන්ම ඇවිත් හිස්ටීරියාව එක්ක බර කළේ. පොලිටික්කට ගුඩ් මොනිං කියන එකවත් ඇහිල නැතිව වසන්තිය හිටියෙ ෆුල් අප්සෙට් එකේ.

" ගුඩ් මෝනිං සර්..." පංතියෙ ඔක්කොම සෙට් වෙලා මහ හයියෙන් කියපු සද්දෙට පොලිටික්ක උඩ ගියා.

“ගුඩ් මෝනිං... ගුඩ් මෝනිං ළමයිනේ.” පොලිටික්ක ආතතිය මකන්න පනාව දැම්ම. “ඔයගොල්ලො දන්නෑනෙ. අපි හිටියෙ වැදගත් කතාවක.”

“සමාවෙන්න සර්... කට්ටියගෙන් ඩිස්ටර්බ් වුණානම්...” අනුරුද්දිය ‘කට්ටියගෙන්’ කිවුවෙ ‘අපිනම් ඕවට නෑ’ කියන්න.

“ඔව් සර්, සමහරු මැනර්ස් දන්නෙ නෑනෙ” වසන්තියත් හේදෙන්න බැලුව.

“නෑ, නෑ අපි කතාවුණේ රහසක් නෙමෙයි. ඔය ළමයිනුත් දැනග න්න ඕනෙ දෙයක්.” පොලිටික්ක ඇල්වතුර නිවුව.

“අපේ සිලබස් වෙනස් වෙන්න යනවද සර්?” චමිය ඇකඩමික් පැත්තෙන් ආව.

“අපිට ආයෙත් දවල්ට බනිස් දෙනවලුද?” කනිය බඩ අත ගගා කියපු කතාවට හිස්ටීරියාව කැකිරි පැලුව.

“බනිස්ම දෙයි බලන් හිටහල්ල. මට බය පහසුකම් ගාස්තුවලටත් වැඩේ දෙයිද කියල” මංජුව ආර්ටීකෙන් බාසාව දැම්ම.

“නෑ නෑ ළමයිනේ මේක වැදගත් දෙයක්!...” පොලිටික්කට කියල කටගන්න අහුවුණේ නෑ.

“එතකොට දවල්ට කන එක වැදගත් නැහැ නේද සර්?” කනිය ඇහැක් වැහුව.

“නැහැනෙ ළමයිනේ. මිනිස්සු පහුගිය ආණ්ඩුව වෙනස් කළේ බඩට නෙමෙයි කියලනෙ කිවුවෙ.” පොලිටික්ක කනියව කැපෙන්න නියෙව්ව.

“හරි සර්, මිනිස්සු මහින්දව ගෙදර යැව්වෙ ඒ ආණ්ඩුවෙ හොරකම් අල්ලන්න. ඇල්ලුවෙ නැති එක වෙනම ප්‍රශ්නයක්.” මංජුව බැට් එක දැම්ම.

“අලුත් ආණ්ඩුවට.... අලුත් කිවුවට අලුත් නැහැ අවුරුදු දෙකහමාරක් පරණයි... අම්බානක වැඩ වැඩි වුණානෙ... ඉතින් හොරු අල්ලන්න බැරිවුණා.” සමන ඌන පූර්ණය කළා.

“ඒ කියන්නෙ සංවර්ධන වැඩ ගොඩගැහුණා?” පොලිටික්ක කට කොණට පනාවක් දැම්මෙ කිංඩියට.

“නෑ... හොරකමට බැස්සනෙ ආපු ගමන්. ඉතින් ආපු වැඩේ අමතක වෙන්න ඇති...” මංජුව කට ඉස්සර කළා.

“දැන් බලන්න ආණ්ඩුවෙ හොරකම් වහගන්න අර අහිංසක පවුලට ආයෙත් වද දෙන්න පටන් අරන්.” පොලිටික්ක ලේන්සුව අරන් හොටු පිහදැම්ම.

“ආ... ඔව් ජාතියේ අම්මව බේරගන්න කියල කට්ටියක් පාරෙ හිටිය.” සමන උත්තර බැන්දෙ පොලිටික්කට නෙමෙයි වගේ. ”ජාතියෙ පුතාලගෙ වැඩ නිසා තමයි අම්මට කට උත්තර දෙන්න එන්න වුණේ. එයාල ඒක දන්නවද දන්නෙ නෑ. පව්... ආණ්ඩුව තාජුඩීන්ගෙ මිනීමැරුම ගැන සද්දෙ වහල ඉඳල දැන් ආයෙත් ගොඩඅදින්නෙ බැඳුම්කරේ වහන්න හිතාගෙන වෙන්න ඇති. ඒත් මේ දෙගොල්ලම මිනීමරුවෝ, හොරු, මංකොල්ලකාරයෝ කියල මිනිස්සු දැනගන්න ගන්න එක රටට හොඳයි. අනෙක කොහෙද අහිංසක පවුලක්. අප්පච්චි සුනාමි සල්ලි හොරකම් කළා. අම්මා සිරිලිය සවියෙන් ගැහුවා. එක පුතෙක් ක්‍රිෂ් ටවර් එකේ සල්ලි හොරකම් කළා. තව පුතෙක් තාජුඩීන්ගෙ ලේ ගාගත්ත....” සමන එක්ස්ප්‍රස් කෝච්චියක් වගේ කියාගෙන ගියා.

“ඇයි තව පුතෙක් අභ්‍යාවකාශෙටත් ඇරිය!” කවුරු හරි කියනව ඇහෙනකොටත් පොලිටික්කගෙ ඩයල් එක, සීරිස් එකම ලොස් වෙච්ච කැප්ටන්ගෙ මූණ වෙලා තිබුණෙ.

13 පිටුවෙන්

## නිසි වැඩපිළිවෙළක්...



විධියට ලංකාවට වැඩියෙන්ම රැකියා හොයන්න පුළුවන් ක්ෂේත්‍රයක් තමයි නාවුක ක්ෂේත්‍රය. නමුත්, ඒකට අදාළ කරන නිසි ආයතනයක් ලංකාවේ නැහැ. ඒවා සියල්ල privatize කරලා තිබෙන්නේ.

මොරටුව විශ්වවිද්‍යාලයේ NDT පාඨමාලාව තිබියදී එහි තිබුණා, Marine Engineering කියා පාඨමාලාවක්. එය තමයි දැනට යම් හෝ මට්ටමක තිබෙන්නේ. ඒ, නිසා සාගර විශ්වවිද්‍යාලය ඉතා වැදගත් ප්‍රශ්නය වී තිබෙන්නේ, ඒ ආයතනයට අතීතයේදී දේශපාලන හේතු සහ නොයෙක් විවිධ හේතු මත බඳවාගත් ආචාර්ය මණ්ඩලයක් සිටීමයි. සියලු දෙනාම එහෙම අය නොවෙයි. සුදුසුකම් තිබෙන අයත් ඉන්නවා. අඩු සුදුසුකම් සහිත පිරිසකුත් ඉන්නවා. මෙහිදී අප දකින දෙයක් තිබෙනවා. "ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය" කියන නම පාවිච්චි කරනවා නම්, එයට Z score එක අනුව සිසුන් බඳවා ගන්නාව නම් විය යුතු දෙයක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් සිසු දරුවන්ගේ ඉල්ලීමකුත් තිබෙනවා. ඔවුන් මේ දවස්වල යම්කිසි ආකාරයකට පන්ති වර්ජනයකයි ඉන්නේ. ඇමතිතුමාට මේ කාරණය ගැන අවබෝධයක් ඇති, එතුමාත් හිටපු ශිෂ්‍ය නායකයෙකු වන නිසා.

අපට කියන්න තිබෙන මූලික කාරණයක් තිබෙනවා. එහි වැඩකරන සේවක මහත්ම මහත්මීන්ගේ වෘත්තීමය අයිතිවාසිකම් ආරක්ෂා කර දීම සම්බන්ධව අපි සියයට 1000ක් එකඟයි. නමුත් ඕනෑම වෘත්තියකට සුදුසුකම් තිබෙනවා. අප විශ්වවිද්‍යාලයක මහාචාර්යවරුන්ගෙන් ඉගෙන ගත්තොත් තමයි අපට පුළුවන්කම තිබෙන්නේ, ඒ උපාධි මට්ටම ළඟා කරගන්න. අපට උගන්වන කෙනාගේ මට්ටම තමයි අපට ලැබෙන්නේ. අද SAITM එක සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන ප්‍රශ්නයට අදාළ කාරණයත් ඒකයි. SAITM ඒකේ කිසිම quality එකක් නොමැති ආචාර්යවරුන්ගෙන්, කිසිම quality එකක් නැති වටාපිටාවක් ඇතුළේ දොස්තරවරුන් හදන්න බැහැ කියන එක තමයි ලංකාවේ වෛද්‍ය සභාව, ලංකාවේ වෛද්‍ය ආචාර්ය මණ්ඩල, වෛද්‍යවරුන් ඇතුළු සියල්ලෝම කියන්නේ, සාගර විශ්වවිද්‍යාලයටත් එය එලෙසම අදාළයි. සාගර විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් අද යම් පන්ති වර්ජනයකයි ඉන්නේ. අපි ඉල්ලා සිටිනවා, වහාම මැදිහත් වෙලා උපකුලපතිතුමා ඇතුළු අයගේත් උදවු අරගන එහි ආචර්යවරුන් ලෙස විශ්වවිද්‍යාල මටටමේ, උපාධි මට්ටමේ, ඉහළම මට්ටමේ සුදුසුකම් තිබෙන අය පත් කරන්න කියා.

ඒ තුළින් යම් කිසි පිරිසකට දැනට දරන තනතුරු අහිමිවනවා නම් ඔවුන්ට ඒ අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ගන්න යම් කිසි කාල සීමාවක් දුන්නාට කමක් නැහැ. හැබැයි, ඒවා අරගන වෙනම එවන්න කියන්න. එහෙම එනකොට අවස්ථාවක් දුන්නාට කමක් නැහැ. නමුත්, දැන් මේකට සුදුසුකම් තිබෙන ආචාර්යවරුන් පත් කරන්න කියන ඉල්ලීම අපි කරනවා.

ඔබතුමා දන්නවා, සුගතදාස ජාතික ක්‍රීඩාංගණය හැම ක්‍රීඩා ඇමතිවරයාගේම ගසා කෑමේ ප්‍රධාන මධ්‍යස්ථානයක් බවට පත්වෙලා තිබුණු බව. ඔබතුමාට මතක ඇති පසුගිය රජය සමයේ එක්තරා ක්‍රීඩා උළෙලක් අවස්ථාවේදී කෝටි ගණනක් වියදම් කරලා එහි ලකුණු පුවරුවක් - scoreboard එකක් - සවි කළා. ඒක ඒ වැඩසටහන අවස්ථාවේ වැඩ කළෙත් නැහැ. රුපියල් කෝටි ගණනක් ඒකෙන් නාස්ති කළා. ඊට පස්සේ හිටපු ක්‍රීඩා ඇමතිවරයා වෙනස් වෙලා ඒ ආණ්ඩුව යටතේම තව ක්‍රීඩා ඇමතිවරු ආවා. ඔවුන් යටතේ සිදු වුණු දූෂණ, වංචා පිළිබඳ කාරණාත් විශාල සංඛ්‍යාවක් තිබෙනවා. ඉන් එක් තමයි සුගතදාස ජාතික ක්‍රීඩාංගණයේ ක්‍රීඩා පිටියේ සිද්ධ වෙලා තිබෙන යම් යම් වංචාවන්. ඒක නිවැරදි කරන්න කියලයි දැන් මේ දයාසිරි ජයසේකර ඇමතිවරයා ටෙන්ඩර් පත්‍රිකා දාලා තිබෙන්නේ. නමුත්, ජනමාධ්‍යවලින් වාර්තා කරන ආකාරයට මේකේත් යම් යම් ගැටලු, විශේෂයෙන් දූෂණ පිළිබඳ ගැටලු මතු වෙලා තිබෙනවා.

මා ඒ ගැන එක් නිශ්චිත කාරණයක් - ජනමාධ්‍ය වාර්තා කර තිබෙන දෙයක් - කියන්නම්. දියගම ක්‍රීඩාංගණය ඉදි කරද්දී රාජපක්ෂ පවුල විසින් රුපියල් මිලියන 100කට වඩා වංචා කළා කියා එම ක්‍රීඩාංගණය වෙනුවෙන් රුපියල් මිලියන 100ක ආධාරයක් දුන් ලලිත් කොතලාවල මැතිතුමා පැහැදිලිවම කියනවා. ලලිත් කොතලාවල මහත්මයාගේ ව්‍යාපාරවල තිබෙන ගැටලු වෙනම තිබෙනවා. නමුත් ලලිත් කොතලාවල මහතා කියන්නේ, තමන්ගේ ව්‍යාපාර සඳහා රාජ්‍ය බලය පාවිච්චි කරපු පුද්ගලයෙක් නොවෙයි. ඔහු රුපියල් මිලියන 100ක් දියගම ක්‍රීඩාංගණය හදන්න දුන්නා කියා කියනවා. අපි අහනවා, "ඒවා කෝ" කියා. දයාසිරි ජයසේකර මහත්මයා රවි කරුණානායක මහත්මයාට එරෙහිව අත් දෙකම ඔසවන්න කලින් අත් දෙකයි කකුල් දෙකයි කියන හතරම ඔසවාගෙන කරන්න ඕනෑ වැඩේ තමයි, ඒ මුදල් පිළිබඳව සොයන එක. නමුත් ඒක කරන්නේ නැහැ. එතුමා මොකක්ද කර තිබෙන්නේ? දියගම ක්‍රීඩාංගණයේ අධ්‍යක්ෂ මණ්ඩලයට රාජපක්ෂවරුන් යෝජනා කරන නම් දෙකක් ස්ථාවරව දමා තිබීමයි කර තිබෙන්නේ. රාජපක්ෂලාගේ පදනමකින් සල්ලි දුන්නා කියා තමයි ඒ පදනම හදාගෙන තිබෙන්නේ. හැබැයි ලලිත් කොතලාවල මහත්මයා දුන් රුපියල් මිලියන 100ටත් රාජපක්ෂවරු දියගම ක්‍රීඩාංගණය හදන්න දාලා නැහැ. ඒකයි ඇත්ත. ඒ මනුස්සයා දුන් රුපියල් මිලියන 100 හෝ දැම්මා නම් තවත් කමක් නැහැ.

සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගණයේ දූෂණ සම්බන්ධව සොයා බලන්න නවින් දිසානායක ඇමතිතුමා කමිටුවක් පත් කළා. නවින් දිසානායක අමාත්‍යතුමා පත් කළ එම කමිටුව වාර්තාවක් ඉදිරිපත් කළා. අපි ඒ කාරණය ගැන ඇති තරම් විවාද කර තිබෙනවා. ඒ වාර්තාවෙන් සූරියවැව ක්‍රීඩාංගණයේ යම් යම් ගැටලු පිළිබඳව සැලකිය යුතු ප්‍රමාණයක කරුණු සඳහන්ව තිබුණා. අමාත්‍යතුමා කිව්වා, එය මදි නීතිඥයන් දාලා කරපු එක මදි- කියා. දැන් ඔබතුමා කර තිබෙන්නේ මොකක්ද? ඔබතුමා එකම කෙනෙකුට හෝ විරුද්ධව නඩුවක් දාලා තිබෙනවාද? රාජපක්ෂ පාලනය ඇතුළේ කෙරුණු එකදු වංචාවක් සම්බන්ධව හෝ දූෂිතයන්ට එරෙහිව, අඩු ගණනේ එක්කෙනෙකුට හෝ එරෙහිව තමුන්නාන්සේ අමාත්‍යාංශ මට්ටමින් නඩුවක් පවරා තිබෙනවාද? FCID එකට භාර දුන්නා කියන කතා නොවෙයි.

## සමුද්‍ර දූෂණය වළක්වා ගැනීම...



සමුද්‍ර දූෂණය වැළැක්වීම සම්බන්ධයෙන් නීති සම්පාදන කිරීම හොඳයි. නැව්වලින් බැහැර කරන අපද්‍රව්‍ය සම්බන්ධයෙන් නීති ශක්තිමත් කිරීම හොඳයි. නමුත්, අපි හිතනවා මේ සියල්ල පිළිබඳව යම්කිසි ආකාරයක සංයුක්ත, සංවිධිත වැඩපිළිවෙළක් වුවමනා කර තිබෙනවා කියලා. එහෙම වුණොත් තමයි අපට මේ එන අභියෝගයට මුහුණ දෙන්න පුළුවන්කම ලැබෙන්නේ.

## මේ දුගඳ...

05 පිටුවෙන්




නොව ශිරන්ති රාජපක්ෂ කටඋත්තර දීමට එනවිට, විමල් වීරවංශ, මහින්දානන්ද, නාමල් රාජපක්ෂ රක්ෂිත බන්ධනාගාරයට යන විට මෙවැනිම හැසිරීම් දැක ගත හැකි විය. ඉන් පෙනෙන්නේ කුමක්ද පසුගිය වසර 69ක ධනපති දේශපාලනය තුළ පාලකයන් හොරුන් අපරාධකරුවන් වූවා සේම ඔවුන්ට ගැතිකම් කරන ප්‍රවේණි දාසයන් සේ හැසිරෙන ජනතාවක්ද නිර්මාණය කර තිබෙන බව නොවේද? ධනවාදයේ පිරිහීම බරපතළ වන්නේ මේ නිසාය. මේ දැනෙන්නේ ඒ දුගඳය.

ගෙවුණු වසර දෙකක නොව වසර 69ක ධනපති පාලනයේ ශේෂ පත්‍රය හෙවත් අස්වැන්න මොනවාද? ණය බරින් මිරිකුණු රටක්, බිඳ වැටුණු ආර්ථිකයක්, මහා බදු බරකට කරගහන පීඩාවටපත් ජනතාවක්, රටේ සම්පත් විදේශිකයන්ට විකාණාගෙන කන ආර්ථික ප්‍රතිපත්තියක්, හොරකම, වංචාව, දූෂණය ඉහවහා ගිය අදමිටු පාලනයක්, විවිධ රෝගවලින් (ඩෙංගු, වකුගඩු, හදවත් රෝග වැනි) මිය යන ජනතාවක්, විනාශයට ලක්වුණු අධ්‍යාපනයක්, සෞඛ්‍ය සේවයක් හා ප්‍රවාහනයක්, දිවිනසා ගන්නා තරුණ පරපුරක්, මත්ද්‍රව්‍ය පැතිරීයන සමාජයක්, අපරාධ, ස්ත්‍රී දූෂණ, මිනීමැරුම් ඉහළ යන රටක්ය. එබැවින් වත්මන් සමාජයේ මෙම පිරිහීමට මෙතෙක් රට පාලනය කළ සියලුදෙනා වගකිව යුතුය. නැවත නැවත ඔවුන්ටම බලය දීම අනුවණකමකි. එය දැන්වත් නතර කළ යුතුය.

මෙය, දේශපාලනය සිසාරා පැතිරෙන මෙම දුගඳ ධනවාදයේ දුගඳ ලෙස හඳුනාගෙන ඉන් මිදීම සඳහා නව දේශපාලන මඟක් ගැනීමට ජනතාව සූදානම් විය යුතු යුගයකි; මානසික වහල් බවෙන් මිදී, ප්‍රභූන් වන්දනා කරන වැඩවසම් චින්තනයෙන් මිදී නිදහස් මිනිසුන් ලෙස සිතිය යුතු තීරණ ගත යුතු කාලයකි; ඒ සඳහා ජනතාව දැනුවත් කළ යුතු යුගයකි. මෙම මඟහැර යා නොහැකි වගකීම ඉටුකිරීමට වඩා හොඳ සමාජයක් ප්‍රාර්ථනා කරන සියලුම දෙනා පෙරමුණ ගත යුතුය. මේ එයට කාලයයි.

## දූෂණයෙන් තොර...

16 පිටුවෙන්



අර්ජුන මහේන්ද්‍රන් වෙත රවී කරුණානායක මුදල් ඇමතිවරයා ලෙස දින රහිත ලිපියකින් මුදල් අවශ්‍ය බව දන්වා තිබුණා. එම ලිපිය තිබුණේ අර්ජුන මහේන්ද්‍රන් ළඟ පමණයි. රවී කරුණානායක සිය ඇමතිධුරය අර්ජුන් ඇලෝසියස් බේරා ගැනීම වෙනුවෙන් උපයෝගී කරගත් බවට එය සාක්ෂියක්. ඒ වගේම රවී කරුණානායක ඔහු සිටි කුලී නිවස රු. ලක්ෂ 1650ක් දී මිලට ගත්තා. ඒ සඳහා ලබාගත් මුදල කිසිදු ලියකියවිල්ලකින් තොරව බැංකුවේ ආරක්ෂක සේප්පුවක තැන්පත් කරලා තිබුණා. අඩුම තරමේ සේප්පුවක තැන්පත් කළ බවට රිසිට් පතක් නැහැ. එනිසා එම මුදල කළු සල්ලි බවට සැකයක් තිබෙනවා. එනිසා රවී කරුණානායකට එරෙහිව අල්ලස් පනත යටතේත් අපරාධ පනත යටතේත් මුදල් විශුද්ධිකරණය යටතේත් නඩු පැවරිය හැකියි.

අපේ රටේ ජනතාව තේරුම් ගත යුතුව තිබෙනවා, මේ වංචනිකයින් හොරකම් කරන්නේ මොනවද කියලා. ඔබේ දරුවාට රෝගයක් වැළඳී රෝහල්ගත කළ පසු ඉන්න ඇඳක් නැහැ. දෙන්න බෙහෙත් ටිකක් නැහැ. පාසැලේ පහසුකම් ටික නැහැ. පාසැලට නිසි වැසිකිළි පද්ධතියක් නැහැ. ඉවතලන කුණු ඉවත් කරගන්න ක්‍රමවේදයක් නැහැ. මාර්ග පද්ධතියක් නැහැ. ජීවත් වීමට ආදායම් මාර්ගයක් නැති ජනතාව බෙලහීන තත්වයට පත් වෙලා. ඒ වෙනුවෙන් තිබෙන ධනය තමයි මේ වංචනිකයන් හොරකම් කරලා යටිමඩි ගහගන්නේ.

අපේ රටේ ජනතාව කළ යුත්තේ, මහජන දේපොළ හොරා කාපු හොරුන්ට ආශිර්වාද කිරීම හෝ ඔවුන් සිප වැළඳ ගැනීම නෙවෙයි. එවැනි දේශපාලන සංස්කෘතියකට එරෙහිව මේ රටේ ජනතාව නැගිටින්න ඕනෑ. දූෂණයට, වංචාවට එරෙහිවත් කෑ ගහන්න ඕනෑ. මහජන දේපොළ පොදි බඳිනවට එරෙහිව හඬ නගන්න ඕන. එවැනි දේශපාලන සංස්කෘතියක් අපේ රටට ඕනෑ. එනිසා මෙම සංස්කෘතිය වෙනස් කිරීම වෙනුවෙන් අපේ රටේ ජනතාව ඉදිරියට පැමිණිය යුතුයි කියලා අපි විශ්වාස කරනවා."

## පරණ සහ අලුත් හොරු...

03 පිටුවෙන්



නමුත් මේ ආණ්ඩුවේ අලුත් හොරු සහ හොරකම් නිසා පරණ හොරුන්ට හැංගෙන්නත් බැහැ. හොරකම් හංගන්නත් බැහැ. ඒවා හංගන්න දෙන්නත් බැහැ.

අනිත් අතට මේක කොහොමද ආණ්ඩුවේ යහපාලනයේ ජයග්‍රහණයක් කියන්නේ? යහපාලනය කියන්නේ හොරකම් කරලා අහුවුණාම ඉල්ලා අස්වෙන එකද? එහෙම වෙන්නේ කොහොමද? අපි ඉල්ලා අස්වෙන්න කිවුවා ඒක තමයි යහපාලනය කියනවා නම් ඒකත් වැරදියි. යහපාලනය කියන්නේ, හොරකම් නොකිරීමට මිසක් හොරකම් කරලා අහුවුණාම නීතියට මුහුණ නොදී අස්වීම නෙමෙයි. රවි කරුණානායකට ඉල්ලා අස්වෙන්න සිදුවුණේ අල්ලස් ගත්තේ නැහැ කියලා ඔප්පු කරගන්න බැරි නිසා. නියත ලෙසම විශ්වාසභංගය පරදින බව දන්න නිසා. ඒක " යහපාලනයේ" ප්‍රතිඵලයක් නෙමෙයි.

ආණ්ඩුවට හොරු අල්ලන්න බැහැ. හොරු අල්ලන්නෙත් නැහැ. හේතුව ආණ්ඩුවේ අභිලාෂය හොරු ඇල්ලීම නෙමෙයි, අල්ලනවා වගේ පෙන්නාගෙන හොරකම් කිරීම විතරයි. විජේදාස රාජපක්ෂ බිල්ලට දුන්නෙත් හොරු අල්ලනවා වෙනුවට ආරක්ෂා කරනවා කියන සමාජයේ ප්‍රබල ලෙස මතුවෙමින් එන ආණ්ඩුවට එරෙහි ජනතාවගේ විරෝධයෙන් ගැලවෙන්න මිසක් මින් පස්සේ අලුත් අධිකරණ ඇමතිවරයෙක් පත් කරගෙන පරණ සහ අලුත් හොරු අල්ලන්න නෙමෙයි. ආණ්ඩුවට හොරු අල්ලග න්න නීතිය හමුවට ගේන්න බැරි එක තනි පුද්ගලයෙකුගේ ප්‍රශ්නයක් හැටියට නෙමෙයි, මේ දුබල ධනපති ක්‍රමයේම සහජාතිය ජානමය ප්‍රශ්නයක් හැටියටයි අප තේරුම් ගත යුත්තේ.

***නියමුවා:- පසුගිය කාලයේ ජ.වි.පෙ. ලෙසත් දූෂණ විරෝධී හඬ ලෙසත් වංචා හා දූෂණවලට එරෙහි පැමිණිලි ගණනාවක් රජයේ නීතිය ක්‍රියාත්මක කළ යුතු ආයතනවලට භාර දී තිබුණා. නමුත් ඊට අදාළ පරීක්ෂණ ප්‍රමාණවත් පරිදි ඉදිරියට යන බවක් ජනතාව දුටුවේ නැහැ. මේ ඇයි?***

***සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා:-*** එම පැමිණිලිවලට අදාළ පරීක්ෂණ ප්‍රමාණවත් ලෙස ඉදිරියට නොයන්නේ ඒ ආයතනවල දෝෂයක් නිසා හෝ එම නිලධාරීන්ගේ ගැටලුවක් නිසා නෙමෙයි. එම පැමිණිලිවලට අදාළ පුද්ගලයන් සෘජු ලෙසම ආණ්ඩුවේ ඇමතිකම් දරන අය. ඔවුන් අදාළ නිලධාරියාට සෘජු බලපෑම් කරලා, එම පරීක්ෂණ යට ගහන්න කටයුතු කරපු අවස්ථා බොහොමයක් තියෙනවා. රාජිත සේනාරත්නට විරුද්ධ යෝජනා යට ගහන්න අල්ලස් කොමිසමේ ජනරාල්වරිය ගෙදර යවපු එක හොඳම උදාහරණයක්.

හොරු සමග හොරකම් කරන, පරණ හොරු රකින මිතුරන්ගේ ආණ්ඩුවකින් මීට වඩා වේගවත් පරීක්ෂණ අපේක්ෂා කරන්නේ කොහොමද? නමුත්, එහෙම කියලා හඬක් නගන්නේ නැත්නම් බලපෑමක් කරන්නේ නැත්නම් නිහඬව හිටියොත් මොකද වෙන්නේ? ජනතාවට තමන් පත්කරගෙන ඉන්නේ මේ වගේ හොරු කියලාවත් දැනග න්න විදියක් නැතිවෙනවා. අපි මේ පැමිණිලි කරන්නේ මේ ධනපති හොරු රකින ආණ්ඩු ඒ හොරුන්ට දඬුවම් දෙනවා කියලා අන්ධ විශ්වාසයකින් නම් නෙමෙයි. අපි මේ ජනතාවටයි හෙළිකරන්නේ ඔයගොල්ලෝ පත්කරගෙන තියෙන පාලකයෝ ජනතාවගේ ධනය විනාශ කරන්නේ මෙහෙමයි කියලා.

***නියමුවා:- හොරු කණ්ඩායම් දෙකක් අතර ගැටුම තුළ හොරකම් පමණක් නොව වැදගත් දේශපාලන පණිවිඩයක්ද නිරාවරණය වී තිබෙනවා. ජනතාව මේ පණිවිඩය කෙසේ තේරුම් ගත යුතුද?***

***සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා:-*** ඒක තමයි වැදගත්ම දේ. ජනතාව හොරුන්ට පාලන බලය දීලා අපිට - ජනතා විමුක්ති පෙරමුණට - හොරු අල්ලන්න කියලා වැඩක් නැහැ! දැන් ඕනෑ හොරු අල්ලන ආණ්ඩු හෝ හොරු හෙළිදරව් කරන පිරිසක් නෙමෙයි. ජනතාව හොරු නැති පාලනයක් හැදිය යුතුයි. එහෙම පාලනයක් මේ රටේ බිහි කළ හැක්කේ කොහොමද? ඒ සඳහා සුදුසුකම් තියෙන්නේ කාටද? දැන් ඒක ජනතාව පැහැදිලි කරගත යුතුයි.

හොරු නැති පාලනයක් හදන්න අපිට වුවමනාවක් තිබුණාට විතරක් ඒක කරන්න බෑ. ඒ සඳහා ශ්‍රීල.නි.ප. පාක්ෂිකයා වෙනස් වෙන්න ඕනෑ. යු.එන්.පී ඡන්දදායකයා වෙනස් වෙන්න ඕනෑ. යු.එන්.පී. - ශ්‍රීල.නි.ප. ඡන්දදායකයෝ - පාක්ෂිකයෝ "අපේ හොරා අපිට හොඳා" කියලා මල්මාලා දානවා නම් ඉඹලා පිළිගන්නවා නම් ජනතාවගේ ප්‍රාර්ථනාවට විතරක් හොඳ යහපත් හොරු නැති රටක් හදන්න බැහැ. ඒ සඳහා ජනතාව සැබෑවටම දූෂිතයින් නොවන දේශපාලන ව්‍යාපාරයක් සමග අත්වැල් බැඳග නිමින් පුළුල් මහජන මධ්‍යස්ථානයක් වෙනුවෙන් පෙළ ගැසිය යුතුයි.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




රටේ හෙට වෙනුවෙන් බලවේග ශක්තිමත් කර...




දිරිය පුරවැසියන් බලමුළු ගන්වා...



ඇමරිකානු ආරක්ෂක ගිවිසුමට එරෙහිව...



යෝජිත බදු පනතට එරෙහිව...





සයිටම් විරෝධී සටනට පණ පොවා...

# දූෂණයෙන් තොර පාලනයක් ගොඩනැගීමට ජනතාව පෙළ ගැසිය යුතුයි

**ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා**

වර්තමානයේ රවී කරුණානායක ගෙවල් මිලදී ගැනීම ගැන තමන් නොදන්නා බවට රඟ දැක්වූ නාඩගමම රාජපක්ෂ සොරමුලේ යෝෂිත රාජපක්ෂත් නාමල් රාජපක්ෂත් විමල් වීරවංශත් පෙරදී සිදුකර තිබූ බව පෙන්වා දුන් ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා, මේ තත්වය තුළ මේ වන තෙක් රට පාලනය කර ඇත්තේ රටේ ජනතාවගේ රාජ්‍ය දේපොළ හොරකම් කරන සොරමුළක් බව රටේ ජනතාව විසින් තේරුම් ගත යුතුව ඇතැයි ප්‍රකාශ කළේය.

අනුර දිසානායක සහෝදරයා මෙම අදහස් පළ කළේ රවී කරුණානායක තම අමාත්‍ය ධුරයෙන් ඉල්ලා අස්වීම පිළිබඳව කරුණු දැක්වීම සඳහා පසුගිය 11වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද මාධ්‍ය හමුවේදීය. වැඩිදුරටත් කරුණු දැක්වූ අනුර දිසානායක සහෝදරයා, මෙසේ පැවසීය.

"රවී කරුණානායක ඇමති ධුරයෙන් ඉල්ලා අස්වීමත් සමග වංචා-දූෂණ සම්බන්ධයෙන් අලුත් සාකච්ඡාවක් මතුවෙලා තිබෙනවා. රවීගේ පාර්ශ්වයේ කණ්ඩායම එය යහපත් ආණ්ඩු ක්‍රමයක ලක්ෂණයක් යැයිද පරාජිත රාජපක්ෂ කණ්ඩායම එය සිය ජයග්‍රහණයක් යැයිද උත්කර්ෂයට නංවමින් තිබෙනවා.

කුමන හෝ අපරාධකරුවෙක් අපරාධයක් සිදුකරන අවස්ථාවේදී ඇඳ සිටි රෙදි ගලවා දමා වෙනත් ඇඳුමක් ඇන්ද පමණින් නිවැරදිකරුවෙක් වෙන්නේ නැහැ. රවී කරුණානායක වංචනික ක්‍රියාවකට හවුල් වෙන මොහොතේ ඔහු දැරූ මුදල් ඇමතිධුරය ඉවත් කොට විදෙස් ඇමතිධුරය ලබාදුන් පමණින් ඔහු



නිවැරදිකරුවෙක් වෙන්නේ නැහැ. විදෙස් ඇමති ඇඳුම ඇන්දවීමෙන් හෝ එම ඇඳුම උණා දැමීමෙන් ඔහුට නිවැරදිකරුවෙක් වෙන්න බැහැ. රවී කරුණානායකගේ ඉල්ලා අස්වීම ඔහු සිදුකළ වංචාවට දඬුවමක් නොවේ. එසේ චෝදනාවට ලක්වූවන්ගෙන් රවී කරුණානායක මුදල් ඇමතිවරයා ලෙස මසකට රු. ලක්ෂ 14.5 බැගින් ගෙවල් කුලිය ලබාගෙන තිබෙනවා. එය අල්ලස් ගැනීමක්.

15 පිටුවට

# බැඳුම්කර වංචාවේ සියලු වරදකරුවන්ට දඬුවම් දිය යුතුයි

**ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා**



ඇමතිවරයෙක් ඉල්ලා අස්වී බැඳුම්කර සිද්ධිය යටපත් කිරීමට ඉඩ දිය නොහැකි බව අවධාරණය කළ ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා, මේ සිදුවීමට අදාළ සැබෑ සැලසුම්කරුවන් සහ ප්‍රබලයින් හෙළිදරව් කරගත යුතු බවත් එහි සියලු වරදකරුවන්ට දඬුවම් දිය යුතුව ඇති බවත් අවධාරණය කළේය.

ඔහු මෙසේ පැවසුවේ පසුගිය 08වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවේදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ විජිත හේරත් සහෝදරයා මෙසේද පැවසීය.

"2015 ජනාධිපතිවරණයේත් මහ මැතිවරණයේත් ප්‍රධාන සටන් පාඨය බවට පත්වී තිබුණේ වංචාවට හා දූෂණයට එරෙහිව පියවර ගන්නා බවට සහ යහපාලනය ඇතිකරන බවට වූ පොරොන්දුවයි. නමුත් මේ ආණ්ඩුව ඒ ප්‍රධාන පොරොන්දුවම බලයට පත්වෙලා මාසයක් යනකොට උල්ලංඝනය කළා. ලංකා ඉතිහාසයේ මහ බැංකුවේ විශාලම බැඳුම්කර වංචාව මේ ආණ්ඩුව යටතේ සිදු කළා. නමුත් ආණ්ඩුව කිසිදු පියවරක් ගත්තේ නැතුවා විතරක් නෙමෙයි පහුගිය රාජපක්ෂ පාලනය යටතේ සිදුවූ හොරකම් සම්බන්ධයෙන් පවා පරීක්ෂණ සිදුනොකොට ඒ හොරුන් සමඟත් අත්වැල් බැඳගෙන ආණ්ඩුව පිහිටවූවා.

පසුගිය පාලන සමයේ සිදුවූ කුප්‍රකට ඇවන්ගාඩ් සිදුවීම ආරක්ෂා කිරීමට ප්‍රබල ඇමතිවරු තිදෙනෙක්ම එම වංචාව යටගහන්න කටයුතු කළා. අපි ඒ ඇමතිවරුන් පිළිබඳව ජනතාවට හෙළිදරව් කළා. ඒවායේ ප්‍රතිඵලයක් විදිහට තිලක් මාරපන අමාත්‍යවරයාට ඉල්ලා අස්වීමට සිදුවුණා. තාවකාලිකව එහෙම කරලා සිදුවීම යටපත් කරලා දැන් නැවතත් ඔහුට ඇමතිකමක් දී තිබෙනවා. ඇවන්ගාඩ් හොරුන්ට තවමත් නීතිය ක්‍රියාත්මක වෙලා නැහැ. ඔවුන් පිළිබඳ පරීක්ෂණත් නිසි ලෙස සිදුවන්නේ නැහැ. යටපත් වෙමින් තිබෙනවා. විශේෂ අධිකරණයක් පිහිටුවන්න ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කරන්න වෙනවා නම්, ඒක දුෂ්කර නම් ආණ්ඩුවට වෙනම අධිකරණයක් පිහිටුවන්න පුළුවන්. ඒකට කරන්න තියෙන්නේ දැනට තියෙන උසාවිවලින්ම එක උසාවියක් වෙන් කරලා මේ සියලු වංචා-දූෂණ සම්බන්ධ නඩු ඒකට යොමු කරන එක. එහෙම පිහිටුවලා මේ නඩු කඩිනම් කරන්න පුළුවන්. එහෙම නොවුණොත් මේ වංචා-දූෂණ කොයි තරම් එළිදරව් වුණත් නීතිය ක්‍රියාත්මක වීම ප්‍රමාද වෙනවා.

ඇත්තටම එදා රාජපක්ෂ ආණ්ඩුව සිදුකරපු හොරකම් අභිභවා යන්න මේ ආණ්ඩුව තරගයට හොරකම් කරමින් ඉන්නවාදැයි අපට හිතෙනවා. අපිට හොරකම්වල ලොකු පොඩිකම් මනින්න බැහැ. ලොකු හොරුන්ගෙයි පොඩි හොරුන්ගෙයි වෙනසක් නැහැ. මේ ඉන්න නැව් ගිලපු හොරුන්ට මේ සිදුවීම එැණු බිකක් වුණාට මේ හොරකම් කරලා තියෙන්නෙ රටේ ජනතාවගේ මුදල්. එදා සහ අද වෙන සියලු හොරකම්වලට එරෙහිව වෙනසකින් තොරව නීතිය ක්‍රියාත්මක විය යුතුයි."

# නව පළාත් පාලන පනත සාධනීය ඉදිරි පියවරක්

**ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා**



රාජපක්ෂ ආණ්ඩුවට වාසිසහගත ආකාරයකට සකස් කර තිබූ ඡන්ද ක්‍රමය, සීමා නීර්ණය ඇතුළු පළාත් පාලන මැතිවරණ යාන්ත්‍රණය සියලු පක්ෂවලට සාධාරණ නියෝජනයක් ලබාගත හැකි වන පරිදි සංශෝධනය කර ගත යුතුව තිබූ බව අවධාරණය කළ ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා, එම සංශෝධන වෙනුවෙන් ජ.වි.පෙ. විශාල කාර්යභාරයක් සිදු කළ බවත් එමගින් ජනතාවට යම් ජයග්‍රහණයක් අත්වී තිබෙන බවත් ප්‍රකාශ කළේය.

ඔහු මෙම අදහස් පළ කළේ පසුගිය 27වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවැත්වූ මාධ්‍ය සාකච්ඡාවේදීය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා එය සර්ව සම්පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදය හොඳින්ම තහවුරු වන්නා වූ පනතක් යැයි තමන් විශ්වස නොකරන නමුත් පැවති පනතට වඩා සාධනීය කරුණු නව පනතේ අන්තර්ගත වී ඇතැයි කියා සිටියේය.

"නව පනත අනුව යම් පළාත් පාලන ආයතනයක මන්ත්‍රී ධුර සංඛ්‍යාව පක්ෂයක් ලබාගන්නා ඡන්ද ප්‍රමාණයට සමානුපාතික වෙනවා. එය ඉතාම වැදගත්. ඒ වගේම විශාල ආන්දෝලනයකට ලක්වූ මනාප ක්‍රමය මුළුමනින්ම නව පනත මගින් අහෝසි කොට තිබෙනවා. මනාප ක්‍රමය පොදු ජනතාවගේ විරෝධයට ලක්වී තිබුණා. ඒ වගේම ජනතාව තුළ මතයක් තිබුණා, තමන් නියෝජනය කරන කොට්ඨාසයට වගකියන මන්ත්‍රීවරයෙකු නැහැ කියලා. නව පනත මගින් කොට්ඨාසයට නිශ්චිත මන්ත්‍රීවරයෙකු හිමිවෙනවා. ඒ වගේම පැවති ඡන්ද ක්‍රමයට අනුව තරග වැදීම, නොවැදීම නොසලකා ලැයිස්තුවේ ඉන්න සෑම මන්ත්‍රීවරයෙකුටම රුපියල් 5,000/-ක ඇප මුදලක් තැන්පත් කළ යුතුව තිබුණා. පැවැති පනතට අනුව මන්ත්‍රීවරුන් 5,000ක් පමණ තේරී පත්විය යුතුව තිබුණු අතර එක පක්ෂයක් රු ලක්ෂ 250කට ආසන්න ඇප මුදලක් තැන්පත් කළ යුතුව තිබුණා. නමුත් නව පනත අනුව එම මුදල සාධාරණ ලෙස අඩු කොට තිබෙනවා. ඒ වගේම කොට්ඨාසයකට තරග කරන මන්ත්‍රීවරුන් පමණයි මෙම ඇප මුදල තැන්පත් කළ යුතු වන්නේ. සම්පූර්ණ ලැයිස්තුවේ 30% කට ආසන්න කාන්තා නියෝජනයකට අවස්ථාව තිබෙනවා. එසේම කාන්තාවන්ට සභාවට පත්වන මන්ත්‍රී සංඛ්‍යාවෙන් 25% කට ආසන්න හෝ 25% ඉක්මවා යන මන්ත්‍රී සංඛ්‍යාවක් සභාව නියෝජනය කිරීමට අවස්ථාව මෙම පනතින් උදාකර දී තිබෙනවා." ඔහු තවදුරටත් කීය.




බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.